අරගලයේ ස්ත්‍රීහු

1980-86
කෙටි සටහනක්

සුනිලා අබේසේකර



wr.,fhai,ayq

1980-86

කෙටි සටහනක්

සුනිලා අබේසේකර

Women and Media Collective
Established 1984

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය

56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකා

wr.,fhaiaŞq

© කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය | සුනිලා අබේසේකර

ISBN 978-955-1770-26-6
ප්‍රථම මුද්‍රණය 1988
දෙවන මුද්‍රණය 2015

මෙම ග්‍රන්ථයෙහි පළ කර ඇති අරගලවල ඡායාරූප සියල්ල කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසින් 2005 වසරේ දී සංවිධානය කරනු ලැබූ 'ඇගේ පිය සටහන්' (Her Foot Steps) ප්‍රදර්ශනය සඳහා භාවිතා කළ ඒවා ය. මෙහි එන ඇතැම් ඡායාරූපවලට ශිල්පීන්ගේ නම් වෙන් වෙන්ව සඳහන් කිරීමට තරම් තොරතුරු අප සතුව නැති වුවද තොරතුරු ඇති ඡායාරූපවල පමණක් අදාළ ශිල්පීන්ගේ නම් සඳහන් කර ඇත. කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ ඇතැම් ඡායාරූපවලට අමතරව තවත් බොහෝ ඡායාරූප ලබාදුන් සහෝදරියන්, සහෝදරයින් සහ ලංකාව පුරා ස්ත්‍රී සංවිධානවලට අපගේ ස්තුතිය පළ කරමු.

කර්තෘ	සුනිලා අබේසේකර
ප්‍රථම මුද්‍රණයේ සංස්කරණය	ඊවා රණවීර
දෙවන මුද්‍රණයේ සංස්කරණය	සුමිකා පෙරේරා
කවරයේ ඡයාරූපයක්	වින්සන්ට් කුරුඹාපිටිය
පිටකවරය සහ පිටු සැකැස්ම	වේලායුදන් ජයචිත්‍රා
පරිගණක අක්ෂර ඇමිණුම	තුෂාරි මඩහපොළ
මුද්‍රණය	ග්ලෝබ් ප්‍රින්ටිං වර්ක්ස්
ප්‍රකාශනය	කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය

Women and Media Collective
Established 1984

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකා.
Email: wmcsrilanka@gmail.com
Web: http://www.womenandmedia.org
Facebook: http://www.facebook.com/womenandmediacollective
Twitter: http://twitter.com/womenandmedia

පටුන

පිටු
අංකය

හැඳින්වීම (1988 පළමු මුද්‍රණයට ලියන ලද)..... 9

මොනරාගල ගොවිජන අරගලය.....15

ජලබදු විරෝධී ගොවි අරගලය 25

පොලිටෙක්ස් වැඩවර්ජනය.....31

වතු ක්ෂේත්‍රය : 46

1984 තේ වතුවල වැටුප් අරගලය..... 46

දෙල්හේන - රෑද්දගොඩ වතු අරගලය 51

හෙදි අරගලය.....53

පසුවදන 63

පෙරවදන

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය 'අරගලයේ ස්ත්‍රීහු' පොත පළ කරන්නේ 2013 සැප්තැම්බර් 09 දා මෙලොව හැර ගිය සුනිලා අබේසේකර සහෝදරිය සිහි කරනු පිණිස ය. එය කොළඹ කාන්තා අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් 1988 දී පළමු වරට පළ කරනු ලැබිණි. ලංකාවේ ස්ත්‍රීන්ගේ දේශපාලන-සමාජ ක්‍රියාකාරිත්වය පිළිබඳව අවධාරණය කරන මෙම කෘතියේ විශේෂ වැදගත්කමක් තිබේ. එය නම්, මෙම කාල වකවානුවේදී ස්ත්‍රීන් සිදු කළ විවිධ ආර්ථික සහ දේශපාලන මැදිහත්වීම්, ඔවුන්ගේ ජීවිතවලට ඇති කළ බලපෑම පිළිබඳව සහභාගිත්ව නිරීක්ෂණාත්මක විස්තරයක් ඒ මගින් සපයනු ලැබීමයි.

සුනිලා මේ පොතෙහි අඩංගු රචනා ලියන ලද්දේ නිශ්චිත පසුබිමක් තුළ ය. එවකට බලයේ සිටි ආණ්ඩුව ක්‍රියාත්මක කළ විවෘත ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙසට මතු වූ සමාජ-ආර්ථික වෙනස්කම්වල ඵලවිපාකයක් ලෙස ලංකාව සීඝ්‍ර පරිවර්තනයකට පත්වෙමින් සිටීම එහි විශේෂ ලක්ෂණය විය. 1977 බලයට පත්වූ ආණ්ඩුව තමන්ගේ මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා කරනු ලැබුවේ කම්කරු ශ්‍රම ක්ෂේත්‍රය කළමනාකරණය කිරීම සඳහා ආණ්ඩුවේ කාර්යය ශක්තිමත් කිරීමට ඍජුව මැදිහත් වීම, මහා පරිමාණ ව්‍යාපාරවලට ස්වාභාවික සම්පත් පාවිච්චි කිරීම සහ ඒවා සීමා කරමින් තිබූ රෙගුලාසි ලිහිල් කිරීම, ආර්ථික සංවර්ධනය සඳහා විදේශ ආයෝජන ගලා ඒමට තිබූ විධි විධාන ලිහිල් කිරීම යන කාරණා යි. 1980 දශකය, රාජ්‍ය විසින් ලංකාවේ කම්කරු පංතිය දැඩි ලෙස පාලනය කරනු ලැබූ කාල පරිච්ඡේදයක් විය. වැඩවර්ජනවල යෙදුණු රාජ්‍ය අංශයේ කම්කරුවන් දහස් ගණනක් සේවයෙන් දොට්ට දැමීම නිදහස් වෙළඳ කලාප හඳුන්වාදීම, ස්ත්‍රී ශ්‍රමිකයන් විශාල ලෙස සේවයේ යොදාගන්නා ඇඟලුම් කම්හල් පැතිරීම, විදේශ ශ්‍රම වෙළඳ පොළෙහි රැකියා ලබා ගැනීමට මාර්ග විවෘත කිරීම, මහා පරිමාණ වාණිජ කෘෂිකාර්මික ව්‍යාපාර හඳුන්වාදීම යන වර්ධනයන් සිදුවූයේ මෙම කාලයේදී ය. දශක තුනක් පුරා පැවැතුණු ජනවාර්ගික යුද්ධය ආරම්භ වූයේ ද මෙම වකවානුවේදී ය.

මේ කෘතියෙන් සිදුවන ප්‍රධානතම කාර්යය නම්, එක්සත් ජාතීන්ගේ ස්ත්‍රී දශකය (1975-85) වෙතින් සහාය ලැබුණු ලෝක ස්ත්‍රීවාදී ව්‍යාපාරය සහ ශ්‍රී ලංකාවේ දේශපාලන සහ ආර්ථික සංවර්ධනයට ස්ත්‍රීන් සහ ස්ත්‍රී සංවිධාන විසින් ඉටු කරනු ලැබූ තීරණාත්මක කාර්යභාරය යන තේමාවන් දෙක එකිනෙකට මුණ ගැස්වීමයි.

සුනිලා තම සාකච්ඡාව ගොඩනඟන්නේ ගොවියන්ට සහ කම්කරුවන්ට ආරණ්ඩුවේ ප්‍රතිපත්ති හේතුවෙන් ඇතිවූ ඵලවිපාක පිළිබඳ සමාජවාදී ස්ත්‍රීවාදී විචාරිකාවක ලෙසිනි. තමන්ගේ ආයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම සඳහා නිවෙස්වලින් සහ වැඩකරන ස්ථානවලින් එළියට බැස සටන් කිරීමට, පුරවැසියන්, ගොවීන් සහ කම්කරුවන් වශයෙන් පෙළගැසුණු අන්දම සුනිලා විස්තරාත්මකව දක්වන්නීය. පෙරදී ස්වයං-රැකියාවල යෙදී සිටි, ස්ත්‍රී සහ පුරුෂ කම්කරුවන් නිර්ධන පංතිකරණයට පාත්‍රවීම වාර්තා කරන සුනිලා, සුළු ගොවියන්ට හිමිව තිබුණු ඉඩම් මහා පරිමාණ වාණිජ වගාවක් ලෙසින් උක් වගා කරන පුද්ගලික ව්‍යාපාරවලට ලබාගැනීමට ඉඩ දීමේ සහ කෘෂිකර්මයෙහි/ගෙ ාවිතැනෙහි නියැලුණු ගොවි පවුල්වලින් ජලබඳු අය කිරීම් වැනි ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ නියෝග පිළිබඳව විශේෂයෙන් අවධාරණයට ලක් කරන්නීය. මෙම ප්‍රතිපත්තිවලට එරෙහිව විරෝධතා ව්‍යාපාරවලට සම්බන්ධ වෙමින් සහ ඒ මගින් තම අරගලය මහජන අවධානයට ගෙන ඒමට ගොවි ස්ත්‍රීන් ඉටු කළ කාර්යභාරය ද මෙම පොතේ මැනැවින් වාර්තා කෙරේ.

පොලිටෙක්ස් ඇඟලුම් කම්හලේ කම්කරු ස්ත්‍රීන් ගෙන ගිය අරගලය පිළිබඳව සුනිලා කරන විස්තරය තියුණු සංවේදීභාවයකිනුත්, ගැඹුරු විග්‍රහාත්මක හැකියාවකිනුත් යුත් ස්ත්‍රීවාදී ක්‍රියාකාරිනියක් ලෙසට ඇයගේ සුවිශේෂත්වය මොනවට පෙන්නුම් කරයි. ඇය කරන්නේ, මෙම කම්කරු ස්ත්‍රීන් ආරම්භ කළ වැඩ වර්ජනයත් එය ඉදිරියට ගෙන යාමේදී, ඔවුන්ට මුහුණ දීමට සිදුවූ අනේකවිධ බාධක පිළිබඳවත් විස්තර කිරීම පමණක් නොවේ. මෙම කම්කරු ස්ත්‍රීන් ගේ වෘත්තීය සමිතියත් ඒවන විට පැවැති, සාපේක්ෂ වශයෙන් විශාල සහ ප්‍රතිෂ්ඨාපිත වෘත්තීය සමිතිත් අතර පැවැති ගැටළුකාරී සම්බන්ධතා මෙන්ම, ඒවා අතර පැවති අන්‍යෝන්‍ය සම්බන්ධතා පිළිබඳව ද ඇය අපගේ අවධානය යොමු කරන්නීය. පොලිටෙක්ස් කම්හල පැවැති ප්‍රදේශයේ ජීවත් වූ ප්‍රජාව සහ ගම්බද ස්ත්‍රී සංවිධාන මෙම කම්කරු ස්ත්‍රීන්ට දැක්වූ සහයෝගය පිළිබඳව කදිම විස්තරයක් ද ඉදිරිපත් කරයි.

වඩා හොඳ සේවා තත්ත්වයන් වෙනුවෙන් හෙදියන්ගේ සංගමයත් වතු වැවිලි අංශයේ කම්කරු ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙනුත් කෙටි කාලීන විදේශ ශ්‍රමයිකයින් වීමට ස්ත්‍රීන්ට බලකළ සාධක සම්බන්ධයෙනුත් සුනිලා ඉදිරිපත් කරන විග්‍රහය, ස්ත්‍රීන් - ස්ත්‍රීන් ලෙස තම පවුලටත් ජාතික ආර්ථිකයටත් කරන දායකත්වය තේරුම් ගැනීමට පාඨකයාට උදව් වෙයි.

මෙම ස්ත්‍රීන් ගෙන ගිය ආර්ථික සහ දේශපාලන අරගලයේ පන්ති ගතිකත්වයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් සුනිලා සතුව තිබූ බව ද මෙම පොත තුළින් මැනැවින් ප්‍රකාශ වේ. ස්ත්‍රීන් අරගලයේ යෙදී සිටි සෑම අංශයක් දෙසම අවධානය යොමු කරන විට සුනිලා පැහැදිලිවම දකින දෙයක් නම්, එම කම්කරු ස්ත්‍රීන් දෙවැනි පෙළේ ආදායම් උපයන්නන්ගේ තත්ත්වයක සිට දේශපාලන ක්‍රියාකාරිනියන් බවට පරිවර්තනය වීමේ ගමන් මඟයි. නාගරික කම්හල් පරිසරයක් වෙත පැමිණ පසුව තමන්ගේ ජීවිතය සම්බන්ධව තීරණ ගැනීමට හැකියාව ලබා ගැනීමේ තත්ත්වයට ග්‍රාමීය තරුණ ස්ත්‍රීන් පත්වන පරිවර්තනයේ වැදගත්කම මෙන්ම ඉල්ලීම් ඉදිරිපත් කරමින් දේශපාලන ක්‍රියාකාරිනියන් බවට හෙදියන් පරිවර්තනය වීමේ වැදගත්කමත් පිළිගත් මුල්ම අවස්ථාවක් වන්නේ මෙම කෘතියයි. ස්ත්‍රීන් මුහුණ දෙන අභියෝග අතර එකක් වන්නේ, වෘත්තීය සමිති ක්ෂේත්‍රයේදී පවා, යටහත් තත්ත්වයකට ඔවුන් තල්ලු කරන පීතෘ මූලික වටිනාකම් පද්ධතීන්ට සහ චර්යාවන්ට එරෙහිව අරගල කිරීම බව ද සුනිලා සටහන් කරන්නීය. දේශපාලන සහ ආර්ථික සාධක අතර ඇති අවියෝජනීය සම්බන්ධය, කම්කරු අයිතිවාසිකම් සහතික කර ආරක්ෂා කර ගැනීම සඳහා සංවිධානාත්මක කම්කරු පන්තියේ සමගියේ ඇති වැදගත්කම සහ මෙම සම්බන්ධතාවය දුර්වල වූ කම්කරු ස්ත්‍රීන් පත්වන අනතුර යන මේවා මෙම විග්‍රහයෙන් බැරෑරුම් ලෙස මතුවේ.

මෙම පොතේ විෂයපථයට ඇතුළත් වන්නේ කුඩා පරිමාණ කෘෂිකර්මයේ, කාර්මික සහ සේවා අංශවල වැඩකරන ස්ත්‍රීන්ගේ ආර්ථික අරගල සහ දේශපාලන ගමන් මඟ ඔවුන්ගේ අරගලවලදී ස්ත්‍රී සංවිධාන ඉටු කළ කාර්යභාරය, ශ්‍රමය, ප්‍රාග්ධනය, සමාජ පන්ති, නවීකරණය සහ පීතෘ මූලිකත්වය යන මේවා අතර ඇති නිරන්තර ගැටුම් තේමාවන් ය. ඒවා වනාහී තම ජීවිතයේ ගමන් මඟ ලෙස සුනිලා තෝරාගත් දිශානතිය ද වෙයි. අප ද නිරතුරුව පාඩම් ඉගෙන ගන්නා මූලාශ්‍රය ද එයයි.

සේපාලි කෝට්ටෙගොඩ
2015 සැප්තැම්බර් 09

හැඳින්වීම

1980 ජූලි වැඩ වර්ජනය ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ පමණක් නොව, සමස්ත කම්කරු ව්‍යාපාරයේ ම සන්ධිස්ථානයක් සලකුණු කළේය. එදා 40,000 කට කිට්ටු ශ්‍රමිකයින් පිරිසක් සේවය අතහැර ගියා සේ සලකන බවට රජය ප්‍රකාශ කළේය. එදින අහෝසි වූ රැකියාවන් යළි නොලැබ අද දක්වා ම දුක්විඳින පවුල් ගණනාවකි.

1980 ජූලි 7 වන දා රත්මලාන දුම්රිය වැඩබිමෙන් ආරම්භ වූ මහා වැඩවර්ජනය, සතියක් ඇතුළත රාජ්‍ය අංශය පුරාම පැතිර යමින්, ඇතැම් තක්සේරුවලට අනුව 1,40,000 කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් ඉදිරියට ගමන් කළේය. එහෙත් වෘත්තීය සමිති පෙරමුණු අතර ඇති වූ අසමගිය සහ එකල පැවති සමාජ-දේශපාලන වාතාවරණය හේතුකොට ගෙන, ජූලි මස අවසාන සතිය වන විට රජයට වර්ජකයින්ගේ බලය බිඳින්නට හැකි විය. එතැන් පටන් අඩ සියවසක පමණ දීර්ඝ සහ සටන්කාමී ඉතිහාසයක් ඇති වෘත්තීය සමිති පවා පෙන්වූයේ ව්‍යාකූලත්වයට පත් ස්වභාවයකි. වර්ජනයකට නොව, ඊට බොහෝ සේ අඩුබරකින් යුත් 'අකුරට වැඩකිරීම' වැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට පවා අද බොහෝ වෘත්තීය සමිතිවලට සිය සාමාජිකයින් මෙහෙයවීමට නොහැකි වී ඇත. මෙයට සාපේක්ෂව, රාජ්‍ය පාර්ශ්වයෙහි දේශපාලන උපාය-උපක්‍රමයෙහි එක් අංගයක් සේ බිහි වූ වෘත්තීය සමිතියේ සීඝ්‍ර වර්ධනය සහ එය රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලබමින් ප්‍රදර්ශනය කරන්නා වූ බලගතුකම ද සැලකිල්ලට ගත යුතුය.

මේ තත්ත්වයන් යටතේ, පසුගිය වසර හය තුළ මෙරට කම්කරු පංති බලවේගයන් එක්රැස් වූ පෙරමුණු දෙස බලන විට, එක්තරා සුවිශේෂ ස්වරූපයක් එහි ඇති බව අපට පෙනීයයි. ලංකා කම්කරු සංගමය හැර මේ යුගයේ සාර්ථක කම්කරු සටන් මෙහෙයවා ඇත්තේ දීප්තිමත් අතීතයකට හිමිකම් කියන ප්‍රබල වෘත්තීය සමිති නොවන බව නම් පැහැදිලි ය. ඒ වෙනුවට, බොහෝ විට ක්‍රියාශීලීවී ඇත්තේ එක් විශේෂ ක්ෂේත්‍රයක් නියෝජනය කරන, ඍජු ලෙස දේශපාලන පක්ෂයකට හෝ වෘත්තීය සමිති මධ්‍යස්ථානයකට හෝ අනුබද්ධ නොවන, ඒ නිසා යම් දුරකට 'ස්වායත්ත' යයි කිව හැකි සංවිධාන වේ.

උදාහරණයක් ලෙස හෙද සටන මෙහෙය වූ රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය නිල වශයෙන් රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනයට අනුබද්ධිත වුවද, වෘත්තීමය ප්‍රශ්නවලදී බොහෝ විට තම ස්වායත්තභාවය පෙන්නුම්කොට ඇති බව පෙනී යයි. එසේම, පොලිටෙක්ස් අරගලයට නායකත්වය දුන් කාර්මික, ප්‍රවාහන හා පොදු කම්කරු සංගමය ද මුල් අවධියේ විප්ලවීය මාක්ස්වාදී පක්ෂය සමග සම්බන්ධකමක් පැවැත්වුව ද පසු කාලයක එම පක්ෂයෙන් බිඳීමට ද එක් හේතුවක් වූයේ වෘත්තීය අයිතීන් පතා කළ අරගලයන් හි පැනනැගුනු ගැටළු යැයි කීමට යම් පදනමක් ඇත. තවද, දීර්ඝ නිහැඬියාවකට පසු ගොවි ජනතා කොටස් තුළ ද පසුගිය වකවානුව තුළ විශේෂ සටන්කාමීත්වයක් දැකගත හැකිවී තිබේ. මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම්, බහුජාතික සිනී සමාග ම්වලට පවරාදීමට එරෙහිව මෙන්ම රට පුරා ගොවීන්ගෙන් ජලබදු අය කිරීමට එරෙහිව ද සමස්ත ලංකා ගොවි සම්මේලනය ප්‍රමුඛ ගොවීන් නියෝජනය කරන්නා වූ නොයෙක් සංවිධාන සටන් මඟට බැස තිබේ. එසේම වෙනත් බහුජන සංවිධාන ද සමග එකතු වී 'සහයෝගිතා' කමිටු මට්ටමින් තම සටන සඳහා පුළුල් ජනතා සහයෝගයක් ලබා ගැනීමට ද මේ ව්‍යාපාර හැම එකක්ම උත්සාහ දැරීම තවත් වැදගත් ඉදිරි පියවරක් ලෙස දැක්විය හැක.

සමාජවාදී පරිවර්තන ක්‍රියාවලියෙහි ලා ගාමක බලවේගය වන සංවිධිත කම්කරු පංතිය ඉහත කී අයුරින් තාවකාලිකව හෝ පසුබැසීමකට ගොදුරු වූ කාලයක දී ශිෂ්‍ය, ගොවි, ස්ත්‍රී, ජනවාර්ගික යනාදී වෙනත් ක්ෂේත්‍රවල ස්වාධීන සටන් පෙරමුණු බිහිවීම ඇත්ත වශයෙන් ම අද ලංකාව පසුකරන ඓතිහාසික අවධියේ සුවිශේෂ ස්වභාවයේ එක් ප්‍රකාශනයකි. මේ සන්දර්භය තුළ ඉකුත් වසර හය පුරා සංවිධිත කම්කරු පංතියේ ක්‍රියාකාරිත්වය දෙස ආපසු හැරී බලන විට එහි පැහැදිලිව කැපී පෙනෙන එක් ලක්ෂණයක් පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමුකිරීම මේ ලිපියේ අරමුණයි. එය නම්, එම සටන් පෙරමුණු තුළ ස්ත්‍රී සහභාගිත්වයයි.

වාමාංශික ව්‍යාපාරයට සහ වෘත්තීය සමිති ව්‍යාපාරයට තරම් ම ඈත ඉතිහාසයක් තිබෙන, ඒ දැවැන්ත ව්‍යාපාර තුළ ඒවායේ ම අංශයක් බවට පත් වූ ස්ත්‍රී සංවිධාන අතලොස්සක්, ධනේශ්වර සහ සුළු ධනේශ්වර ස්ත්‍රීන් විසින් සුභ සාධක වැඩ සඳහා යොදාගත් සංවිධාන කීපයක් 1970ටත් පෙර ලංකාවේ තිබුණි. එහෙත්, 1975 ජාත්‍යන්තර ස්ත්‍රී වර්ෂය ලෙසත් පසුව 1975-1985 ස්ත්‍රී දශකය ලෙසත් නම් කිරීමෙන් පසුව රාජ්‍ය මට්ටමින් ද ස්ත්‍රී ප්‍රශ්නය පිළිබඳව අලුත් උනන්දුවක් ඇති විය. එසේ ම රාජ්‍ය නොවන සංවිධාන තුළ ද නව ජීවයක් ඇති විය. 1960 ගණන්වල සිට බටහිර යුරෝපයේත් උතුරු ඇමරිකාවේත් පැනනැගුනු ස්ත්‍රීවාදී රැල්ලේ අභාෂයන් ද සුළු පටු නොවීය.

එසේම වියට්නාම් අරගලයේදී ස්ත්‍රීන් ඉටු කරමින් සිටි ප්‍රබල කාර්යභාරය ද සම්ප්‍රදායික ආසියානු ස්ත්‍රියකගේ පිළිගත් ප්‍රතිරූපයට විශාල අභියෝග යක් එල්ල කළේය. මේ හැම සාධකයක් ම පසුබිම් කොටගෙන, එහෙත් අවධාරණය කළ යුතු පරිදි සමකාලීන ලාංකික සමාජය තුළින් ම පැනනැගුනු අවශ්‍යතාවයන්ට අනුරූපීව, 1979, 1989 වන විට ලංකාවේ ස්වායත්ත ස්ත්‍රී සංවිධාන කීපයක් සුළුවෙන් හෝ හිස එසවීය. මෙයින් පළමුවරට ප්‍රගතිශීලී ස්ත්‍රී සංවිධානයක් වශයෙන් 'කාන්තා හඬ' ආරම්භ කරන ලදී. අරගලයේ යෙදෙන ස්ත්‍රීන්ට සේවයක් ඉටු කිරීම සඳහා 1979 දී පිහිටුවන ලද කාන්තා හඬ අන්තර්ජාතික ස්ත්‍රී වර්ෂයේ ආශ්වාදයෙන් පැනනැගි සංවිධානයක් ලෙස හැඳින්විය හැක. එම නමින් ම සිංහල සහ ඉංග්‍රීසි සඟරාවක් පවත්වාගෙන යන මේ සංවිධානය **පෙන්නින් කුරල්** නමින් ද්‍රවිඩ සඟරාවක් ද නිකුත් කරන්නී ය. මෙය ස්වාධීන සංවිධානයක් ලෙස හැඳින්විය හැක. එමගින් ස්ත්‍රීන් සඳහා නොමිලේ සෞඛ්‍ය සේවයක් සහ නීති උපදේශන සේවයක් ද ඉංග්‍රීසි පංතියක් ද පැවැත්වේ. එහි ව්‍යාපෘතීන් අතර පැල්පත් දරුවන් දැනුවත් කිරීම ප්‍රධාන තැනක් ගනී.

1982 දී මුල්වරට එම සංවිධාන බහුතරයක් ස්ත්‍රී කම්කරුවන් සේවය කළ ජා-ඇල පොලිටෙක්ස් ආයතනයේ හටගත් වැඩ වර්ජනයකට සහයෝගය දීම සඳහා එකමුතු විය. මෙසේ ගොඩනඟා ගත් දැනහැඳුනුම්කම් වර්ධනය වී, 1983 දී මාර්තු 08 ජාත්‍යන්තර ස්ත්‍රී දිනය සැමරීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා ගැනුණි. එම දිනයේ දී සියලුම ක්ෂේත්‍රවලට අදාල වූ සටන්පාඨ හඬනංවමින් රැස්වීමක් පැවැත්වුනු අතර එවකට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගෙන සිටි එකම ස්ත්‍රිය වූ නිර්මලා නිත්‍යානන්දන් නිදහස් කරන ලෙස ඔවුහු විශේෂයෙන් ම උද්ඝෝෂණය කළහ. මෙය විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැක්කේ, වාමාංශික පක්ෂ හෝ වෘත්තීය සමිති මේ වන විට උතුරේ උග්‍ර වෙමින් පැවතුනු අරගලය පිළිබඳව සහ ලංකාවාසී දෙමළ ජනතාවගේ අයිතීන් පිළිබඳව ප්‍රසිද්ධියේ යමක් කීමට හෝ කිරීමට ඉදිරිපත් වූ අවස්ථා විරල වූ නිසා ය. (ජනාධිපති මැතිවරණයේ වාසුදේව නානායක්කාර සහෝදරයාගේ ප්‍රමුඛත්වයෙන් නව සම සමාජ පක්ෂය ගෙනගිය ව්‍යාපාරය හෝ ඉල්ලීම් 11 ව්‍යාපාරය වැනි වෘත්තීය සමිති එකමුතුව ඉටු කළ වැඩකොටස මෙහිදී අමතක කළ යුතු නැති වුවත්, අප ප්‍රශ්නය දෙස බලන්නේ සමස්තයක් වශයෙනි.)

1983 ස්ත්‍රී දිනයෙහිදී ම ඇමරිකානු තානාපති කාර්යාලය වෙත න්‍යෂ්ටික අවිහරණය සඳහා වූ අභියාචනයක් ඇතුලත් පෙත්සමක් භාරදීමට ගිය කොමියුනිස්ට් සහ සමසමාජ පක්ෂ සාමාජිකාවන් පොලීසිය විසින් පලවා හරින ලදී. සුළු මොහොතකට කොල්ලුපිටිය පොලීසිය විසින් අත් අඩංගුවට

ගනු ලැබූ අය අතර දෙහිවල-ගල්කිස්ස මන්ත්‍රීනී විවියන් ගුණවර්ධන ද විය. ඇගේ වයස පවා නොතකා ඉතා අමානුෂික පහරදීමකට ඇය ගොදුරු විය. (මේ සම්බන්ධයෙන් අදාල පොලිස් නිලධාරියාට එරෙහිව පැවරූ නඩුවෙන් ඇය ජය ලැබූවද විනිශ්චයේ තීන්දුව නොතකා එම නිලධාරියාට උසස්වීමක් ද ලැබුණි.)

1984 දී ස්ත්‍රී දිනය නිමිත්තෙන් පෙළපාලි දැක්වීමට උත්සාහ කළ කාන්තා ක්‍රියාකාරී කමිටු සාමාජිකාවන්ට පොලිස් තර්ජනවලට මුහුණ දීමට සිදුවිය. ඔවුන් විහාර මහාදේවි උද්‍යානයේ සිට සටන්පාඨ ලියැවුණු සටන් පුවරු ප්‍රදර්ශනය කරමින් නිහඬව නව නගර ශාලාව වෙත ගමන් කිරීමට උත්සාහ ගනිද්දී, පොලිස් නිලධාරීහු එම පුවරු ඉරා දමා ඔවුන් පලවා හැරියහ. එම වසරේ ම ස්ත්‍රී දිනයේ ලිප්ටන් වටරවුම අවට පිකටින් ව්‍යාපාරයක යෙදී සිටි වාමාංශික පක්ෂවල සාමාජිකාවන්ට ද පොලිස් බැටන් ප්‍රහාරයකට මුහුණ දීමට සිදුවිය. රට පුරා මර්දනය උත්සන්න වූ නමුත් ස්ත්‍රීන්ගේ සටන්කාමීත්වයේ පහළ බැසීමක් නොවීය. 1985 දී ස්වායත්ත ස්ත්‍රී සංවිධාන කීපයක එකමුතුවක්, 'මර්දනයෙන් තොර, යුක්ති සහගත සහ සාධාරණ වූ සාමයක් කරා' යන තේමාව යටතේ ස්ත්‍රී දිනය සැමරීමට පෙළපාලි සංවිධානය කළේය. කොම්පඤ්ඤවීදියේ සහ මැල්පිටියේ සිට නවනගර ශාලාව දක්වා වූ මේ පෙළපාලියේ විශේෂ ලක්ෂණයක් වූයේ විශ්ව විද්‍යාල ශිෂ්‍යාවන් ඇතුළු විශාල පිරිසකගේ සහභාගිත්වයයි. එම පෙළපාලියට සම්බන්ධ වූ ස්ත්‍රීන්ට පොලිස් බැටන් පොලු සහ කඳුළු ගෑස් ප්‍රහාරයන්ට ලක්වීමට සිදුවූවා පමණක් නොව අත්අඩංගුවට ගනු ලැබූ සහෝදරියන් හතර දෙනෙකුට එදින රාත්‍රී 9 වන තුරු කුරුඳුවත්ත පොලිස් රැඳවුම් භාරයේ සිටීමට ද සිදුවිය. එදිනම පිකට් ව්‍යාපාරයක යෙදුණු වාමාංශික පක්ෂවල සහෝදරියන්ට ද නැවත වරක් පොලිස් තර්ජන එල්ල විය.

1986 ස්ත්‍රී දිනය වන විට, රට තුළ නොසන්සුන්තාවයක් පැවැති අතර පවතින රජයට විරුද්ධ වන සියලු බලවේගයන්ට එදිරිව එල්ල වූ මර්දන හස්තය කවදාටත් වඩා දරුණු විය 'සූරාකෑමට, පීඩනයට, මර්දනයට හා අනාරක්ෂිතභාවයට එරෙහිව කාන්තාවනි එක්වන්න' යන තේමාව යටතේ කාන්තා ක්‍රියාකාරී කමිටුව 1986 ස්ත්‍රී දිනය සඳහා මුද්‍රණය කළ පෝස්ටරය ප්‍රසිද්ධියේ ඇලවීමට නම් සූරාකෑමට, පීඩනයට, මර්දනයට, යන වගන්ති ඉවත් කළ යුතු යයි පොලීසිය නියෝග කර සිටියේය. විවිධ හේතූන් රැසක් නිසා මෙවර ස්ත්‍රී දින පෙළපාලියක් නොපැවැත්වුණි. එහෙත් ස්ත්‍රී දිනය නිමිත්තෙන් වාමාංශික පක්ෂවලට අනුබද්ධ ස්ත්‍රී සංවිධාන විසින් කොළඹ මහජන පුස්තකාල ශාලාවේදී ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයක් සංවිධාන කරන

ලදී. පැසිපික් හා ආසියා ස්ත්‍රී සංගමය ස්ත්‍රී කලා උළෙලක් මෙහෙයවීය. විශ්ව විද්‍යාල සිසුවියෝ ගීත ප්‍රසංගයක් සංවිධානය කළෝය. නෝර්වේ ජාතික හෙන්රික් ඉබ්සන්ගේ **'නෝරාගේ ගෙදර'** නාට්‍ය, විශේෂයෙන් මේ නිමිත්තෙන් නිෂ්පාදනය විය. ගාල්ලේ සහ මහනුවර ද ස්ත්‍රී දින රැස්වීම් පැවැත්වුණි. මෙම වැඩසටහන් රාශියෙන් ම ඔප්පු වූයේ ස්ත්‍රී දිනය සැමරීම මෙරට ප්‍රගතිශීලී ජනතාව අතර ආරම්භ වෙමින් තිබෙනා බවයි.

මේ අයුරින්, පසුගිය වකවානුව තුළ ස්ත්‍රී සංවිධාන ප්‍රදර්ශනය කර ඇති සටන්කාමීත්වය සහ ඔවුන් විසින් ස්ත්‍රීන්ට සුවිශේෂ වූ ප්‍රශ්න සමාජ ප්‍රගමනයේ ගැටළු සමඟ බද්ධ කර ගනිමින් ඉදිරියට ගමන් කළ ආකාරය, වර්තමාන සමාජ-දේශපාලන බලවේගයන් පිළිබඳව කරන්නා වූ ඕනෑම විග්‍රහයක අනිවාර්ය කොටසක් විය යුතුය.

ලංකාව, අද වෙන කවරදාකටත් වඩා අර්බුදකාරී කාල පරිච්ඡේදයකට මුහුණ දී සිටී. එක් පැත්තකින් සම්භාව්‍ය නොවන මාවත් ඔස්සේ හෝ වර්ධනය වෙමින් පවතින ධනවාදයයි; මෙම නිශ්ඵල ආර්ථික ක්‍රමයෙහි දත්තයන්ට අනුව නම් ලංකාවේ වර්ධන චක්‍රය ඉහල යයි; අප දිනපතා අත්විඳින්නා වූ දිළිඳුකරණය, රාජ්‍ය සංඛ්‍යා ලේඛනවල පිළිබිඹු වන්නේ නැත. එහෙත් ආහාර මුද්දර කප්පාදුව පිළිබඳව දිවයින පුරා නැඟුනු විරෝධතාවයේ හඬ, දිනෙන් දින ඉහල යන පාසැල් හැර යන්නවුන්ගේ සංඛ්‍යාව, වැඩිවෙන අකුරු නූගත් බව සහ අපරාධ ප්‍රමාණය ආදී සාධකයන් පමණක් වුව සැලකිල්ලට ගත් කළ අප ඇද වැටෙමින් සිටින්නා වූ ප්‍රපාතය පිළිබඳව යම් ඉඟියක් ලබාගත හැක.

විශේෂයෙන් ම අපගේ අවධානය යොමු විය යුත්තේ පසුගිය දශකය තුළ, වඩාත් ම නිවැරදිව කියන්නේ නම් 1970 සිට මේ රටේ පොදු ප්‍රජාතන්ත්‍රීය අයිතීන් උල්ලංඝණය වීම සහ දැඩි මර්දන නීති යොදා ජනතාවගේ සාමාන්‍ය මිනිස් හා සිවිල් අයිතීන් උදුරා ගැනීම පිළිබඳව ය. මේ තත්ත්වයන් හමුවේ සමාජයේ සිදුවන අකටයුතු සහ අසාධාරණයන් හෙලාදැකීමට සහ ඒවාට එරෙහිව ක්‍රියා කිරීමට ජනතා බලවේග බොහෝ විට පසුබටව සිටී. එසේම, අද අප රටේ සිදුවෙමින් පවතින සිවිල් යුද්ධය විසින් ජනවාර්ගික සාධකය අපේ ජීවිතයේ ප්‍රමුඛස්ථානයකට පත්කොට තිබේ. යුදකරණය නිසා පොදුවේ රට පුරා ජන ජීවිතය දෙදරා යන අතර ඒ හේතුවෙන් ස්ත්‍රීහු විශේෂයෙන් පීඩා විඳිති. ජාතිවාදය නම් සතුරා සෑම පසෙකින්ම ය. එය පරාජය කිරීමේ අභියෝගය ද අප හමුවෙහි ය.

තත්කාලීන ලාංකීය සමාජ-ආර්ථික, දේශපාලනික-සංස්කෘතික ක්‍රියාදාමයන් නියමාකාරයෙන් විග්‍රහ කිරීමක් මේ දක්වා සිදුවී ඇත්තේ අල්ප වශයෙනි. පාරභෞතික නොහොත් යාන්ත්‍රික දේශපාලන සූත්‍රයන්ගේ ග්‍රහණයට පරිබාහිරව පැන නගින්නා වූ නොයෙකුත් ක්‍රියාකාරිත්වයන් තේරුම් ගැනීමට අප බොහෝ විට අපොහොසත් වී ඇති නිසාම, නිවැරදි ක්‍රියාමාර්ගයන් සම්පාදනයෙහි ද නොයෙකුත් දුර්වලතා අනිවාර්ය වේ. මේ පදනම් යටතේ, පටු ජාතිවාදී හා/හෝ කල්ලිවාදී ප්‍රවනණතාවයන්ට ගොදුරුවී අනුචිත හා පසුගාමී චින්තනයට සහ ක්‍රියාකාරිත්වයකට අපගේ බොහෝ බලවේග පසුගිය කාලයේ පෙළඹුණු වාර අප්‍රමාණ බව ද අවංකව පිළිගත යුතු වේ.

මේ සමස්ත ව්‍යාකූලත්වය හා නිෂ්ක්‍රීයභාවය මධ්‍යයේ, සමාජ සාධාරණත්වය සහ යුක්තිය පතා සටන් කිරීමට ජනතාව සතු හැකියාව තහවුරු කරමින් සෙසු ජනකොටස් ද දිරිමත් කරමින් පසුගිය වකවානුවේ හටගත් සටන් හා අරගල කිහිපයක් පිළිබඳ දළ සටහනක් ඉදිරිපත් කිරීම මේ ලිපියේ අරමුණයි. සියලු ම අතින් අසම්පූර්ණ වුව ද මෙම සටහන අනාගතයේ දී මේ සම්බන්ධයෙන් කෙරෙන වඩාත් පුළුල් සහ පරිපූර්ණ විග්‍රහයකට මඳකින් හෝ දායක වේ නම්, එය ප්‍රමාණවත් ය.

සුනිලා අබේසේකර

1988 නොවැම්බර්

ඡායාරූප: චිත්සන්ට් කුරුඹාපිටිය

වෙල්ලස්ස ගොවි අරගලයට සහභාගි වූ ස්ත්‍රීන් පිරිසක් මොනරාගල දිසාපති කාර්යාලය ඉදිරිපිට, 1984 - දෙමටබැද්ද ගමේ ලීලා බටගොඩ, සීලවතී, කොඩයානේ බණ්ඩාරමැණිකේ, මැණිකේ කෝනාර, කරුණා සහ ප්‍රගතිශීලී කාන්තා පෙරමුණේ සුමිකා යන සහෝදරියන් මෙහි වෙති.

මොනරාගල ගොවිජන අරගලය

අප හොඳින් දන්නා පරිදි, මොනරාගල දිස්ත්‍රික්කය වනාහී අද ලංකාවේ අඩුම වරප්‍රසාද හිමි භූමි භාගයකි. අතීතයේ ඌව වෙල්ලස්ස ප්‍රදේශය කෘෂිකාර්මික අතින් සශ්‍රීකව තිබූ බව ප්‍රසිද්ධ කරුණකි. එසේම, 1848 කැරැල්ලට කේන්ද්‍රස්ථානය වෙමින් එය ලංකා ඉතිහාසයේ නොමැකෙන සටහනක් ද ඉතිරිකොට ඇත. එහෙත් පසුකාලයේ මැලේරියාව ආදී රෝග පැතිරීම, වාරිමාර්ග බිඳවැටීම ආදී දහසකුත් එකක් හේතුන් නිසා ප්‍රදේශය ජනශූන්‍ය විය. ඒ සමඟම බෙලහීන ලාංකීය ධනපති පංතිය, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තම ග්‍රහණයට නතු කර ගැනීමට දක්වූ නොහැකියාව නිසා එහි මධ්‍යම පරිපාලන රටාව, මොනරාගල වැනි දිස්ත්‍රික්කවල සංවර්ධනය පිළිබඳව දැඩි නොසැලකිල්ලක් දක්වූ බව පෙනෙයි.

එහෙත් පසුගිය අවුරුදු තුන පුරා මේ රටේ පමණක් නොව, විදේශවල ද ප්‍රගතිශීලීන්ගේ නොමඳ අවධානයට ලක්වූ ජන අරගලයකට මොනරාගල බඳුන් වී ඇත. එහි පසුබිම මෙසේය.

වර්තමාන රජයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියෙහි එක් ප්‍රධාන අංගයක් වන්නේ ගැමි-කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළට නවීකරණය හා ධනවාදී සංවර්ධන රටාවක් ගෙනයාමයි. විදේශ ආධාර පිහිටෙන් කඩිනම් කළ මහවැලි යෝජනා ක්‍රමය මේ අරමුණේ එක් පැහැදිලි ප්‍රකාශයක් පමණි. පසුගිය වර්ෂ කිහිපය තුළ විටින් විට කෘෂි ව්‍යාපෘති සඳහා විදේශීය ආයෝජකයන්ට ඇරයුම් කිරීම ද මේ ක්‍රියාදාමයේ කොටසකි. අප මෙම ප්‍රශ්නය දෙස බලන විට, සංවර්ධනය වන රටවල් නැවත වරක් යටත් විජිත සමයේ මෙන් සංවර්ධිත රටවලට අමුද්‍රව්‍ය සපයන්නන් බවට පත් කිරීමේ ජාත්‍යන්තර ධනවාදී ක්‍රියාදාමය සම්බන්ධයෙන් ද දැනුවත් විය යුතුය. ලතින් සහ මධ්‍යම ඇමරිකාව සහ පිලිපීනය මේ සම්බන්ධයෙන් අපට කදිම උදාහරණ සපයයි.

1980 දී ලංකාවේ විදේශ ආයෝජකයින්ට ඇති අවස්ථා පැහැදිලි කිරීම සඳහා රජය විසින් පවත්වන ලද සමුළුවක දී ඉඩම් හා මහවැලි සංවර්ධන ඇමති ගාමිණී දිසානායක මහතා, මෙරට කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ ආයෝජනය කරන මෙන් විදේශික ආයෝජකයින්ට ආරාධනය කළේය. මන්නාරම, මොනරාගල වැනි ඌණ සංවර්ධිත දිස්ත්‍රික්ක සඳහා විශේෂයෙන් ම මෙම ආයෝජනයන් විසින් අපේක්ෂා කරනු ලබන්නේ, එමඟින් එම දිස්ත්‍රික්ක සංවර්ධනය කිරීමට හැකිවන නිසා බව එහිදී ප්‍රකාශ විය. මෙයට අනුව 1981 දී පටන්, මොනරාගල දිස්ත්‍රික්කයේ විදේශ ආයෝජකයින් සමග අත්වැල් බැඳගත් රජය මහා පරිමාණ කෘෂිකාර්මික ව්‍යාපෘති ආරම්භ කිරීමට යන බවට රාවයක් පැතිරුණි.

1982 වන විට, මොනරාගල ප්‍රදේශයේ උක් වගාකොට එහි සීනි නිෂ්පාදනයෙහි යෙදීමට කැමැත්ත ප්‍රකාශ කළ සමාගම් දෙකක් පිළිබඳව ආරංචි විය. මොනරාගල දිස්ත්‍රික්කයේ මීට පෙර සිට සුළු පරිමාණයෙන් උක් වගාව කෙරුණ ද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ලංකාවට සීනි ආනයනය කිරීමේ නිදහස පෞද්ගලික වෙළඳ ක්ෂේත්‍රයට ලබාදුන් තැන පටන්, දේශීය සීනි නිෂ්පාදනයට කණ කොකා හැඬුවේ ය. මේ වනවිට විදේශික සමාගම්වලට එම කාර්යය පැවරීමට ආණ්ඩුවේ අදහසක් තිබුණි.

1982 වන විට බූකර් ඇග්‍රිකල්චර් ඉන්ටර්නැෂනල් සමාගම පැලවත්ත සීනි කම්හල ව්‍යාපෘතිය යටතේ උක් වගාව ආරම්භ කළේය. මෙම සමාගමට පවරා දුන් ඉඩම් වැඩි ප්‍රමාණයක් කිසිවකු පදිංචිව සිටි ඉඩම් නොවූ බැවින් සහ මේ පිළිබඳව තියුණු දැනුවත්භාවයක් ප්‍රදේශයේ ගොවීන් අතර නොපැවතුනු බැවින් ඒ සම්බන්ධයෙන් වැඩි ජනතා විරෝධයක් සංවිධිත ලෙස පැනනැඟුනේ නැත. එහෙත් මෙටා ඉන්ටර්නැෂනල් නම් වූ සමාගමට මොනරාගල හද්දාව මූකලාන ඇතුළු ඉඩම් අක්කර 12,000 ක භූමියක් ලබාදීමට යන බව ආරංචි වූ විට, මේ තත්ත්වය වෙනස් විය. මූලික සාධකයක් වූයේ, මෙසේ පැවරීමට

නියමිත වූ ඉඩම් බොහෝ සේ ජනාවාස වී තිබීමයි. තක්සේරුවකට අනුව, ගම් 23 ක පවුල් 625 කට (1985-11-01 ලංකා ගාඩියන් සඟරාවට ගාමිණී යාපා මහතා සැපයූ ලිපියකට අනුව) මේ නිසා උන්හිටි තැන් අහිමි වනු ඇත. මෙම පිරිසෙන් සමහරක් 'අනවසරයෙන්' හේන් වගා කළ ගොවීන් ලෙස රජය විසින් නම් කළ නමුත් නීත්‍යානුකූල ලෙස රජයට බදු ගෙවා පරම්පරා ගණනාවක සිට එම ඉඩම් වගා කළ ගොවීහු ද මේ පිරිස අතර වූහ. මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රමාණයට සමානුපාතිකව ජනගහණය ගත් විට, එය ජන ශූන්‍ය ප්‍රදේශයක් ලෙස පෙනීගියත්, ඇත්ත වශයෙන් ම යාල, ලාහුගල, උඩ වලවේ යන වනසත්ව අභය භූමි සඳහා සහ ගල්ඔය ව්‍යාපෘතියේ ආරක්ෂක වන ප්‍රදේශය සඳහා විශාල භූමි ප්‍රදේශයක් වෙන්කොට තිබේ. මේ අනුව, ජනාවාස වීමට ඇති ඉඩකඩ සීමිත ය. තවද, විශේෂ ගැටලුවක් වූයේ හද්දාව නම් ඉපැරණි මූකලාන මෙසේ එළි පෙහෙළිකොට උක් වැවීම සඳහා යොදා ගැනීමට ගත් උත්සාහයයි. මන්ද යත්, පුරාණයේ සිට ඖෂධ වනයක් ලෙස ප්‍රසිද්ධ වූ මෙම මූකලාන, ඒ ප්‍රදේශය හරහා ගලා යන හැඩඔය ට ද රැකවරණ සපයන බැවිනි. හද්දාව එළිකිරීමෙන් හැඩඔය ද වියළී යනු ඇතැයි අනුමාන කෙරුනි. එවිට ප්‍රදේශය පුරාම ජල අර්බුදයක් ඉතා තදින් පැනනගිනු ඇත. තවද, මොනරාගලට ජල හිඟයක් ඇති වුවහොත්, දැනටමත් එය පිහිටි

ඡායාරූප: විත්සන්ට් කුරුඹාපිටිය

දෙමටබැද්ද ගමේ
ගොවි ස්ත්‍රීන්ගේ සාකච්ඡාවක්

ප්‍රදේශයට පවා ජලය ප්‍රමාණවත් වන අයුරින් සැපයීමට අසමත් වූ මුතු කණ්ඩිය ව්‍යාපාරයෙන් ජලය ගෙන්වා ගැනීමට සිදුවේ ය යන ගැටළුවක් ද පවතී.

1984 වසර පුරාම පාහේ මොනරාගල දිස්ත්‍රික්කයේ ඉඩම් බහුජාතික සමාගම් විසින් මංකොල්ල කෑමට එරෙහිව උද්ඝෝෂණ සහ විරෝධතා ව්‍යාපාරය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. 1984 සැප්තැම්බර් මාසය වන විට, කොළඹ දිස්ත්‍රික්කය තුළ පවා මොනරාගල ගොවිජන අරගලයට සහාය පිණිස සහයෝගිතා කමිටුවක් පිහිටුවන ලදී. රටේ පවතින විවිධ ගොවි සමිති සංවිධාන ද මේ ප්‍රශ්නය වටා ඒකරාශී විය. ගොවි නියෝජිතයින් රජයේ නිලධාරීන් මුණගැසී මේ පිළිබඳව පැමිණිලි කළ හැම විටම, මෙසේ ඉඩම් සමාගම්වලට පැවරීමට කිසිඳු බලාපොරොත්තුවක් රජය තුළ නැති බව අසන්නට ලැබුනි. එහෙත් කිසිඳු දැනුම්දීමකින් තොරව සමාගමට දෙන ලද ඉඩම්වල සීමා සලකුණු කරන මායිම් කැපීමට කුලීකරුවෝ පැමිණියහ. මොවුන් දෙහි, කෙසෙල්, තැඹිලි යනාදී ගහ-කොළ පවා විනාශ කරමින් ඉඩම් හරහා කරන්නට ගිය මෙම මායිම් ලකුණු කිරීමට බරපතල විරෝධයක් පැනනැගින. බොහෝ විට පුරුෂයින් ගෙදර නොසිටි උදය වරුවල කෙරුනු මේ 'ආක්‍රමණශීලී' වැඩපිළිවෙලට මුහුණ දුන්නේ ගෙවිලියෝ ය. මුලදී නිසොල්මන්ව බලා සිටිය ද පසුව තම ඉඩම්වල අයිතිය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් දැනුවත් වූ ඔවුහු බොහෝ එඩිතරව තම අයිතිවාසිකම් කියාපාමින් සමාගමේ කුලීකරුවන් පලවා හැරියෝය. මෙය, මෙම ස්ත්‍රීන්ට වඩාත් සෘජුව බලපෑවේ දෙහි, කෙසෙල්, බඩ ඉරිඟු වැනි භෝග සුළු පරිමාණයෙන් වගාකොට, සැතපුම් ගණන් තම හිසමත තබාගෙන වෙළඳපොලට ගෙන ගොස් ඒ ලබන සුළු මුදලින් තම පවුලේ එදිනෙදා අවශ්‍යතාවයන් පිරිමහගන්නෝ ඔවුහු වූ නිසාවෙනි. එහෙත් මෙය තාවකාලික විරාමයක් පමණක් විය. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා, දිසාපතිවරයා ඇතුළු සියලුම බලවතුන් හමුවීමට සංවිධාන ගත වූ ගොවි ගෙවිලියෝ නිතර දෙවේලේ යන්නට පටන් ගත්හ. අදාල නිලධාරීන් විසින් එම නියෝජිත කණ්ඩායම්වලට නොකඩවා දුන් පිළිතුර වූයේ එවැනි ඉඩම් පැවරීමක් සිදු නොකරන බව ය. මේ සිද්ධීන්ට පසුව ගම් මට්ටමින් බොහෝ රැස්වීම් සාකච්ඡා පවත්වා මේ තත්ත්වයට මුහුණ දීම සඳහා සූදානම් වීමක් ඇති විය. ගොවි සංවිධාන විසින් මේ පිළිබඳව ලියැවුණු පත්‍රිකා ආදිය බෙදා හරින ලදී. දොඹගහවෙල මැදි විදුහලේ රජයේ නිලධාරීන් ද කැඳවා පැවැත්වූ රැස්වීමක දී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම නැගූ ප්‍රශ්නවලට ද සෑහීමකට පත්විය හැකි ආකාරයේ පිළිතුරු නොලැබිණ.

ඡායාරූප: වින්සන්ට් කුරුඹාපිටිය

මඩුගම සිට සියඹලාණ්ඩුව දක්වා පැමිණි ගොවීන්ගේ මැයි දින පෙළපාලිය - වෙල්ලස්ස ගොවි අරගලයේ ස්ත්‍රීන් සංවිධානය කිරීමට නායකත්වය දුන් සුමිකා පෙරේරා සහ ගමේ නායකත්වය ගත් දෙමටබැද්දේ ලීලා බටගොඩ සහ මැණිකේ කෝනාර යන සහෝදරියන් වෙති.

මේ ක්‍රියාදාමය තුළ ස්ත්‍රීන්ගේ ක්‍රියාකාරිත්වය විශේෂයෙන් වැදගත් විය. සමස්ත ලංකා ගොවි සම්මේලනයේ ඇරයුම පිට මොනරාගල ගෙවිලියන් අතර වැඩ කිරීම සඳහා වෙහෙසුණු ප්‍රගතිශීලී කාන්තා පෙරමුණේ අත්දැකීම් මෙහිදී ඉතා වටිනා වේ. 'කාන්තා මඟ' 5 වන කලාපයේ ඔවුන් මොනරාගලට යන විට එහි පැවති තත්ත්වය විස්තර කළ පරිදි, ගෙදර දොර, දරුවන්ගේ කටයුතු හා කුඹුරේ, හේනේ වැඩ හැරුණු විට එයින් පිට මොන යම් හෝ සමාජ වැඩකට තමා නුසුදුස්සෙකුය යන හැඟීම මේ ස්ත්‍රීන් තුළ දකින්නට තිබුණු බවත් මුල් වටයේ රැස්වීම්වලට පැමිණීමට පවා ගෙවිලියන් මැලිවන විට ගෙයින් ගෙට ගොස් ඔවුන් දැනුවත් කළ ආකාරය සහ රැස්වීම් සාකච්ඡාවලට පැමිණි විට පවා මෙම ස්ත්‍රීන් නිහඬව සිටි ආකාරය එම ගෙවිලියන් සංවිධානය කිරීමට නායකත්වය දුන් සුමිකා පෙරේරා සොයුරිය මැනවින් විස්තර කරයි. එහෙත් තම ඉඩම් පිළිබඳ ගැටළුව උග්‍ර වෙත්ම, *'මරාගෙන මැරුණත් එක බිම් අඟලක්වත් දෙන්නෙ නෑ'* කියන තත්ත්වයට මෙම ගොවි ස්ත්‍රීන් පත්විය. පෙත්සම් අත්සන් කිරීම, සාකච්ඡා සහ රැස්වීම් සංවිධානය කිරීම ආදී කටයුතුවල පමණක් නොව, වරින් වර මායිම් කැපීමට පැමිණි සමාගමේ නිලධාරීන් පලවා හැරීමේ කටයුතු වලදීත් ස්ත්‍රීහු පෙරමුණ ගත්හ. මායිම් කැපීමට සමාගමේ සේවකයින්ට ගම තුළට යාමට ඉඩ නොදී වර්ෂාව ද නොතකා ස්ත්‍රීන් පැය ගණනක්

රැකවල්ලාගෙන සිටි බව ද සඳහන් වුණි. සමාගමේ ක්‍රියාකාරිත්වයට බාධා කළ පිරිස පොලීසි ගෙන යාමේ තර්ජනය හමුවේ ඔවුන් කියා සිටියේ *'අපි සේරම එක්ක යන්න'* කියාය. හද්දාව මූකලාන විනාශ කිරීමට යන බව ආරංචි වී ඒ පිළිබඳව සිය විරෝධය කියාපෑම සඳහා මොනරාගල දිසාපති කාර්යාලයට ගිය පිරිස අතර ද ස්ත්‍රීන් සෑහෙන ප්‍රමාණයක් විය. එහිදී එක් මවක් 'මගේ ඉඩමට බලපත්‍රයක් මට තියෙනවා. මම නං මරාගෙන මැරුණත් මගේ ඉඩම නං උක් කොම්පැණිකාරයින්ට දෙන්නෙ නෑ' කී බව ප්‍රසිද්ධ කරුණකි. මෙය සිදු වූයේ 1984 නොවැම්බරයේදී ය. එදින දිසාපතිවරයා හද්දාව එළි කිරීමට කිසිවකුට අවසර පත්‍ර නිකුත් කර නැති බව සහතික කළත් දින කීපයක් ඇතුළත රජයේ බලපත්‍රයක් ද ඇතිව පැමිණි රාජ්‍ය දූව සංස්ථාවේ නියෝජිතයෝ කැලෑව එළි කිරීම ආරම්භ කළහ.

1985 වන විට උණුසුම් තත්ත්වයක පසු වූ මොනරාගල ගොවි ජන අරගලය කොළඹ බලධාරීන්ගේ ද අවධානයට ලක් වූයේ එයට එරෙහිව පැවැති විරෝධය පිළිබඳව සෑහෙන දුරට ජාත්‍යන්තර කීර්තියක් ද හිමි කරගත්තාට පසුව ය. පාර්ලිමේන්තු කොමසාරිස්තුමාට යවන ලද්දේ පෙත්සමකට පිළිතුරු වශයෙන්, 1985 ජනවාරි 15 දා මොනරාගල දිසාපතිවරයා, සීනි සමාගම නියෝජනය කළ රජයේ නිලධාරියෙකු සහ පාර්ලිමේන්තු කොමසාරිස්තුමා ගොවි නියෝජිතයින් පිරිසක් සමග කොළඹදී සාකච්ඡාවක් පැවැත් වූයේය. එම අවස්ථාවේ ගොවීන්ට දැනගන්නට ලැබුනේ ඔවුන්ගේ විරෝධතාවයන් රාජ්‍ය ප්‍රතිපත්තියට එරෙහිව වන බවත්, මේ අනවශ්‍ය බාධා කිරීම් නිසා මෙටා ඉන්ටර්නැෂනල් සමාගමේ වැඩසටහන අවුරුද්දකින් පමණ ප්‍රමාද වී ඇති බවත් ය.

1985 මැයි මස වන විට, කලින් වසරේ එළි කරගත් අක්කර 80 ක් සම්බන්ධයෙන් දැඩි නොසෑහීමකට පත් සමාගම, මේ වසරේ අක්කර 400 ක් හෝ තම අණසක යටතට ගෙන උක් පැල තවාන් කිරීම විශාල වශයෙන් සිදු කළ යුතු බවට ස්ථිර අදහසක සිටින බව ආරංචි විය. මැයි 11 දා පැලතවාන තුළ වැඩ කරමින් සිටි බුල්ඩෝසරයක් තවානේ මායිම් ඉක්මවා ගොස් ගොවීන්ගේ ඉඩම්වලට ද ඇතුල් විය. මේ ආරංචිය ලැබුණු වහාම මැයි 12 දින 100 ක පමණ ගොවීන් පිරිසක් එතැනට එක් වූ අතර එම පිරිසෙහි ගෙවිලියෝ ද සෑහෙන ප්‍රමාණයක් විය. ඩෝසර් කිරීම බාර නිලධාරියෙක් සමඟ දිගින් දිගටම ඇතිවුනු කතා බහේදී එක් ගොවි ස්ත්‍රියක් *'කලින් මායිම් කපන්න ඇවිල්ලා මගේ වගාවත් විනාශ කළා. ආපු මිනිස්සු අපේ තැඹිලිත් කඩලා බීවා. ගොඩගහලා තිබුණ ගොයම විනාස කළා. අපිට උන්නත් එකයි; මළත් එකයි; අපේ ඉඩම්වලට අත තියන්න එන්න එපා'*යැයි කී බවට වාර්තා වී තිබේ. මෙම සිද්ධියෙන් පසුව

ගොවීන් අත් අඩංගුවට ගැනීම ආරම්භ විය. ගොවීන් 88 දෙනෙකු පොලීසිය විසින් සොයමින් සිටි බව දැන ගන්නට ලැබී ඒ පිළිබඳව සාකච්ඡා කළ ගොවි සමිති, ජුනි 5 දින එම ගොවීන් පිරිස උසාවියට ඉදිරිපත් කිරීමට තීරණය කළහ. එදින උසාවියේ නම් 62 ක් අඩ ගැසිණි. එයින් හය දෙනෙකු ස්ත්‍රීහු වූහ. සමාගමට එකී ඉඩම්වල අයිතිය ඔප්පු කිරීමට කිසිඳු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බැවින් *'ගමක් පිටින් රිමාන්ඩ් භාරයට ගත නොහැකියි'* කියමින් නඩුකාරතුමා ශරීර ඇප මත ගොවීන් සියලු දෙනාම නිදහස් කළේය.

මේ ආකාරයට අවුරුදු දෙකක පමණ කාලයක් පෙත්සම් යැවීම, සාකච්ඡා කිරීම, උපවාස කිරීම, සත්‍යග්‍රහ පැවැත්වීම යනාදී වශයෙන් වූ සාමකාමී ක්‍රියාමාර්ග ඔස්සේ මෙම ප්‍රශ්නයට විසඳුමක් සෙවූ මොනරාගල ගොවි ජනතාව ක්‍රම ක්‍රමයෙන් සටන්කාමී පියවරයන් කරා ඇදී ගියහ. එහි අමතක නොවන සිදුවීමක් වූයේ 1985 අගෝස්තු 31 වන දා උක්පැල තවානේ පැල ගැලවීමයි. 'කාන්තා මඟ' 6 වන කලාපයේ භද්‍රා වික්‍රමසිංහ සහ කමලා අධිකාරී සොහොයුරියෝ එම අත්දැකීම මෙසේ විස්තර කරති. දෙසීයක් පමණ පිරිස අතර ගෙවිලියන් 60 ක් පමණ විය. උක් පැල තවාන වෙතට සැතපුම් දෙකක් පමණ පයින් ම ගමන් කළ මේ පිරිස පලු, වීර, බුරුත ගස් අතරින් ගියේ දැඩි ආත්මශක්තියකින් යුතුවයි. උක් තවාන ඈතින් පෙනෙන විට පිරිස තවාන වෙත දුවන්නට පටන් ගත්තේ ය. ඇති වූ උද්වේගය කොතෙක්දැයි කියතොත් එක් අම්මා කෙනෙක් වැට කඩා දමා තවාන ඇතුලට පැන්නා ය. අක්කර ගණනාවක් ම විනාශ කිරීමට ගත වූයේ පැයක පමණ කාලයකි. එහෙත් උක් පැල ගලවා දමා ගොවීන් විසින් සිට වූ කෙසෙල් පැල උදුරා එහි යළිත් උක් පැල සිටුවීමට සමාගමට හැකිවිය. එතැන් පටන් අවිගත් ආරක්ෂක භටයෝ උක් පැල තවාන රකිති.

මේ 1986 සැප්තැම්බරයයි. කොතරම් ගොවි සහ බහුජන විරෝධය පැවතියත් රජය බහුජාතික සමාගම් වෙත ඉඩම් පැවරීම නවත්වා නැත. රාජ්‍ය අනුග්‍රහය සහ සන්නද්ධ හමුදාවේ ආරක්ෂාව ඇතිව සීනි සමාගම තම කටයුතු දිගටම කරගෙන යයි. ඒ ප්‍රදේශයේ පාරම්පරික ජන ජීවිතය මේ නිසා ප්‍රබල වෙනස්වීම්වලට භාජනය වී ඇති අතර රජය මේ කම්හල් මඟින් නිෂ්පාදිත සීනි ලෝක වෙළඳපලේ පවතින මිලට වැඩි මුදලක් ගෙවා හෝ මිලදී ගැනීමට දී ඇති ප්‍රතිඥාව හමුවේ, සීනි මිල නුදුරු අනාගතයේ දෙගුණ තෙගුණ වීමේ තර්ජනයට මුළුමහත් ලක්වැසි ජනතාවම මුහුණ දී සිටිති.

මේ වනවිට මොනරාගල ගොවිජන අරගලය නිෂ්ක්‍රීය වී ඇති සෙයක් පෙනුනත්, යෝධයකු වැනි වූ රාජ්‍ය ප්‍රතිපත්තියට එරෙහිව එම ප්‍රදේශයේ ජනතාව ගෙන ගිය අරගලය සැබැවින් ම උදාර එකකි. රජයට අයත් වූ, ගොවීන් අනවසරයෙන් භාවිතා කරමින් සිටි ඉඩම් යම් ප්‍රමාණයක් බේරා ගැනීමට මෙම ගොවි ජනයාට නොහැකි වුවත් ඉඩම් නිරවුල් කිරීමේ පනත යටතේ නිරවුල්ව තිබූ පාරම්පරික ගොවි ඉඩම් කොල්ලකෑමට විදේශීය සමාගම්වලට නොහැකි විය. ගොවිජන විරෝධය හමුවේ ඒවාට අතපෙවීමට ඔවුහු බිය වූහ. එමෙන්ම මොනරාගල ජනයාගේ පාරම්පරික උරුමයක් වූ හද්දාව මූකලාන බේරා ගැනීමට ද ඔවුන්ට හැකි වී තිබේ.

මෙරට පෙර නොවූ විරූ, පුළුල් බහුජන පෙළගැස්මක් තුළින් රට පුරා මෙම අරගලයට සහයෝගය ගොඩනැඟුනු ආකාරයෙන් ද එම ප්‍රදේශයේ සටන් සහ සංවිධාන උපාය, උපක්‍රම පිළිබඳව ඉගෙන ගත හැකි වූ පාඩම් ද අපට හැමදාමත් අගනේ ය. තවද ස්ත්‍රීන් වශයෙන් මෙරට ගොවි අරගල ඉතිහාසයේ ගෙවිලියන් ද මෙසේ බහුජන පදනමකින් සංවිධානය කෙරුනු මුල් අවස්ථාව මෙය යැයි හඟිමු. ගෙවතු වගාවෙන් තම පවුලේ දෛනික ආර්ථිකයට ප්‍රබල දායකත්වයක් එකතු කරන මොනරාගල ගෙවිලියන් සටන් වැදුණේ තම දරු

ඡායාරූප: වින්සන්ට් කුරුඹාපිටිය

ගොවි ප්‍රශ්න රජයට ඉදිරිපත් කිරීමට සමස්ත ලංකා ගොවි සම්මේලනය විසින් දිප ව්‍යාප්තව අත්සන් කරන ලද ගොවි පෙත්සම අත්සන් කිරීමට සහාය දක්වන ස්ත්‍රී ත්‍රියාකාරීන් - ජේම්ස් ඇතුගල, වයලා පෙරේරා, කමලාවතී සහ රසිකා නිලන්ති ඇතුළු සොයුරියන් පිරිසක් මෙහි වේ.
1982 කු-රුණෑගල ඉබ්බාගමුවේදී.

පවුල් වෙනුවෙන් පමණක් නොව තමන් ද වෙනුවෙනි. දිවිහිමියෙන් වුව ඔවුන් සුරැකීමට සැරසුනේ ස්වාධීන දිවි පෙවෙතකට තමාට ඇති අයිතියයි. මුල් කාලයේ ගොවි සමිති සංවිධානවල කටයුතුවලට කිසිසේත් මැදිහත් නොවූ මොනරාගල ගෙවිලියෝ, සීනි සමාගමට විරුද්ධව කළ සටන් ක්‍රියාවලියෙන් පන්නරය ලැබූහ. ප්‍රදේශයේ පැවැති සාකච්ඡාවල, ගොවි ස්ත්‍රීන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් පමණක් නොව, පොදුවේ ස්ත්‍රී ප්‍රශ්න පිළිබඳවත් ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරයේ ජාත්‍යන්තර අත්දැකීම් පිළිබඳවත් ඔවුන්ට දැනගන්නට ලැබුණි. එසේ ම පෙළපාලි සහ උද්ඝෝෂණ ව්‍යාපාරයන්ට සහභාගිවීමට ලද අවස්ථාව නිසා වෙනත් ක්ෂේත්‍රවල නියැලුණු සටන්කාමී ස්ත්‍රීන් හඳුනාගැනීමට ලද අවස්ථාව නිසා මේ ගොවි ස්ත්‍රීන් ක්‍රියාකාරීව සටහන් පෙරමුණට පිවිසන්නට මින් මතුව පසුගාමී නොවනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය. මේ තුළින් ඇරඹුණු දැනුවත් වීමේ සහ සටන්කාමීත්වයේ ක්‍රියාදාමය දැන් කිසි විටෙකත් ආපසු හැරෙන්නේ නම් නැත. මොනරාගල අරගලය පුරා ස්ත්‍රීහු, මීට පෙර කිසිඳු සටන් අත්දැකීමක් නොමැති, ඉතා 'සාමාන්‍ය' ගැමි ස්ත්‍රීන් කියා පෑ එඩිතරකම සහ අභීතකම මෙරට සියලුම ස්ත්‍රීන්ට සැබෑ ආදර්ශයකි.

මොනරාගල ගොවි අරගලයේ සියලුම ජයග්‍රහණයන් සහ ආශ්වාදයන් ගණනයට ගන්නා අතරම එහි බිඳ වැටීමේ සහ දුර්වලතාවයන් ඔස්සේ අපට ඉගෙන ගත හැකි පාඩම් ද බොහෝ ය. සමාජවාදී දෘෂ්ටිකෝණයෙන් බලන කල, මොනරාගල අරගලය මූලික වශයෙන් ප්‍රාථමික ගොවි අරගලයක් ලෙසට නම් කළ යුතු වේ. එය ගොඩනැඟුනේ හුදෙක් පාරම්පරික ඉඩම් අහිමි වීමේ තර්ජනයන්ට මුහුණ දුන් ගොවීන්ගේ ජීවගුණය මතය. සටනේ අරමුණ වූයේ, අහිමි වීමට යන තම ඉඩම්වල අයිතිය දිනා ගැනීමයි. එහෙත් රජය පොදුවේ අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තිය සහ මොනරාගල ක්‍රියාදාමය දෙස සමස්තයක් වශයෙන් බලා විශේලේෂණය කෙරුණේ අරගලයට බොහෝ කල්ගත වූවාට පසුව ය. තවද, මෙවැනි නවීකරණ ක්‍රියාදාමයන් මගින් ගැමි ප්‍රදේශවල පංති ස්ථරකරණය වඩාත් තීව්‍ර වන බව සහ දිළිඳු ගොවියන් විදේශික සමාගම් සතු වතුවල කම්කරුවන් බවට පත් වන අතර, එම ක්‍රියාවලියට එරෙහි වන සුළු ඉඩම් හිමි ගොවියන් ප්‍රතිගාමී පිල වෙතට තල්ලු වී යාමේ අවදානමක් ඇතැයි යන්න පිළිබඳව මෙන්ම මෙරට පංති පෙළගැස්මට ඉතා තීරණාත්මක වන කෝණයන් දෙස ද මුල් අවධියේ ප්‍රමාණවත් බැල්මක් හෙලුනේ නැත. මෙවැනි අරගලයකට උරුම වන්නේ කෙටිකාලීන බව සහ තනිවීම බව එහි ආරම්භයේදී ම පැහැදිලි විය යුතුව තිබුණි. ඒ නිසා ම, අරගලය සිදුවන අතරෙහි ම එහි දිගුකාලීන ඉලක්කයන් ද නිශ්චය කර ගැනීමේ අවශ්‍යතාවය අප හමුවෙහි ය.

කුරුණෑගල හිරිපිටිය ධර්මචන්ද්‍ර පිරිවෙණේ පැවැති ජලබදු විරෝධී ගොවි රැස්වීමක්.
එහි මූලාසනය නවගමුවේ ධම්මාලෝක නායකස්වාමීන් වහන්සේ විසින් හොඹවන ලදී.

ජලබදු විරෝධී අරගලය

1984 සිට ක්‍රියාත්මක වන පරිදි, මහා වාරිමාර්ගවලින් ජලය ලබන ගොවීන්ගේ කුඹුරුවලට නඩත්තු හා මෙහෙයුම් ගාස්තුවක් වශයෙන් අක්කරයකට රු. 100.00 ක මුදලක් අය කිරීමට රජය තීරණය කළේය. මෙම බද්ද අවුරුද්දකට 20%කින් වැඩිවී රු. 200.00 ක උපරිමයක් දක්වා වැඩිවීමට නියමිත ය. පසුගිය වකවානුවේ මෙරට සාමාන්‍ය ගොවි ජනතාවගේ සීඝ්‍ර දිළිඳුකරණය සමග සාපේක්ෂව බැලූ කල, මෙවැනි බද්දක් අය කිරීම ලංකාවේ සුළු ගොවීන්ට මරු පහරක් බව පැහැදිලි ය. 1979 සිට ම වගා ණය නොගෙවූ ගොවීන්ගේ ණය පහසුකම් අහෝසි කිරීමත් නඩු පැවරීමත් 1979 රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ අනවසර ගොවීන්ට දුන් ගොවි බලපත්‍ර ආපසු අත්තනෝමතික ලෙස රජය වෙත පවරා ගැනීමත් දිගින් දිගටම කෙරුනි. ගොවි ද්‍රව්‍ය මිල දී ගැනීමේ සහ සහතික මිලක් දීමේ වැඩ පිළිවෙල අඩපණ වූ අතර අත්‍යවශ්‍ය ආහාර බෝග නිදහසේ ආනයනය කිරීමට ඉඩ සලස්වා

දීම නිසා ද දේශීය නිෂ්පාදකයින්ට බරපතල පහරක් එල්ල විය. 1986 මහජන බැංකු නිරීක්ෂණයකට අනුව, රජයේ සියලුම සහන උපරිම ආකාරයට වුව අදායමට වඩා වියදම වැඩි බව හෙළි විය. එසේම, පොලොන්නරුව වැනි සරුසාර කෙත් වතුවලට ප්‍රසිද්ධ පළාතක වුව, ගොවි පවුලක මාසික ආදායම රු. 280.00 නොඉක්මවන බව සොයා ගන්නා ලදී.

කෘෂිකාර්මික ව්‍යාපෘතීන් හි මතුපිට සරුසාර බවක් පෙනුණ ද පොදුවේ ලාංකීය ගොවි ජනතාව පංති විෂමතාවයන් තීව්‍ර වූ සහ බහුතරයක් සුළු ගොවීන් අන්ත දිළිඳුභාවයට තල්ලු වූ යුගයක් ලෙස මේ කාල පරිච්ඡේදය හැඳින්වීම නිවැරදි යැයි හැඟේ.

ලාංකික ගොවියාගේ අනාගතය පිළිබඳව ඉතාමත් භයානක ඉඟියක් කරන 1985 අංක 6 දරන ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතන පනතට අනුව, 'වාරිමාර්ග ක්‍රමවල සැලැස්ම, නිර්මාණය, ක්‍රියාකාරිත්වය, ජලය ගලායාම හා බෙදාහැරීම විධිමත් කිරීම, ජලය සඳහා මිල නියම කිරීම සහ ප්‍රතිපත්ති, පස, පරිසරය සහ අදාල ජනතාවගේ සෞඛ්‍ය සහ පොදු ශුභ සිද්ධිය කෙරෙහි බලපෑම' ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය ආධාර කණ්ඩායම වෙත බාර දෙන ලදී. එය ලෝක බැංකුව විසින් පාලනය කරනු ලබන ආයතනයක් බව ප්‍රසිද්ධ රහසකි. මේ නිසා, ඉදිරියට වාරිමාර්ග සම්බන්ධයෙන් කුමන ආකාරයේ නව ආඥා පැනවේදැයි යන්න බරපතල ගැටළුවකි.

ඡායාරූප: සුනන්ද දේශප්‍රිය

සමස්ත ලංකා ගොවි සම්මේලනය වෙනුවෙන් මාළිඳිය, තම්බුව වීර පුරන්අප්පු කලාකවයේ චන්‍රදාස, ප්‍රේමසිරි ගමගේ, විජේවර්ධන යන සහෝදරයින් සහ ප්‍රගතිශීලී කාන්තා පෙරමුණේ සුමිකා, වයලා, ජයන්ති යන සහෝදරියන් පිරිස කුරුණෑගල, අවුලේගම පැවැති ගොවි රැස්වීමකදී 'ගොවි විරිඳු' ගායනා කරමින්...

ඡායාරූප: වින්සන්ට් කුරුඹාපිටිය

එවකට ශ්‍රී ලංකා මහජන පක්ෂය
නියෝජනය කරමින්
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග
වෙල්ලස්සේ ගොවි ජන රැළියක් අමතයි.

දරිද්‍රතාවයෙන් පෙළෙන ගොවීන් මුල් වකවානුවේ දී ජලබදු නොගෙවා සිටියේ බැරිකමට ය. බොහෝ විට මහා වාරිමාර්ග ක්‍රම යටතේ වුව, කන්න දෙකක් වගා කරගැනීමට තරම් සෑහෙන ජල ප්‍රමාණයක් ඔවුන්ට නොලැබුණු අවස්ථා ද එමට ය. එහෙත් ජලබදු ගෙවිය යුතු ම විය. 1985 වන විට ජලබදු නොගෙවූ ගොවීන්ට විරුද්ධ නඩු පැවරූ අතර මෙම නඩු සඳහා ගොවියන් වෙත සිතාසි ලැබීම ද ආරම්භ වී තිබුණි. මේ අවස්ථාව වන විට, මේ ප්‍රශ්නය පිළිබඳව රට පුරා නොයෙකුත් ගොවි සංවිධාන එකමුතු වී, ලංකාවේ මහා වාරිමාර්ග සහිත ජනපද ව්‍යාපාරවල මේ අසාධාරණ බදු ක්‍රමය සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීමේ කටයුතුවල නිරත වෙමින් සිටියේ ය.

ජලාශ ආශ්‍රිතව මහා වාරිමාර්ග යටතේ ගොවි ව්‍යාපාර ඇති අනුරාධපුරය, පොලොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට, මොනරාගල, මහනුවර යන දිස්ත්‍රික්ක සෑම එකකම පාහේ ගොවි සංවිධාන ක්‍රියාත්මක වෙයි. රත්නපුර අම්පාර සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්හි එවැනි ගොවි සංවිධාන බිහිවෙමින් තිබේ. 1984 අගෝස්තු 14 දින මුල් ම ජලබදු විරෝධී ප්‍රසිද්ධ රැලිය පැවැත්වුනේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ය. 1984 ඔක්තෝබර් 8 වන දින සහ 1985 පෙබරවාරි 23 වන දින කුරුණෑගල, හිරියාල ප්‍රදේශයේ කෙරුනු උද්ඝෝෂණයක් හේතුවෙන් මෙම විරෝධය රට පුරා ප්‍රසිද්ධියක් ලැබුවේ ය. හම්බන්තොට සහ ඇඹිලිපිටිය ප්‍රදේශවල ප්‍රාථමික උසාවි කීපයක ද මොනරාගල, මහව, අනුරාධපුරය, පොලොන්නරුව සහ කුරුණෑගල ආදී මහේස්ත්‍රාත් උසාවි ගණනාවක ද ජලබදු නොගෙවූ ගොවීන්ට නඩු පවරන ලදී.

නඩු පැවරුවේ ගොවීන් කීපදෙනෙකුට වුවත්, මෙය පොදු ප්‍රශ්නයක් ලෙස සලකා නඩු දිනයන්හි ගොවීහු දහස් ගණනින් උසාවි භූමිවලට රැස්වූහ.

මුල් කාලයේ, විරෝධතා ව්‍යාපාරය තුළ ගෙවිලියන්ගේ සහභාගිත්වය එතරම් ම සාර්ථකව පෙනෙන්නට තිබුණේ නැත. ඒ අඩුපාඩුව සම්බන්ධයෙන් ගොවි සංවිධානවල විශේෂ අවධානයක් යොමු වූයේ ද නැත. එහෙත් කුරුණෑගල, හම්බන්තොට සහ මොනරාගල ප්‍රදේශවල ප්‍රගතිශීලී කාන්තා පෙරමුණත් හම්බන්තොට රුහුණු ගැමි කාන්තා සංවිධානයත් මොනරාගල ඔක්කම්පිටියේ, ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානයේ කාන්තා අංශයත් මේ පිළිබඳව ගම් මට්ටමින් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කරමින් දිගින් දිගටම පුළුල් ගොවි සංවිධාන සමග මෙම අරගලයට ගෙවිලියන් සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සංවාදයක යෙදුනහ. ඒ සඳහා ක්‍රියාකාරී වූහ.

කුරුණෑගල, සියඹලංගමුවේ පැවැත්වීමට නියමිතව තිබූ ජලබදු විරෝධය පිළිබඳව පුළුල් සම්මන්ත්‍රණයට පෙර දින එහි ගිය ප්‍රගතිශීලී කාන්තා පෙරමුණේ ක්‍රියාකාරිකයෝ, ගම්වල ගෙයින් ගෙට ඇවිදිමින් මේ පිළිබඳව කතා කළහ. එක් ගෙවිලියක් කියා සිටියේ *"අපට ගොවිතැන් කරන්න තරම් වතුර ලැබෙන්නේ නෑ. එක කන්නයකට විතරයි වතුර ලැබෙන්නේ. හුඟක් වෙලාවට ගොවිතැන් පාළු වෙනවා. ලැබෙන වී ටිකෙන් අවුරුද්දක් තියා මාස දෙකක්වත් කන්න බෑ. අපි ජීවත් වෙන්නෙ කුලීවැඩ කරලා, ජලබදු ගෙවන්න තියා ජීවත් වෙන්නවත් විදිහක් නෑ"* යනුවෙනි. මෙම අදහස් දෙස බලන විට මේ ප්‍රශ්නය ගෙවිලියන්ට බලපෑවේ නැතැයි කිසිසේත් කිව නොහැකි ය. දිළිඳුකම සහ දහසක් කම්කටොලු මැද්දේ තම පවුලට එදිනෙදා අහාරවේල සරිකර දෙන්නට ඇය කරන්නා වූ දෛනික අරගලයට මේ ජලබද්ද තවත් දැරිය නොහැකි වූ බරක් විය. එහෙත්, *"මම ආවේ නැතුවට කමක් නෑ නෙ. අපේ ළමයින්ගේ තාත්තා එයි"* යනුවෙන් මුලදී ප්‍රකාශ කළ ගෙවිලියන් වෙත කරුණු පැහැදිලි කිරීමෙන් පසුව ඔවුහු ද ක්‍රියාකාරීව උද්ඝෝෂණ ව්‍යාපාරයට සම්බන්ධ වීමට පටන් ගත්හ. සියඹලංගමුවේ ගොවි-ගෙවිලියන් හත් දෙනෙකුට ජලබදු නොගෙවීමට එරෙහිව මහව උසාවියේ නඩුව විභාග කළ දිනයේ එහි රැස් වූ 200 ක් පමණ දෙනා අතර ස්ත්‍රීහු කැපී පෙනුනහ. මුලදී තම කන-කර හෝ උගස්කොට ජලබදු ගෙවා දමා තම සැමියන් සිරගෙට යෑම වැළැක්වීමට කල්පනා කළ ස්ත්‍රීන් වෙත නොකඩවා ලැබූ පුබුදුවාලීම් නිසාම තමන් සිරගෙට නියම වුවත් ජලබදු ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට තරම් මෙම ගොවි ස්ත්‍රීන් සටන්කාමී විය.

ගෙවිලියන් පිරිසක් සමග සාකච්ඡාවක යෙදෙන ප්‍රගතිශීලී කාන්තා පෙරමුණේ ක්‍රියාකාරීන් - වයලා, රම්‍යා කුමාරි සහ නාලනී යන සහෝදරියෝ මෙහි වෙති.



ජලබදු අරගලය

සහ

ගෙවිලියෝ

● **ජල බදු කියන්නේ මොකද්ද?**

මහා වාරිමාර්ග වලින් ජලය ලබන ගොවියන්ගෙන් මෙහෙයුම් හා පවත්වන් ගැසුමු හැටියට අක්කරයකට රු: 100 ක මුදලක් අය කිරීමට ආණ්ඩුව තීරණය කරල තියනවා. මුලදී අක්කරයකට රු: 100 ක් වන මෙම බදු වසරින් වසරකට 20% බැගින් අක්කරයකට රු: 200 දක්වා ඉහළ නඟිනවා.

● **ජලබදු, කාගේ උවමනාවද?**

ජල බදු තීන්දුව අහසින් පාල වූ දෙයක් නොවේ. මේ විදිහට අපේ උදවන් ගොවීන්ගේ ජලබදුක් අය කරනන්න කියල ආණ්ඩුවට උපදෙස් දෙන්නෙ ලෝක බැංකුවයි, ලෝක බැංකුව කවුසුමු කරන්නේ අපේ වමේ රටවල් සංකල්ප කළ විශේෂිය ධනපති සමාජවල වාසියටයි.

හාල් පොත් කපා දාන්න උපදෙස් දුන්නෙ, දුන් තියා ආහාර මුද්‍රිත විකක් කපා දාන්න, අධ්‍යාපන, සෞඛ්‍ය මහජනකම් කන්න්න උපදෙස් දෙන්නෙ මේ වගේ ආයතන තමයි. රටේ වැඩි දෙනෙක් උස්සන් කලා කෙල්ලොකුන් ටික දොහොක් එන්න එකතුවෙලා මුල ප්‍රතාවේ ප්‍රධානත්වා තමයි උන්ට ඕනෑ.

● **ජල බදුවල අප විරුද්ධ වීය යුත්තේ ඇයි?**

අප මෙයට විරුද්ධ වියයුතු රක් හේතුවක් තමි ජලබදු වෙන්න්න අපට බැලිකමයි. මහා වාරිමාර්ග යටතේ වූකක් අවුරුද්දකට දොළන්න්න ඇති කරමින් වතුර ලැබෙන්නෙ නෑ. වැස්සෙ කැන්න්න වගා පාලු වෙනවා.

ඒ විතරක්ද? තෙල් පොහොර වල මිල අද කීයද? ලුක්වර් ගෑස්තු කියද? පොහොස ගොයාධාර තිලුණ. ඒකත් කලල දුමිරා. ඒ වියදම් ඔක්කොම ගියාම අන්තුන් පාලුයි. වැඩි දෙනෙක් කුලුලු කරන්නෙ ණය වෙලා. කම්කෙරි ප්‍රදාලාලා ණය වෙලල අවර වූනාම ඉතුරු වෙන්නෙ ඇඟිලි මිල්ල විතරයි. ජල බදු ගෙවන්න නම්කුඩුර උගත් කරන්න ඕනෙ. මේ තියාම ගොවියා ස-විධානය වෙලා බදු නොගෙවෙ ඉඳියම ආණ්ඩුව ගොවින්ව බදු දුන්න පවන් කන්නා. පසුගිය කාලය ඇතුලත අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, මොනරාගල, හම්බන්තොට සහ කන්කසන්තුර යන දිස්ත්‍රික්කවල ගොවි ගෙවිලියන් විශාල පිරිසකට නඩු දමමා.

ගෙවිලියන්ගේ කාර්යය ඉල්ලීම වලට ආණ්ඩුව කවදාත්ම කතාවිල නැහැ, එහෙත් ලෝක බැංකුව වගේ ආයතන කීවම උස්සන් ගොවීන්ගෙන් බදු ගන්න කියල ඒව නොගෙන් ආකාරයෙන් ක්‍රියාත්මක කරනවා. ජලබද්දට විරුද්ධ වීමත් නොවෙ අයි විරුද්ධ වන්න ඕනෙ. ජල බද්ද කියන්නෙ උස්සන් අපි තවත් දාන පන් කිරීමේ තවත් පියවරක් විතරයි. අපේ රටේ ජන ගහනයෙන් 70% ම වඩා ප්‍රමාණය ග්‍රාමීය ඉඩම් කැල්ලක වගා කරන පුර ගොවියන්. මෙම අත්‍යාධාරණකම වලින් වැදගත්ම බැවකත පුර ගොවියන් තත්ත්වය අනාථත් ජනතු වැටෙමින් තියනවා. දරුවා උස්සෝදපුට යවන්න, උන්ට පෝෂයයි කෑම වෙලත් දෙන්න විදියක්නෑ. ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ගේ මෙන්ද පෝෂණය වෙලයෙන් බුද්ධිවෙලා තියනවා කියල ආණ්ඩුවත් පිළිගන්නවා. තමන්ගේ ඉඩම වත නරන්න බැරිවෙන කොට ඊක විකුණල ගෙවීමා ඒ ඉඩමෙම කුලී කාරයෙක් වෙනවා. ගැහැණුරුවන්ව මැද පෙදේශ වගුල්කමට යන්න වෙනවා. බලාතෙන ගියාම අපේ සැම ධාන්‍යයකටම මුල අඩිව සූරාගන ඔය බදු පනවන අය සහ බදු පනවන්න උපදෙස් දෙන අය පමා.

මේ සියලු අත්‍යාධාරණ කම සැලසුම් කරල අප එක පවවා ඒව, අපේ ජීවිත වලදුරෙන්, අපේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් අපි මේ අත්‍යාධාරණකම වලට පොරබදා නැති ජීවිතන්න ඕනෑ. අපි අද ජල බද්දට විරුද්ධ වෙනවා කියන්නා මේ අත්‍යාධාරණ කම සියල්ලටම එරෙහිව නැති ජීවිතේ මුල්පියවයි.

● **ජලබදු අරගලය තුළ ගෙවිලියන්ගේ වැඩ කොටස කුමක් ද?**

අපි දන්නවා මේ රටේ ජනගහනයෙන් හරි අඩක් වගේම ගොවි ජනතාවගෙනුත් හරි අඩක් ඉන්නෙ ගැහැණු වර්ග. ගොවි ජනතාව මුණ දෙන මේවැනි ප්‍රශ්න ගෙවිලියන්ගේත් ප්‍රශ්න නෙවේ? කුලුලු කොටන ද ඉදලම කුලුලරේ ගේනේ වගේම ගෙදර දොර කටයුතු වලදීත් වැඩි වගකීම සම්මානයක් ඉටු කරන ගෙවිලියන් මේ ප්‍රශ්නයේ කොටස් කාරියන්. ගොවි ජනතාව මුණ දෙන මේ වගේ අරගලයකදී ගෙවිලියන් අනිවාර්යයි වෙනව කියන්නේ අපිට තියෙන එකපුතුකමේ ගෙන්නියෝ හරියටම බාගයක් අයියම්ම හෙමදැ? මේ රටේ උස් විදින මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතුන්න කාන්තාවන්ව අයිතියකුත් ගන්නියකුත් තියනවා. කාන්තාවන්ද මේ උස් හැඟුම් විදින්න නියා. අපේ රටේ වගේම ලෝකය පුරාමත් කාන්තාවන් අරගල වල පෙරමුණේ ඉඳල තියනවා.

වයසක ගොවි පියවරුන්ව වාගෙම ගොවි වීදුරුන්ටත් නඩු දාල තියනවා. තමන්ගේ කණකට හරි උදාර තියල ජල බද්ද ගෙවන්න අවමල තීරණය කරනවා හරි ඒක හරියි? මේ හැන දානගෙන ස-විධානය වෙලා ඉඳියොත්. ජලබදු ගෙවන්න වෙන්නෙ නෑ. පුරුසයා අරගලයේ කොයි තරම පෙරමුණේ සිටියත් තිරිත්දල පුරවන් ඔහු අක්‍රියකාරී කරන්න. අපේ ගෙවිලියන් දකුවන් වෙලා ස-විධානය වෙලා ඉන්නවා නම් ඒ වගේ ප්‍රශ්න ඇති වෙන්නෙ නැහැ. මේ රටේ ඕනෑම අරගලයකදී ජනතාවගෙන් හරි අඩක්ම ඉන්න කාන්තාවන්ගේ නිර්මාණශීලී සහභාගිත්වය අනිවාර්යමෙන් දෙයක්. පිරිමින් හා සමානව අපද මේ අරගලයේ පෙරමුණ ගත යුතුයි.

ආදරණීය මව්වරුණි, සහෝදරියන්,

ඊට්සයේ දහසක් ගැහැණු විද දරා ගන්නා ඕනෑ ශක්තිය හා ධෛර්යේ මේ අරගලය පෙරට ගෙන යාමට අවශ්‍යයි. අත්‍යාධාරණ ජල බිඳද ගෙවන්න එපා! ජල බදු උද්ගෝෂණයේ සැම කටයුත්තකදීම ඕනෑ ක්‍රියාකාරී සහභාගීත්වය වගේ ලබා දෙන්න. ජල බදු අරගලය ජයග්‍රහණය දක්වා ඉදිරියට ගෙන යාමටත්, මේ රියක අත්‍යාධාරණකම් ජය ගැනීමටත්, ඔබේ ශක්තිය එකයේ කරන්න. අරගලයේ සැම අවස්ථා වකදීම රියකම අභිමානයෙන් ධෛර්යයෙන් ඕනෑ දෙමින් ඔබව ධෛර්ය හා ශක්තිය සපයමින් අපි එම සටනේ නොසැලෙන කොටස් කරුවෝ වෙමු.

ප්‍රගතිශීලී කාන්තා පෙරමුණ

මොනරාගල උසාවියේදී ගෙවිලියන් දෙදෙනෙකු ඇතුළු ගොවි පිරිසකට විරුද්ධව පවරා තිබූ නඩුව විභාග කළ දිනයේ ඔක්කම්පිටිය එක්සත් ගොවි සංවිධානයේ මෙහෙයවීම යටතේ, ගොවි-ගෙවිලියෝ 1000ක් පමණ නගරයට පැමිණ උසාවියේ සිට බස් නැවතුම් පොළ දක්වා පෙළපාලියකින් ගමන් කළහ. 1986 සැප්තැම්බර් මාසය වන විටත් අනුරාධපුරය, පොලොන්නරුව ආදී උසාවිවල මෙවැනි නඩු ඇසෙමින් තිබේ. ඒවා බොහොමයක් කල් යයි. එහෙත් නීතිඥ මතය ද වී ඇත්තේ, මේ ප්‍රශ්නය සම්බන්ධය උසාවියෙන් ගොවීන් නිදහස් කිරීම පිළිබඳව විශ්වාසයක් තැබිය නොහැකි බවයි. වාරිමාර්ග ආඥා පනතේ සුළු වෙනස්කම් කිරීමට හෝ ගාමිණී දිසානායක ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි වෙනම ම ජලබදු උසාවි ක්‍රමයක් ඇති කිරීමට හෝ රජයට පූර්ණ බලතල තිබෙයි. මේ අභියෝගය හමුවේ දිගින් දිගටම ජලබදු විරෝධී ව්‍යාපාරය පුළුල් කිරීමෙන් පමණක් ම මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබගත හැකි බව පැහැදිලි ය.

මේ සඳහා ස්ත්‍රීන්ගේ දායකත්වයේ වටිනාකම පිළිබඳව ද ගොවි සංවිධාන ඇතුළු සියලු දෙනා අවබෝධයෙන් සිටිති. සමස්ත ලංකා ගොවි සම්මේලනය දකින පරිදි *"සුපුරුදු ලෙස ගොවි ස්ත්‍රීන් ගෙයි මුල්ලට සිර කිරීමෙන් ජලබදු සටනට විශාල විලංගුවක් වැටෙන බවත් අවසානයේ දී, පුරුෂයින්ට සිර දඬුවම් විඳින්නට සිදුවුවහොත් වඩාත් අසරණ වන්නේ බිරින්දෑවරුන් බැවින් ජලබදු ගෙවන ලෙසට සිය පුරුෂයින් වෙත මෙම ස්ත්‍රීන්ගෙන් බලපෑම් ඇති විය හැකි බවත් පෙනුණි."* ස්ත්‍රීන් පෙරට ගැනීම පිළිබඳව සහ ඔවුන් අරගලයට සහභාගි කරවා ගැනීම පිළිබඳව මුලදී උනන්දුවක් නොදැක්වුවත් ගොවි සංවිධාන, ස්ත්‍රී සංවිධාන කිහිපයක මැදිහත්වීම තුළින් තරමක් හෝ මේ අඩුව මඟහරවා ගැනීමට ක්‍රියා කරමින් සිටී.

ප්‍රගතිශීලී කාන්තා පෙරමුණ මේ දෙස බලන්නේ මේ ආකාරයටයි : *"අපි දන්නවා මේ රටේ ජනගහනයෙන් හරි අඩක් වගේම, ගොවි ජනතාවගෙනුත්, හරිඅඩක් ම ඉන්නේ ගැහැණු බව. ගොවි ජනතාව මුහුණ දෙන මෙවැනි ප්‍රශ්න ගෙවිලියන්ගේත් ප්‍රශ්න නේද? කුඹුරු කොටන දා ඉඳලම කුඹුරේ හේනේ වගේම ගෙදර දොර කටයුතුවලදීත් වැඩි වගකීම සම්භාරයක් ඉටු කරන ගෙවිලියන් මේ ප්‍රශ්නයේ කොටස්කාරියන්. ගොවි ජනතාව මුහුණ දෙන මෙවැනි අරගලයකදී ගෙවිලියන් අක්‍රියාකාරී වෙනව කියන්නේ අපිට තියෙන එකමුතුකමේ ශක්තියෙන් හරියටම බාගයක් ම ඉවත්වීම නොවේද? මේ රටේ ඕනෑම අරගලයකදී ජනගහනයෙන් හරි අඩක්ම වන ස්ත්‍රීන්ගේ නිර්මාණශීලී සහභාගිත්වය අත්‍යාවශ්‍ය දෙයක්. පිරිමින් හා සමානව අප ද මේ අරගලයේ පෙරමුණ ගත ගත යුතුය."*

වැඩවර්ජනය කළ පොලිටෙක්ස් කම්කරු ස්ත්‍රීන්

පොලිටෙක්ස් වැඩවර්ජනය

1977 න් පසුව නව රජයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියෙන් වාසි ලබාගෙන උතුරු කොළඹ පිහිටි ඒකල කාර්මික භූමියේ පිහිට වූ එක් ඇඟළුම් කර්මාන්ත ශාලාවකි පොලිටෙක්ස් ගාමන්ට්ස් ආයතනය. 1978 අගොස්තු මස 17 දින වන විට වාණිජමය නිෂ්පාදනය ආරම්භ කළ මෙම කම්හලේ අයිතිය හොංකොංහි පදිංචි බ්‍රිතාන්‍ය ජාතිකයෙකුට සහ ලාංකික ධන කුවේරයකු වන සෝලි කැප්ටන් ඇතුළු කිහිප දෙනෙකුට හිමි විය. මුල්කාලයෙ හි මෙහි සේවය කළ 800 දෙනා අතරින් ආධුනිකයෙකු දිනකට වැටුප වශයෙන් රු. 8.60 ක් ලැබූ අතර පුහුණු යන්ත්‍ර ක්‍රියාකරවන්නෙකු පවා ලැබුවේ රු. 11.74 ක් පමණකි. ශ්‍රම හමුදාවෙන් 95%ක් ස්ත්‍රීහු වූ අතර, ඔවුන්ගෙන් වැඩිදෙනා පිට පළාත්වලින් පැමිණ කම්හල අවට ප්‍රදේශයේ නවාතැන් ගෙන සිටියහ.

ආරම්භයේ දී සිටම මෙම කර්මාන්ත ශාලාවේ සේවා තත්ත්වයන් ඉතාමත් අසතුටුදායක විය. පඩි සහිත නිවාඩු නොවීය. දිවා ආහාර විවේකය විනාඩි 30කට සීමා විය. මුළු සේවක පිරිසටම පාවිච්චිය සඳහා තිබුණේ වැසිකිලි හතරකි. මේ කර්මාන්ත ශාලාව මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් බල

ප්‍රදේශයේ පිහිටි නමුත්, නිදහස් වෙළඳ කලාපයට පිටස්තර විය. එම නිසා, ඒ තත්ත්වයේ අවාසිදායක පාර්ශවය ම පමණක් මෙහි සේවිකාවන්ට බලපෑවේය.

1980 මාර්තු මාසයේ මුල් වරට මෙම කම්හලේ සේවකයින් වැඩ නැවැත්වීමක් කළේ අළුතින් බඳවාගත් සියයක් පමණ වූ පිරිසකට දිනකට රු. 11.00 ක වැටුපක් පොරොන්දු වී තිබූ බව ආරංචි වීමෙනි. මේ අවස්ථාවේ එක් දිනක් පුරා වැඩපළ තුළට වී වැඩ කිරීම ප්‍රතික්ෂේප කළ සේවකයින් මෙල්ල කිරීම සඳහා පාලකයෝ පොලීසිය කැඳවූහ. සංවිධානය වී අයිතීන් සඳහා සටන් කිරීම පිළිබඳව කිසිඳු අත්දැකීමකින් තොර වූ සේවක පිරිසට මේ අවස්ථාවේ දී ඒකල කාර්මික භූමියේ අවට පිහිටි අනිකුත් කර්මාන්ත ශාලාවල වෘත්තීය සමිතිවලින් යම් මඟ පෙන්වීමක් ලැබුණි. එසේ ම මීට මාසයකට පමණ පෙර, පොලිටෙක්ස් කම්හල අසල පිහිටි යුනියන් කාබයිඩ් කම්හලේ සිදු වූ වැඩවර්ජනයෙන් එහි කම්කරු පිරිස ලද ජයග්‍රහණය ද පොලිටෙක්ස් ස්ත්‍රීන්ට මහඟු ආදර්ශයක් විය. පාලකයෝ සේවකයින් එළියට ඇද දමා කම්හල් දොරටු වැසූහ. තව දුරටත් අසංවිධානාත්මකව සිටීමේ අනිසි ඵලවිපාක අවබෝධ කරගත් සේවක පිරිස, ලංකා වෙළඳ සේවක සංගමයට බැඳීමට තීරණය කළහ. මෙසේ වෘත්තීය සමිතිය පිහිටුවා ගනිමින් ප්‍රතිගාමී වූයේ යැයි සැක කළ සේවිකාවන් දහ දෙනෙකු වැඩ තහනමකට ලක්විය. මේ දහ දෙනා නැවත සේවයට ගන්නා තෙක් පොලීසියෙන් පමණක් නොව, ප්‍රදේශයේ බලගතු දේශපාලනඥයින්ගෙන් සහ මැරවරයින්ගෙන් පවා එල්ල වූ තර්ජන නොතකා දින 30 ක් (මාර්තු 28 සිට අප්‍රේල් 28 දක්වා) වැඩවර්ජනය කළ පොලිටෙක්ස් සේවකයෝ ජය අත්පත් කරගෙන ආපසු සේවයට ගියහ. ඒ අවස්ථාවේදී කම්කරුවන් අතර පැවති දැඩි එක්සත් බව සහ අවට කම්හල්වලින් ලැබූ නොමඳ ධෛර්යය සහ සහයෝගය බොහෝදුරට මෙම ජයග්‍රහණයට පාදක විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පැයක දිවා ආහාර විවේකයක්, ප්‍රමාණවත් වැසිකිළි පහසුකම්, වාර්ෂික ප්‍රසාද දීමනා, පඩි සහිත නිවාඩු සහ වැඩි කළ උත්සව අත්තිකාරමත් ලබාගත හැකි විය. වැඩ තහනමට ලක් වූ අයට නැවත රැකියා ලැබුණු අතර අකමැත්තෙන් වුව පාලකයින්ට වෘත්තීය සමිතිය පිළිග ැනීමට ද සිදු විය.

මෙම ජයග්‍රහණයට පසුව වැඩපොළ තුළ වෘත්තීය සමිතිය ගොඩනැඟීමේ කටයුතු කරගෙන ගිය අතර එයට සමගාමීව ජා-ඇල ප්‍රදේශයේ වාසය කළ වෙනත් ස්ත්‍රී ක්‍රියාකාරීන් සහ පොලිටෙක්ස් කම්කරු ස්ත්‍රීන් අතර සුළුවෙන් වුව ස්ත්‍රීන් වශයෙන් ඒකරාශී වීමක් සිදුවිය. පොලිටෙක්ස් වෘත්තීය සමිතියේ නායකත්වය දැරූ ස්ත්‍රීන් කීපදෙනෙකු මෙන්ම ජා-ඇල, ඒකල, බෝපිටිය

ප්‍රදේශයේ වෙනත් කම්කරු ස්ත්‍රීන්, රත්මලාන සහ වෙනත් කොළඹ අවට ප්‍රදේශවලින් පැමිණි ස්ත්‍රීන් කීපදෙනෙකුගේ එකතුවක් නොබෝ කලකින් දැකගත හැකි විය. එය ස්ත්‍රී අධ්‍යයන කවයක් වශයෙන් ඒ යුගයේ පැවතුණි.

1982 මැයි මාසයේ නැවත වරක් පාලකයින් සහ කම්කරුවන් අතර ගැටීමක් ඇති විය. සේවිකාවන් දෙදෙනෙකුගෙන් දිය නොහැකි තරමේ ඵලදායකත්වයක් ඉල්ලා සිටීමත් ඔවුන් දෙදෙනාට එය ඉටු කිරීමට නොහැකි වීමත් හේතුවෙන් පාලකයින් විසින් මෙම සේවිකාවන් දෙදෙනාගේ සහ වෘත්තීය සමිතියේ ශාඛා ලේකම්ගේ වැඩතහනම් කරන ලදී. මේ සිදුවීම හේතුකොටගෙන 1982 මැයි මස 24 වන දින නැවත වරක් පොලිටෙක්ස් ආයතනයේ වැඩවර්ජනයක් ඇති විය. මේ වන විට වෘත්තීය සමිතියේ බලය බිඳීමේ අටියෙන් කම්හලට රිංගවාගත් සුළු පිරිසකගෙන් යුත් ජාතික සේවක සංගමයට අයත් පිරිස ඇතුළු දහසකට අධික මුළු සේවක පිරිස ම මෙම වැඩවැරුමට සහභාගි විය. දින තුනකට පසුව පාලක පක්ෂය විසින් පරීක්ෂණයක් පවත්වා වැඩ තහනමට ලක්වූවන් නැවත සේවයේ පිහිටුවා වර්ජකයින්ට ආපසු සේවයට වාර්තා කරන මෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම වැඩවර්ජනය පොලිටෙක්ස් අරගල ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් සළකුණු කරන්නේ එය ජයග්‍රහණයකින් කෙළවර වූ නිසා පමණක් නොවේ. වැඩපොළ තුළ ඉතාමත් ම ශක්තිමත් අවධියක පසු වූ පොලිටෙක්ස් කම්කරු සමිතිය සහ ලංකා වෙළඳ සේවක සංගමයේ මව් සංවිධානය අතර මෙම වැඩවර්ජනය පදනම් කොටගෙන ඇති වූ මතභේද සහ එම සංගමයෙන් වෙන්වීමට පොලිටෙක්ස් කම්කරුවන් ගත් තීරණය ද තීරණාත්මක එකක් විය. වර්ජනය කැඳවීමට ගත් තීරණය පොලිටෙක්ස් ශාඛා සමිතිය විසින් ගත් එකකි. ඊට මව් සංගමයේ අනුමැතිය ලැබෙන තුරු කම්කරුවන් බලා සිටියේ නැත. වැඩවර්ජනය පිළිබඳව මව් සංගමය දිගටම දැරූ ආකල්පය වූයේ එය එතරම් ප්‍රබල ගැටළුවක් නොවන බවත් පාලකයින් සමග කේවල් කිරීමකින් එය විසඳා ගත හැකි බවත් ය. වැඩවර්ජකයින් ආපසු වැඩට යා යුතු බව ඔවුහු කියා සිටියහ. තම අරගලය පිළිබඳව මව් සංගමය දැක්වූ නොසැලකිල්ල පිළිබඳව කලකිරීමට පත් පොලිටෙක්ස් කම්කරු නායකයෝ, එම සංගමයෙන් වෙන්වී ඒකල ප්‍රදේශයේ ඒ වන විටත් ශක්තිමත් ලෙස පෙනී සිටි කාර්මික ප්‍රවාහන හා පොදු කම්කරු සංගමයට අනුබද්ධ වීමට යෝජනා කළහ. සාමාජිකයින්ගෙන් 90% වඩා පිරිසක්, නායකත්වය ගත් මේ තීරණය අනුමත කළෝය. ලංකා වෙළඳ සේවක සංගමය වනාහී ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ දීප්තිමත් ඉතිහාසයක් ඇති වෘත්තීය සමිතියකි. එහෙත් ඒ නිසාම එය මෑත භාගයේ වඩාත්ම ස්ථාපිත වූ එසේම ව්‍යුහගත වූ

පොලිටෙක්ස් සටනට පොදුජන සහාය - ඒකල ස්ත්‍රී මධ්‍යස්ථානය ඉදිරිපිටදී

වෘත්තීය සමිති ආයතනයක් බවට පත් වී සිටියි. මුල් කාලයේ, පොලිටෙක්ස් කම්කරුවන් සංවිධානය වීම පිළිබඳව කිසිවක් නොදැන සිටි අවධියේ මෙවැනි විශාල ස්ථාපිත සංවිධානයක් සමග සම්බන්ධ වීමේ වාසිදායක තත්ත්වයන් තිබෙන්නට ඇති බව නොඅනුමානය. එහෙත් පසුව පොලිටෙක්ස් කම්කරු පිරිසට දැනුණේ තම අභිප්‍රායයන් සහ ඉල්ලීම දෙවැනි තැනටත් පොදුවේ මව් සංගමයේ අභිප්‍රායයන් මුල් තැනටත් දමමින් ලංකා වෙළඳ සේවක සංගමය තමන් කෙරෙහි ආධිපත්‍ය පතුරුවන බවයි. මේ හේතුවෙන් පොලිටෙක්ස් කම්කරුවෝ ස්වාධිපත්‍ය සොයා ගියහ. ඔවුන් බැඳුණු කාර්මික ප්‍රවාහන හා පොදු කම්කරු සංගමය වනාහී ලංකා වෙළඳ සේවක සංගමයෙන් බිඳී ආ කම්කරු කොටස් සහ ස්වාධීන කම්කරු කණ්ඩායම්වලින් සමන්විත වූ වෘත්තීය සමිතියකි. එය යම් දුරකට ලාංකීය වෘත්තීය සමිති ව්‍යාපාරයේ නව රැල්ලක් නියෝජනය කළ සමිතියකි. එසේම, තරුණ කම්කරු නායකත්වයකින් යුක්ත වූ සමිතියකි. මෙම සම්බන්ධය ඉතා තියුණු ලෙස පොලිටෙක්ස් කම්කරු සමිතිය කෙරෙහි බලපෑවේ ය. එසේම, මේ වන විට පිටස්තර ස්ත්‍රීන් සමග පැවැති සම්බන්ධතාවයන් ද දියුණු වෙමින් පැවතුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1982 අගෝස්තු වන විට පොලිටෙක්ස් කම්කරු ස්ත්‍රීන් කීප දෙනෙකුගේ ද සහභාගිත්වය ඇතිව ලංකා ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරය ස්ථාපිත විය. ප්‍රදේශයේ කම්කරු ස්ත්‍රීන්ගේ සේවා අයිතීන් පිළිබඳව පමණක් නොව, පොදුවේ ස්ත්‍රී ප්‍රශ්න සම්බන්ධයෙන් ද දැනුවත් කිරීම සඳහා නොයෙකුත් වැඩසටහන් මෙහි ක්‍රියාත්මක විය.

මීළඟට පොලිටෙක්ස් කම්හලේ ගැටුමක් ඇති වූයේ 1982 දෙසැම්බර් 11 වෙනි දාය. මෙදින අතිකාල වැඩ කිරීම ප්‍රතික්ෂේප කළ කම්කරුවන් හත් දෙනෙකුගේ වැඩතහනම් කරන ලදී. ප්‍රශ්නය සාකච්ඡා කිරීමට ගත් උත්සාහයන් ව්‍යර්ථ වූයෙන් මෙම ප්‍රශ්නය මත දෙසැම්බර් 13 දා රැස් වූ කම්කරුවෝ වැඩවර්ජනයක යෙදීමට තීරණය කළහ. වැඩවර්ජනයෙහි යෙදුණු සේවිකාවන් තම සටනේ ඉදිරි පියවර පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා දෙසැම්බර් 14 වන දින තම කම්හල අසල වූ විශාඛාවත්තේ පොල් වත්තක රැස්වූයේ, එම ප්‍රදේශයේ මීට පෙරත් ඇති වූ වැඩවර්ජකයින් ගොඩනැඟූ සම්ප්‍රදායකට ගරු කරමිනි. එහෙත් උදේ 7 සිට අවට රැක සිටි පොලීසිය, උදේ 10 ට පමණ අහසට වෙඩි තබමින් කඳුළු ගෑස් ගසමින් කම්කරු ස්ත්‍රීන්ට ඉතා අමානුෂික ලෙස බැටන් පොලුවලින් ද පොල්පිතිවලින් ද පහර දෙමින් ඔවුන් පලවා හැරියේ ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පස් මසක දරු ගැබක් දැරූ එක් ස්ත්‍රියක් ද ඇතුලු දෙදෙනකු බරපතල තුවාල ලැබ රෝහල්ගත කරන ලදී. මෙහිදී තවත් බොහෝ දෙනෙකුට සුළු තුවා සිදුවිය. මෙම සිදුවීම මධ්‍යයේ මව් සංගමයේ ලේකම් සහ විධායක කාරක සභිකයෙකු ද පොලිටෙක්ස් ශාඛා සමිතියේ සභාපති සහ ලේකම් ධූරයන් දැරූ සහෝදරියන් දෙදෙනා ද ජා-ඇල පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. ඔවුහු සිව්දෙනා ගම්පහ මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත්කොට දෙසැම්බර් 20 දා දක්වා රිමාන්ඩ් භාරයේ තබන ලදී.

කම්හල අසල පොල්වත්තකට රැස්වූ වැඩවර්ජනය කළ කම්කරු ස්ත්‍රීන්

පොලිටෙක්ස් සටන මෙහෙය වූ ලීලා පර්ඩිනන්ඩ්ස් සහෝදරිය, 1984 වැඩවර්ජිත සමයේ පැවැති ස්ත්‍රී දින සැමරුමට එක්වෙමින්

වැඩ වර්ජනය කළ කම්කරු ස්ත්‍රීන් අමතන හේමා මාතරගේ සහෝදරිය

මෙය ජාතික මට්ටමින් දැඩි ලෙස උණුසුම් වාතාවරණයක් පැවති කාලයකි. ජනාධිපති මැතිවරණය පැවත්වුණේ 1982 ඔක්තෝබර් මාසයේ දී ය. එදා පැනවුණු හදිසි නීතිය දෙසැම්බරයේ පැවැත්වුණු ජනමත විචාරණයෙන් පසුව මාසයක් ගත වන තුරුත් ඉවත් කළේ නැත. දීර්ඝ සටන් ඉතිහාසයක් හෝ අත්දැකීම් රාශියක් හෝ නොමැතිව පොලිටෙක්ස් සහෝදරියෝ අරගල මාවතට පිවිසියේ මෙවැනි සුවිශේෂ මර්දනකාරී තත්ත්වයක් රට තුළ පැවති අවධියකදී ය. මේ අවස්ථාවේ දී අත් අඩංගුවට ගනු ලැබූ පොලිටෙක්ස් වෘත්තීය සමිතියේ ලේකම් වූ ලීලා පර්ඩිනන්ඩ්ස් සහෝදරිය කියා සිටින පරිදි, *"රටේ හදිසි නීතිය තිබූ මෙවන් වකවානුවක අපට රැස්වීමට පවා අවකාශ නොලැබුනු අතර වර්ජනය කඩා දැමීම සඳහා නොයෙකුත් බලවේගයන් ක්‍රියාත්මක වී තිබිණි. පුරා මාසයක් පැවති අපගේ මෙම වැඩවර්ජනය ස්ත්‍රීන් විසින් කරන ලද්දක් නිසා හදිසි නීතිය, පොලිස් බැටන් ප්‍රහාර, රිමාන්ඩ් කිරීම, මැරවර බලය ආදියට මුහුණ දී සාර්ථක ලෙස අරගලය ඉදිරියට ගෙන යාමට හැකි වීම ඉමහත් ආඩම්බරයකි."*

වර්ෂාවසානය නිසා තම වැටුපෙන් සහ ප්‍රසාද දීමනාවෙන් නව වසරට ආසිරි පැතීමට පෙරුම් පුරමින් සිටි සොහොයුරියන් ඒ පැතුම මියැදෙන විට සසල වූයේ නැත. අභීතව තම සටන ඉදිරියට මෙහෙය වූ ඔවුහු ප්‍රදේශවාසී ජනතාව අතර පමණක් නොව වෙනත් බහුජන සංවිධාන අතර ද තම සටන පිළිබඳව දැනුවත් කිරීමක් ඇති කිරීම සඳහා වෙහෙසුනහ. ප්‍රසිද්ධ රැස්වීම් කීපයක් ම පැවැත්විණි. එසේම, ජා-ඇල වාසීන්ගෙන් අත්සන් පන්දහසකට

වඩා ලබාගෙන මෙම ප්‍රශ්නය වහාම විසඳන ලෙස ඉල්ලා ජනාධිපතිට පෙත්සමක් ඉදිරිපත් කෙරුනි. දිගින් දිගටම මහ කොළඹ ආර්ථික කොමිසමේ මැදිහත් වීමෙන් පාලක කම්කරු දෙපිරිස අතර සාකච්ඡා ඇති වුව ද ප්‍රශ්නය නිරාකරණය කිරීමට කල්ගත විය. ඒ අතර ප්‍රදේශයේ දේශපාලන බලවතුන්ගේ මෙහෙයවීම අනුව ක්‍රියා කළ මැරවරයින්ගෙන් කම්කරු ස්ත්‍රීන්ට නොයෙකුත් පීඩා හිරිහැර විඳින්නට සිදු විය. එක් වරක්, සාකච්ඡාවකට පසුව ජා-ඇල කම්කරු කාර්යාලයෙන් පිටත්ව යන විටෙකදී වෘත්තීය සමිති නියෝජිතයින්ට මැරවරයෝ පිරිසක් පහර දුන්හ. අවසාන වශයෙන් වර්ජකයින්ගේ ඉල්ලීම් වැඩි ප්‍රමාණයක් ලබාදී පාලකයෝ ඔවුන් ආපසු සේවයට කැඳවූහ. මේ සටනින් ලබාගත් විශිෂ්ඨතම ජයග්‍රහණය වූයේ පොලිටෙක්ස් කම්කරුවන්ගේ නීත්‍යානුකූල නියෝජිතයා ලෙස වෘත්තීය සමිතිය පිළිගැනීමටත් සංගම් ශාඛාවේ සාමාජිකයින්ගෙන් සාමාජික මුදල් පඩිපතින් කපා කෙලින් ම සංගම් මූලස්ථානයට යැවීමටත් පාලක පක්ෂය එකඟ වීමයි. 1983 පෙබරවාරි මාසයේ සිට දිනකට රු. 22.00 දක්වා වැටුප් වැඩි කිරීමක් සිදු කරන පොරොන්දුවක් ඇතිව 1983 ජනවාරි 13 දා පොලිටෙක්ස් කම්කරු සේවිකාවෝ නැවත සේවයට වාර්තා කළහ.

මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කළ යුතු කරුණක් නම්, 1982 දෙසැම්බරයේ සිට, පොලිටෙක්ස් වැඩවර්ජනයට සහාය දීම සඳහා පුළුල් ලෙස ස්වාධීන ස්ත්‍රීන් සහ කුඩා ස්ත්‍රී සංවිධාන කීපයකින් යුතු සබඳතා ජාලයක් ගොඩනැගුනු බවය. පසු කාලයක කාන්තා ක්‍රියාකාරී කමිටුව දක්වා පුළුල් වූයේ මෙම මූලික සන්ධානයයි. ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරය සමග බිහිවුනු ජා-ඇල ස්ත්‍රී මධ්‍යස්ථානය මේ අවධියේ වර්ජකයින්ට ක්ෂේම භූමියක් මෙන් විය. ස්ත්‍රී මධ්‍යස්ථානය දිගින් දිගටම පොලිටෙක්ස් අරගලය සමග බද්ධ වෙමින්, පොලිටෙක්ස් වෘත්තීය සමිතියට විශාල ශක්තියක් ගෙන දුන් ආයතනයක් බවට පත්වී ඇත. තවත් සුවිශේෂී සිදුවීමක් වූයේ, පොලිටෙක්ස් ස්ත්‍රීන්ගේ ජයග්‍රහණය සමරනු පිණිස ගායිකා නන්දා මාලිනියගේ 'සත්‍යයේ ගීතය' ප්‍රසංගයක් වැල්ලවත්තේ රාමක්‍රිෂ්ණා ශාලාවේ පැවැත්වීම ය.

1983 පෙබරවාරි මාසයේ සේවකයින් නැවත වැඩට ගත්විට දුන් පොරොන්දු අතරින් එකක් වූයේ විශේෂ ඵලදායිතා දීමනාවක් ලෙස රු. 100.00 ක් ගෙවීමයි. එහෙත් 1983 නොවැම්බර් මාසය වන විටත් මෙය ගෙවා නොතිබුණි. මේ පිළිබඳව වෘත්තීය සමිති නියෝජිතයින් සහ පාලකයින් අතර සාකච්ඡා පැවැත්වෙන සමයේදී, 'අඩු නිෂ්පාදනය' හේතුවක් ලෙස දක්වමින් සේවිකාවන් හත් දෙනෙකුගේ වැඩ තහනම් කෙරුනි. මෙය මුල්කොට ගෙන 1984පෙබරවාරි මස 17 වැනි දා නැවතත් පොලිටෙක්ස් වෘත්තීය සමිතිය වැඩවර්ජනයක් ආරම්භ කළේය.

මෙවර වැඩවර්ජනය 1984 ජුනි 18 දා දක්වා, මාස හතරක් පුරා පැවතුනි. මුලදී දැඩි ධෛර්යයකින් යුතුව ස්ත්‍රීන් 1300 ක් වැඩවර්ජනය ආරම්භ කළ ද දින, සති, මාස ගෙවී යත්ම උග්‍ර ආර්ථික අර්බුදයන්ට මුහුණ දීමට සාමාජිකාවන්ට මෙන්ම වෘත්තීය සමිතියට ද සිදු විය. ජා-ඇල පොලීසියෙන් සිදු කෙරුනු හිරිහැර, මර්දනයන්ට ද සීමාවක් නැති විය. වැඩවර්ජකයින්ට, විශේෂයෙන් සමිති නායකයින්ට, පහර දීම්, බැන වැදීම් සහ අත් අඩංගුවට ගැනීම් විඳින්නට සිදු වූ වාර ගණන අප්‍රමාණ ය. ප්‍රදේශවාසීන් ගේ සුහදතාවය සහ සහයෝගය සමිතියටත් කම්කරු ස්ත්‍රීන්ටත් ලැබුණ ද උදාහරණයක් ලෙස, නිතර නිතර වැඩවර්ජනවල යෙදීම නිසා මොවුන්ට කාමර කුලිය දීමට අපහසු වේ යැයි සැක පහල කළ ගෙවල්හිමියෝ පොලිටෙක්ස් ස්ත්‍රීන්ට නවාතැන් සැපයීමට මැලිකමක් දැක්වීම වැනි ප්‍රතිචාර ලද අවස්ථා ද නැතුවා නොවේ. සමිතිය දිගින් දිගටම සිය සාමාජිකයින්ට සුළුවෙන් හෝ දවල් ආහාර වේල සැපයීමට උත්සාහ කළා පමණක් නොව, ඒ දුෂ්කර සමයේ සිංහල සහ හින්දු අවුරුදු කාලය ද එළැඹි හෙයින් ඒ සඳහා ද සියලු සාමාජිකයින්ට රු. 100.00 ක දීමනාවක් ලබා දීමට ද පියවර ගත්තේ ය.

පොලිටෙක්ස් ජය සමරන 1983 මාර්තු 8 ස්ත්‍රී දින සැමරුම විහාර මහා දේවී උද්‍යානය අසල - ස්ත්‍රී කම්කරුවන්ට මග පෙන්වූ ඒකල ස්ත්‍රී මධ්‍යස්ථානයේ කුමුදුනී සැමුවෙල් සහ ස්ත්‍රී ක්‍රියාකාරිනී සුනිලා අබේසේකර සහෝදරියෝ මෙහි වෙති.

දුෂ්කරතා මධ්‍යයේ වුව කම්කරුවෝ බහුතරය නොසැලී සිටියහ. අවසානය දක්වාම වැඩවර්ජනය කළ මුල් පිරිස වූ 1318 දෙනාගෙන් ආපසු වැඩට ගොස් සිටියේ 280 ක් පමණි. මේ අතර පාලක පක්ෂය තම නිෂ්පාදන නොකඩවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගත්තේ ය. වර්ජනය අවස්ථාවේ දී ආයතනයට අලුතින් සේවකයින් 500 දෙනෙකු පමණ බඳවා ගන්නා ලදී. මොවුන්ගෙන් වැඩිදෙනා පළාතේ මන්ත්‍රී හරහා බඳවාගත් අය වූ නිසා, ඔවුන්ගේ පක්ෂපාතීත්වය පාලකයින්ට සහතික විය. තවද, අමතර නිෂ්පාදන වැඩකොටස් පොලිටෙක්ස් ආයතනය විසින් කොළඹ අවට පිහිටි වෙනත් ඇඟලුම් කර්මාන්ත ශාලාවලට බාරදෙන ලදී. වෘත්තීය සමිතිය කියන පරිදි, රත්මලානේ මයුරා ගාමන්ට්ස් ආයතනය සහ කැළණියේ දාස කර්මාන්ත ආයතනය මෙසේ ඇනවුම් බාරගත් ආයතන දෙකකි. ප්‍රශ්නය විසඳීමට පාලක පක්ෂය ඇත්ත වශයෙන් ම දැක්වූයේ අඩු උනන්දුවක් වුවත් වැඩවර්ජනය කැඩීමට ගත් සියලු පියවර ව්‍යර්ථ වූවාට පසුව, සහ ප්‍රදේශයේ මන්ත්‍රී වන වැඩ බලන කම්කරු ඇමතිගේ මැදිහත් වීමෙන් ද අනතුරුව, ජුනි 18 දා වැඩ තහනමට ලක්වූ පිරිස ඇතුළු සියලුම වැඩවර්ජකයින් ආපසු සේවයකට කැඳවන ලදී. මාස හතරක දීර්ඝ අරගලයකින් පසුව වෘත්තීය සමිතිය ද ආපසු වැඩට යාමට තීරණය කළාය. 'පොලිටෙක්ස් කම්කරු හඬ' කියූ පරිදි, ප්‍රධානකොට අපේ එක්සත්කම නිසා අසරණ වූ පාලකයින්ට අවසානයේ වෘත්තීය සමිතිය සමග සාකච්ඡාකොට, අපට නොදී සිටි පඩි වැඩිවීම්, හිඟ මුදල් සමග දීමට සිදුවිය; අස් කළ අපේ සහෝදරියන්, ආපසු වැඩට ගැනීමට සිදුවිය; අමතර නිවාඩු තුනක් දීමට සිදුවිය; වෛද්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීමට සිදුවිය; දවසකට රු. 30.00 ක වැටුපෙන් සහතික වන පඩි ක්‍රමයක් ඇති කරන බවට එකඟ වීමට සිදුවිය.

1982 සහ 1984 සාර්ථක වැඩවර්ජන දෙකක් මෙහෙයවීමත් සමගම පොලිටෙක්ස් ආයතනයේ ස්ත්‍රී කම්කරුවනුත් ඔවුන් නියෝජනය කළ වෘත්තීය සමිතියත් මෙරට කම්කරු පංති ඉතිහාසයේ අඳුරු සමයක දීප්තිමක් පරිච්ඡේදයක් ලියා තැබීය. 1984 වර්ජනය මේ දක්වා ලංකාවේ ස්ත්‍රී කම්කරුවන් ගෙන ගිය දිගම වැඩවර්ජනයයි. එසේම, 1980 මහා වැඩවර්ජනය බිඳවැටීමත් සමගම වෘත්තීය සමිති ව්‍යාපාරය, වාමාංශික පක්ෂ සහ පොදුවේ ප්‍රගතිශීලී පිල තුළ දැකගත හැකි වූ අපේක්ෂා භංගත්වයට එය කදිම අභියෝගයක් එල්ල කළාය. පංති ව්‍යාපාරයට සම්බන්ධ වී ඉතා කෙටි කාලයක් ගෙවුන ද මේ සහෝදරියන්ගේ ධෛර්යයට සහ සටන්කාමීත්වයට ප්‍රණාමයක් දක්වමින් සියලුම වෘත්තීය සමිති එකමුතු වී 1984 අප්‍රේල් 26 දින කොළඹ හයිඩ් පිටියේ දී ප්‍රසිද්ධ රැස්වීමක් පැවැත්වීය. ප්‍රාදේශීයව කිරීමට නියමිත වූ රැස්වීම් දෙකක් තහනමට ලක්වීම, වෙනත් බහුජන සහ ස්ත්‍රී සංවිධානවලින් ලද සහාය ද විදේශීය

රටවල් දහසයකින් ලද දිරි ගැන්වීමේ ලිපි සහ ආධාර ද මේ සටනේ ජය සටහන්කොට තැබීමේ දී අමතක කළ යුතු නැත.

1984 වැඩවර්ජනය පොලිටෙක්ස් වෘත්තීය සමිතියේ ඉතිහාසයේ ද සන්ධිස්ථානයක් සලකුණු කරයි. මෙවර, සේවකයින් නැවත වැඩට වාර්තා කළාට පසුව ඇති වූයේ වෙනදාට වෙනස් තත්ත්වයකි. 'හොරිකඩකම්' කළ සේවකයින් සහ වර්ජනය කළ අය අතර දරුණු ගැටුම් ඇති විය. සමාගම විසින් මහ කොළඹ ආර්ථික කොමිසමේ උපදෙස් පිට කර්මාන්තශාලාව තුළ ඒකාබද්ධ උපදේශක සභාවක් පිහිටු වීය. ඉන් කම්කරු පිරිසගේ එකමුතුකමට ප්‍රබල අවාසියක් සිදු වූ අතර පාලකයින් ද වෘත්තීය සමිතියේ බලය බිඳීම සඳහා එයට එරෙහිව දැඩි ලෙස ක්‍රියා කිරීමට තීරණයක් ගෙන සිටි බව ඉතා පැහැදිලි විය.

1984 ජූලි මාසයේ සිටම ප්‍රවාහන හා පොදු කම්කරු සංගමයේ සාමාජිකයින්ගේ සාමාජික මුදල් පඩිපතින් කපාගැනීම නතර කළේය. එසේම, හොංකොං රට සමග ආයතනයේ පැවැති සම්බන්ධකම මත ඒ රටේ යොදා ගන්නා දැඩි පරිපාලන උපක්‍රම මේ කම්හලට ද හඳුන්වාදීමට පියවර ගන්නා ලදී. එම කටයුත්ත අරභයා විදේශීය කළමනාකරුවෙකු ද සේවයට බඳවාගෙන තිබුණි. කම්හල තුළ වැඩමුර දෙකක් ආරම්භ කළ පාලකයෝ දෙවෙනි වැඩමුරය සඳහා අලුතින් බඳවා ගත් 1500 ක් පමණ සේවිකාවන්ගෙන් වැඩි දෙනෙකු යොදා ගත්හ. මේ මාර්ගයෙන් ඒ අය කෙරෙහි වෘත්තීය සමිතියට කළ හැකි වූ බලපෑම මඟහරවා ගන්නට ඔවුහු ප්‍රවේසම් වූහ. කලින් පාලක පක්ෂය විසින් වෘත්තීය සමිතියට ලබාදුන් පහසුකම් එකින් එක අහිමි විය. වෘත්තීය සමිති නායකත්වය නිෂ්ක්‍රීය කිරීම සඳහා නොයෙක් කුට උපක්‍රම යොදා ගත් අතර පාලකයින්ගේ ඇමට සමහර කම්කරුවෝ බිලිවූහ. මේ නිසා කම්කරුවන් අතර දැඩි අසහනකාරී තත්ත්වයක් පැන නැඟුනා පමණක් නොව, විරුද්ධවාදීන් දෙපිරිසක් අතර කම්හල තුළ ගැටීමක් ද ඇති විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1984 ඔක්තොම්බර් මාසයේ දී හය දෙනෙකුගේ වැඩ තහනම් කරන ලදී. මෙයින් පසුව, දිගින් දිගටම 1985 වසර පුරා අත්තනෝමතික ලෙස කම්කරුවන් සේවයෙන් පහකිරීම සිදු විය. වැඩියෙන්ම මේ ක්‍රියාවලියට ගොදුරු වූයේ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් ය. ඒ සමගම ඉතිරි වෘත්තීය සමිති ක්‍රියාකාරිකයෝ එක් අංශයකට මාරු කරනු ලැබූ අතර එම අංශය තුළ තනිකරනු ලැබූහ. එහෙත් අවාසනාවකට මෙන් මෙවර වෘත්තීය සමිතියට මේ අකටයුතුවලට එරෙහිව තීරණාත්මක වූ කිසිඳු පියවරක් ගත නොහැකි විය. කළහැකි වූයේ කම්හල තුළ පැය කීපයක සංකේත වැඩවැරුමක් පමණි. මේවා හුදු සංකේතාත්මක ක්‍රියාවන් වූවා විනා පාලක පක්ෂය කෙරෙහි කිසිඳු බලපෑමක් ඇති කිරීමට අපොහොසත් ඒවා විය.

අද වන විට පොලිටෙක්ස් පාලකයෝ තම බලය තහවුරු කර ගැනීමට උත්සාහ දරමින් සිටිති.

පොලිටෙක්ස් කම්කරු හඬ මුල් කලාපයේ කී පරිදි (වෘත්තීය සමිතිය මෙල්ල කිරීම) තනිවම කළ නොහැකි බව දන්නා පාලකයින් මේ සඳහා දේශපාලන බලධාරීන්ගේ ද පොලීසියේ ද මෙම නීති විරෝධී ක්‍රියාවන් ගැන ක්‍රියා කළ යුතු රජයේ ආයතනවල ද සහයෝගය ලබාගෙන ඇත. පොලිටෙක්ස් හි වහල් කඳවුරේ සැබෑ තත්ත්වයන් වසන් කිරීම සඳහා ආගමික නායකයින් පාවිච්චි කිරීමටත් අවුරුදු උත්සව පැවැත්වීමටත්, සංගීත සංදර්ශන සංවිධානය කිරීමටත් පාලකයින්ට සිදුවී ඇත. එකින් එක නායකයින් ඉවත් කරමින්, කම්කරුවන් අතර අසමගිය පතුරුවමින්, වෘත්තීය සමිතියේ බලය බිඳීමට මෙතෙක් පාලකයින් ගෙන ඇති පියවරයන් බෙහෙවින් සාර්ථක බව අප පිළිගත යුතුව ඇත. එහෙත් කෙටි වුව, මේ තරම් සටන්කාමී ඉතිහාසයක් ඇති වෘත්තීය සමිතියකට මෙම අසාධාරණයන් අද 'ඉවසා' සිටීමට සිදුවී ඇත්තේ ඇයි යන්න අප කාහටත් ප්‍රශ්නයක් විය යුතුය.

එක අතකින් පොලිටෙක්ස් වෘත්තීය සමිතියේ බහුතරයක් සාමාජිකයෝ ස්ත්‍රීහු වෙති. මේ සමිතියේ ඇති සුවිශේෂ ලක්ෂණය ද එයයි. එහෙත් ඒ හේතුව නිසාම, පොදුවේ ස්ත්‍රීන්ගේ තත්ත්වය දැඩි ලෙස පසුගාමී වූ සමාජ පසුතලයක් මත පදනම් වී ප්‍රශ්නය විග්‍රහ කරන විට වෘත්තීය සමිතියේ පැවැත්මට පැනනැඟුනු ඇතැම් බාධක තේරුම්ගත හැකිය. 1982 වර්ජනයෙන් අත්කර ගත් විශිෂ්ඨ ජයග්‍රහණයට පසුව, ක්‍රමානුකූලව වෘත්තීය සමිතියේ ක්‍රියාකාරී සහ තීරණ ගැනීමේ මට්ටමට අලුතින් සහෝදරියන් එකතු කර ගැනීම අපහසු විය. එසේම දිනපතා වැඩ කිරීමට සිදුවීම සහ විවේකය අඩුවීම වැනි හේතුන් නිසා මේ ස්ත්‍රී කම්කරුවන් තම ගැටළු පිළිබඳව දැනුවත් කිරීමට සහ පොදු ලාංකීය පංති ව්‍යාපාරය මෙන්ම ඒ තුළ තම ක්‍රියාකාරිත්වය පිළිබඳව විධිමත් අධ්‍යාපනයක් මොවුන්ට ලබාදීමට දැරූ උත්සාහයන් ද එතරම් සාර්ථක වූයේ නැත. සමාජීය සහ සංස්කෘතික බලපෑම්වලට, තම පවුල්වලින් සහ වටපිටාවෙන් කෙරුනු බලකිරීම්වලට මේ ස්ත්‍රීන් ගොදුරු වූ ආකාරයන් ද නොකිවමනා ය.

කාර්මික, ප්‍රවාහන හා පොදු කම්කරු සංගමයට ප්‍රතිපක්ෂව පාලක පක්ෂයේ අනුග්‍රහය ඇතිව ගොඩනැගුණු ඒකාබද්ධ උපදේශක සභාව, කම්කරුවන් භේදභින්න කිරීමට විශාල වැඩ කොටසක් ඉටු කළාය. එම සභාවේ සභාපති වූයේ කම්කරු සාමාන්‍යාධිකාරීවරයායි. දැඩි නීති රීති, විනය රෙගුලාසි පනවමින් කම්හල තුළ සැබැවින් ම වහල් කඳවුරක තත්ත්වයක් ඇති කරන ලදී. මේ සෑම පියවරකට ම මහ කොළඹ ආර්ථික කොමිසමේ ද නොමඳ

සහයෝගය ලැබුනි. පොලිටෙක්ස් ස්ත්‍රීන් ආදර්ශයට ගෙන ඒකල සහ සමහර විට කටුනායක පවා කාර්මික ජනපද තුළ කම්කරු අරගල හටගනී යන සාධාරණ බිය විසින් ඔවුන් මෙහෙයවූවාට සැක නැත. ඒ අතර මෙම ලිපියේ, අප විශේෂයෙන් ම අවධාරණය කළ යුතුව තිබෙන්නේ මේ දක්වා යම් අඩු සැලකිල්ලකට ලක් වූ එහෙත් එවැනි ප්‍රශ්නවලදී තීරණාත්මක වන සාධක දෙකක් පිළිබඳව ය.

ඉන් එකක් නම්, මහ කොළඹ ආර්ථික කොමිසමේ බල ප්‍රදේශයට අයත් ජා-ඇල සහ ඒකල කාර්මික ජනපදයේ මෙන්ම කටුනායක අපනයන ප්‍රවර්ධන කලාපයේ පමණක් නොව, රත්මලාන කාර්මික ප්‍රදේශයේත් ඇඟලුම් කර්මාන්ත ශාලාවල ශ්‍රමික පිරිසකගේ සුවිශේෂතාවයයි. මොවුන්ගෙන් බහුතරය තරුණ ස්ත්‍රීහු වෙති. ඔවුන් වැඩි වශයෙන් අවිවාහකය. 10 වන ශ්‍රේණිය දක්වා බොහෝ අය විධිමත් අධ්‍යාපනයක් ලබා ඇත. මොවුන් වැඩිදෙනා ජීවත් වන්නේ තම පවුල්වලින් ඈත්ව, නේවාසිකාගාරවල ය. බොහෝ දෙනාට මෙය තම ප්‍රථම රැකියාව වන අතර ග්‍රාමීය සුළු ධනේශ්වර පවුල්වලින් එන වැඩිදෙනෙක් තම පවුලේ නඩත්තුව සඳහා තම වැටුපෙන් යම් කොටසක් - සමහර විට වැඩි කොටස වෙන් කරයි. ඔවුන් ඇත්ත වශයෙන්ම කම්කරුවන් ලෙස තමන් හඳුන්වනවාට පවා අකමැති ය. කර්මාන්ත ශාලාවක සේවය කිරීම පිළිබඳව හෝ වෘත්තීය අයිතීන් පිළිබඳව හෝ කම්කරු පංති ව්‍යාපාර සහ සටන් පිළිබඳව හෝ කිසිවක් නොදන්නා මොවුහු දැඩි ආර්ථික අවශ්‍යතාවයන් නිසා තම රැකියාවට බැඳී සිටිති. එසේම, ඔවුන් වැඩිදෙනෙක් ඇඟලුම් කර්මාන්තයෙහි යෙදී සිටින්නේ එය තම ජීවන - වෘත්තීය ලෙස සලකාගෙන නොවේ. සමහරෙකුට රැකියාව වනාහී විවාහ වීමට මුදල් ප්‍රමාණයක් ඉතිරි කිරීම සඳහා ප්‍රයෝජනවත් වූවකි. මේ නිසාම ඔවුන් සංවිධානය කිරීම අතිශයින් දුෂ්කරය. තවද, ඔවුන් සංවිධානය කිරීම සඳහා විශේෂ විධික්‍රමයන් භාවිතා කළ යුතු ද වේ.



පොලිටෙක්ස් ජයග්‍රහණයෙන් පසුව සහාය දුන් ජනතාවට ස්තුති කිරීමට ඔවුහු අමතක නොකළහ.

බහුජාතික සමාගම් විසින් සංවර්ධනය වන රටවල අපනයන ප්‍රවර්ධන කලාප තුළ පිහිටුවනු ලද කර්මාන්තශාලා සහ ඒවායේ සේවක පිරිස් පිළිබඳව කෙරෙන බොහෝ විග්‍රහයන්, එම කම්හල් තුළ පවතින අසතුටුදායක තත්ත්වයන් පිළිබඳව සහ එම සේවක පිරිස් උග්‍ර සූරාකෑමට ලක්වන ආකාරය පිළිබඳව හෙළිදරව් කරන්නේ, හැම දෙනාම කම්පාවට පත්කරමිනි. එහෙත් මේ නවීකරණ ක්‍රියාවලියෙහි ජනනාත්මක පාර්ශවයක් අප නොදකින්නේ ද? මින් පෙර කිසි දිනක නොවූ විරූ අයුරින් ලංකාව පුරා තරුණියෝ මුල්වරට තම ගම රට අතහැර නගරයට, කම්හල්වලට සේවය කිරීමට එති. ඔවුහු තම පවුල් නඩත්තු කිරීම හේතුවෙන් පවුල තුළ යම් ගෞරවයකට පාත්‍රවෙති. එසේම, තනිව ජීවත්වීමට සහ ජීවන තීරණ ගැනීමට සිදුවන නිසා ඔවුහු යම් දුරකට සම්ප්‍රදාය විරෝධී වීමට ද පෙළඹෙති. මේ තුළින් ඔවුන් ලබන ස්වාධීනත්වය සහ පන්නරය සුළුපටු නොවේ. ඔවුන් තුළ මෙම මානසික වර්ධනය ඉතා අගයකොට සැලකිය යුතු අතර එය නියමාකාරයෙන් ම දැනුවත් බවකට පරිවර්තනය කිරීමේ වගකීම සංවිධිත වෘත්තීය සමිති විසින් බාරගත යුතුය. එසේම, මෙම ස්ත්‍රීන්ට සුවිශේෂයෙන් ම බලපාන්නා වූ අනාරක්ෂිතභාවය තේරුම් ගැනීමට සහ එයට පිළියම් යෙදීමට ද යුහුසුළු විය යුතු වේ. මුල් වරට පවුලේ බැඳීම්වලින් මිදී, නොහඳුනන ආගන්තුක පරිසරයකට එන මේ තරුණියෝ හුදකලා වීම හේතුවෙන් පීඩා විඳිති. ඔවුන් පවුලෙන් ලත් සෙනෙහසට, උණුසුමට ආදේශකයක් සොයා යාම ස්වභාවික වන අතර මේ හේතුවෙන් දහසකුත් එකක් අතවරයන්ට සහ සූරාකෑම්වලට(කම්හලින් පිටත) ගොදුරු වීම පිළිබඳව අප පුදුම විය යුතු නැත. මෙම ශ්‍රමික පිරිසේ සුවිශේෂතාවයන් තේරුම් ගැනීමට සහ එයට ගැලපෙන අයුරු සංවිධාන විධික්‍රම ගොඩනඟා ගැනීමට අපට සෑහෙන කාලයක් ගත වුණු නමුත් දැන් දැන් උතුරු කොළඹ ප්‍රදේශයෙන් ලැබෙන වාර්තාවන්ට අනුව එය එම පළාත්වල සාර්ථකව කෙරීගෙන යන බව පෙනේ.

අවධාරණය කළ යුතු අනෙක් සාධකය වනාහී, මෙවැනි අපනයනය මුල් කරගත් සහ විදේශීය ආයෝජනයෙන් යුත් කර්මාන්ත ක්ෂේත්‍රයන් හි පවතින සුවිශේෂ තත්ත්වයන් ය. එකපැත්තකින් මේ කර්මාන්තවලට රාජ්‍ය අනුග්‍රහය දැඩි සේ ලබයි. එම නිසා කම්හල් තුළ සිදුවන ශ්‍රම සූක්ෂමභාවයට සහ උග්‍ර සූරාකෑමට පිළියම් රජයේ කම්කරු දෙපාර්තමේන්තුවෙන් පැතීම උගහට ය. රටේ පවතින රැකියා හිඟකම නිසා කම්හල් පාලකයින්ට 'කරදරකාරී' සේවකයින් ඉවත්කොට අලුත් සේවක පිරිසක් බඳවා ගැනීමට ඇති ඉඩකඩ ද අසීමිත ය. විදේශීය ආයෝජකයින්ට මෙරටට පැමිණෙන්නැයි ආරාධනා කරන විට රජය පොරොන්දු වන 'ස්ථාවර භාවය' රැකීමට සන්නද්ධ හමුදා යෙදවීමට වූව රජය සූදානම් ය. අනෙක් අතට, ලෝක වෙළඳපොළේ එක්

එක් වර්ගයේ නිමි ඇඳුම්වලට ඇති ඉල්ලුම නිරතුරුවම චලනයට ලක්වෙයි. එම නිසා මෙවැනි ක්ෂේත්‍රවල කම්කරුවන් සංවිධානය කිරීමෙහි යෙදෙන අය මෙරට සමාගම්වල අය-වැය සහ මූල්‍යමය තත්ත්වයන් පිළිබඳව පමණක් නොව, එහි විදේශීය සබඳතා සහ ලෝක වෙළඳපොළේ එකී නිෂ්පාදනයන්ට අත්වන ඉරණම පිළිබඳව ද විමසිලිමත් විය යුතුය. විශේෂයෙන් ම දකුණු සහ ගිනිකොණ දිග ආසියාවේ මෙවැනි ඇඟලුම් කර්මාන්තශාලා පිහිටුවීමට බොහෝ රාජ්‍යයන් පසුගිය දශකය පුරා ක්‍රියාකර ඇති බැවින් කම්කරු ප්‍රජාවට එකිනෙකා සමඟ අත්දැකීම් හුවමාරු කර ගැනීමට, එකිනෙකාගෙන් පාඩම් ඉගෙන ගැනීමට, ජාත්‍යන්තර ජාලයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය අද අප හමුවේ ඇත.

මේ වන විට මෙසේ කම්කරු ස්ත්‍රීන් අතර අන්තර් සම්බන්ධතාවයක් ගොඩනැගීමට උත්සාහ දරා ඇති සංවිධාන කිහිපයකි. එහි එක් ප්‍රකාශනයක් වූයේ, 1984 දියත් කළ රාත්‍රී සේවයට එරෙහිව කෙරුනු උද්ඝෝෂණ ව්‍යාපාරයයි. වාමාංශික පක්ෂවල ස්ත්‍රී සංවිධාන, වෘත්තීය සමිති සහ ස්වායත්ත ස්ත්‍රී කණ්ඩායම් එකතු වී කොළඹදී රැස්වීමක් පැවැත්වූහ. පෙත්සමක් ද අත්සන් කළෝය. එහෙත් එක අතකට පවතින යථාර්ථය සහ කම්කරු ස්ත්‍රීන්ගේ මතය පිළිබඳව කළ එතරම් නිවැරදි නොවූ ඇගැයීමක් නිසා මෙම උද්ඝෝෂණය එතරම් සාර්ථක නොවීය. හේතුව, කම්කරු ස්ත්‍රීන් බොහෝ දෙනෙකුට රැ වැඩ කිරීමට අකැමැත්ත පළ කිරීමට ඇති නොහැකියාවයි. අප මෙයට ඇති භෞතික පදනම, එනම් වැඩිපුර මුදලක් උපයා ගැනීමේ ඒකායන අභිප්‍රාය තේරුම් ගන්නා අතර ම මෙම ස්ත්‍රීන් සංවිධානය කිරීමේදී ඒ අය අතරින් ම පැනනගින, ඒ අයගේ සැබෑ වුවමනාවන් සම්බන්ධයෙන් ද වඩාත් සංවේදී විය යුතුය.

1984 පොලිටෙක්ස් වර්ජනයට සහාය දීම සඳහා බිහි වූ සංවිධාන එකතුව අද මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා බලප්‍රදේශයේ එක්සත් කම්කරු සහයෝගතා සංවිධානය ලෙස ජා-ඇල, කටුනායක ප්‍රදේශයේ කම්හල් සහ කම්කරුවන් අතර මෙවැනි දේශීය ජාලයක් ගොඩනැගීමෙහි නිතර වී සිටී. එසේම, නීති උපදෙස් සහ පුස්තකාල, කියවීම් හා ක්‍රීඩා ශාලා ආදී විවේකාගාර පහසුකම් සලසාලන සංවිධාන කීපයක් ද එම පෙදෙස තුළ බිහි වී තිබේ.

පසුගිය වකවානුව තුළ වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ පොලිටෙක්ස් වැඩවර්ජනය වුවද වෙනත් කර්මාන්ත ශාලාවල ද ස්ත්‍රීහු තම අයිතීන් සඳහා සටන්බිමට පිවිසුණහ. වෘත්තීය සංවිධාන සම්පූර්ණයෙන් ම තහනම්කොට තිබෙන කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සමහර කම්හල්වල ස්වයංමය වැඩනැවැත්වීම් සිදු වූ අවස්ථා පිළිබඳ වාර්තා ලැබේ. එසේම, රත්මලාන

ප්‍රදේශයේත් බහුතරයක් ස්ත්‍රීන් සේවය කළ කම්හල් ගණනාවක සිදුවූ වර්ජන ද අමතක කළ නොහැකිය. 1984 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල හටගත් මැග්නම් ගාමන්ට්ස් වර්ජනය ද ඉතා උණුසුම් තත්ත්වයන් මධ්‍යයේ පොලිස් මර්දනය ද නොතකා සාර්ථකත්වය කරා ඉදිරියට ගෙන ගියේ ස්ත්‍රී කම්කරුවන් ය. 1985 ඔක්තෝබර් මාසයේ මහනුවර ගුණපාල විජේමාන්න සහ සමාගමේ වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳව කතා කළ ස්ත්‍රීන් දෙදෙනෙකු සේවයෙන් නෙරපීමට විරුද්ධව කෙරුනු වර්ජනය ද කඳුරට පුළුල් උද්ඝෝෂණයකට පසුබිම් විය. ආධාර කැට එකතු කරමින්, මහ මඟ පොස්ටර් අලවමින්, පත්‍රිකා බෙදමින්, තම ප්‍රශ්න හඬනඟා කියමින් සටන් මඟට පිළිපන් මේ සියලුම කම්කරු ස්ත්‍රීහු එවකට මන්දෝත්සාහීව සිටි සම්ප්‍රදායික වෘත්තීය සමිති ව්‍යාපාරයට ප්‍රබල අභියෝගයක් එල්ල කරමින් අප රටේ පංති සටන් ඉතිහාසයේ සදා නොමැකෙන සටහනක් ලියා තැබූහ. මේ අනුව, තාවකාලිකව ලත් පසුබැස්මෙන් අධෛර්යමත් නොවී ඉදිරියටම කටයුතු කරගෙන යාමට එම ක්ෂේත්‍රයේ නියැලෙන ස්ත්‍රීන්ට ශක්තිය ප්‍රාර්ථනා කරමු.



පොලිටෙක්ස් කම්කරුවන්

යලි ජය ගනී!

ජා-ඇල පොලිටෙක්ස් ගාමන්ට් කම්කරුවන් මෙවරත් ජයග්‍රහණය කර ජූනි 18 දින තෑවත වැඩ ආරම්භකර ඇත. පෙබරවාරි මස 17 වන දින ඇරඹූ මෙම වැඩ වර්ජනයට කම්කරුවන් 1300 ක් සහභාගී වුණි. මින් 98 % කම්කරු ස්ත්‍රීන් වූ අතර, මෙම වැඩ වර්ජනය දුර්වල නිර්මි සඳහා පාලකයින් හා ඔවුනට ගැනිකම් කරණ අය විසින් ගෙන ගිය පසුගිය මර්ධනයන් හා පිබ්‍රහයන් නොසකාමි හරියැවම මාස 4 ක් පිය වැඩවර්ජනය අතීත ලෙස ඉදිරියට ගෙනයාවේ සමස්ථම සමස්ථ කම්කරු පංතියටම ධෛර්යක් හා ශක්තියක් වනු ඇතැ මානය.

විදේශීය කොටස්කරුවන්ගෙන් යුත් පොලිටෙක්ස් ගාමන්ට් සමාගමේ පාලකයින්ගේ හා ධනේශ්වර මර්ධනයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම වැඩ වර්ජනය සම්බන්ධව අප සංගමය පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීමවලට අවසර නොදෙන ලදී. අනුත් සේවකයින් බලවා ගෙන වැඩ වර්ජනය කඩා දමමට පාලකයින් ගත් උත්සහය දීප පිවරට ඇතුළු වෙනත් සමාගම්වලට ඉරදී නිමකර ගැනීමේ පාලකයින්ගේ ත්‍රිපාවිධ මෙරජයේ සමහර බලධාරීන්ගේ සහයෝගයද ලැබුණි. එපමණක් නොව වැඩ වර්ජනය සම්බන්ධගෙන් ප්‍රචාරය කිරීමේ පෝස්ටර් ඇලවීමේ හේතුව මත හා පත්‍රිකා බෙදීමේ හේතුව මත වැඩ වර්ජක සෘජුදර සහෝදරියන්ට පොලිස් මර්ධනයට ලක් වීමටද සිදුවිය. මෙම පසුගිය මර්ධනයන් මෙන්ම, ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණදෙමින් ඉදිරියටම ගොස මෙම වැඩ වර්ජනය වටා ප්‍රදේශවාසී ජනතාවගේ සහයෝගය මෙන්ම පසුගිය වෘත්තීය සමිති හා මධ්‍යජන සංවිධාන මෙන්ම ස්ත්‍රී සංවිධානවල සහයෝගය ගෙනා කිරීමට අප සංගමය සමත් වුණි.

වැඩ වර්ජනය සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ කලින් පැවති සාකච්ඡාවලදී ප්‍රජාතන්ත්‍ර විරෝධී හා නීති විරෝධී කොන්දේසි ඉදිරිපත් කළ පාලකයින් එවැනි කොන්දේසිවලට අප සංගමය ගටාකර ගැනීමට නොහැකිවූ බැවින් ඒවා ඉවත්කර ගන්නා ලදී. වැඩ බලන කම්කරු ඇමති ජෝසෙප් මයිකල් පෙරේරා මහතාගේ සභාපතිත්වයෙන් සිය අමාත්‍යාංශ කාර්යාලයේද පැවැත්වූ සාකච්ඡාවලදී ඉතාමත් අසාධාරණ ලෙස සේවයෙන් පහකර තිබූ සේවිකාවන් 6 දෙනා නිසිදු කොන්දේසියකින් තොරව නැවත සේවයට ගැනීමට සිදුවිය. කොන්දේසි මරගතව බෝනස් ගෙවීමටත් වැටුප් වැඩිවීම ගත මුදල් ගෙවීමටත් එකඟවූ පාලකයින් දැන් නිමෙන්නාවූ නිවාවු ප්‍රමාණයට අමතරව පඩි සහිත නිවාවු ඇතුළත දිවෙස් එකඟ වීය. දීග

වතු ක්ෂේත්‍රය :

1984 තේ වතුවල වැටුප් අරගලය

ලංකාවේ වතුකරයේ වැඩ කරන දෙමළ ජනතාව සහ ඔවුන්ට උරුම වූ සුවිශේෂ පීඩනය සහ සූරාකෑම පිළිබඳව කරුණු අවශ්‍ය තරම් බොහෝ තැන්වල මේ වන විට ඉදිරිපත්කොට හමාර ය. ස්ත්‍රීන් වීම, කම්කරුවන් වීම සහ දෙමළ වීම යන සාධක තුන හේතුවෙන් වතුකරයේ ස්ත්‍රීන් තෙවැදෑරුම් පීඩනයකට ගොදුරුවන ආකාරය විස්තර කරමින් වෙනම පොත් සහ ලිපි රැසක් ලියැවී ඇත. ඒවාට අනුව, ලංකාවේ ජනගහණයෙන් 1/6 ක් වන වතුකරයේ දෙමළ ජනතාව අප රටේ වැඩකරන ජනගහණයෙන් 1/3 ක් වන බව පෙනී යයි. එම ජනගහණයෙන් 98.3%ක් ස්ත්‍රීහු කම්කරුවෝ වෙති. අපගේ අපනයන ආදායමෙන් අඩක් පමණ සපයා දෙන වතු ක්‍රමය තුළ සේවය කරන පිරිසගෙන් 86% ගේ පමණ මුළු වත්කම රු. 5000.00 නොඉක්මවයි. ලංකාවේ වෘත්තීය සමිති සාමාජිකත්වය දරන ස්ත්‍රීන්ගෙන් 75% ක් පමණ වතු කම්කරුවෝ වෙති. එසේම වයස අවුරුදු 18 ට අඩු කම්කරු ස්ත්‍රීන්ගෙන් 62%ක්ම වතුකරයේ ස්ත්‍රීන් වේ.

අහිතකර නිවාස, විදුලි, සනීපාරක්ෂක සහ ජල පහසුකම් නොමැතිකම, අධ්‍යාපන හා සෞඛ්‍ය අඩුපාඩු සහ ප්‍රධාන වශයෙන් අවම ජීවන මට්ටමක් පවත්වාගෙන යාමට ප්‍රමාණවත් වූ වැටුපක් නොලැබීම, වතු කම්කරුවන්ට ඇති ප්‍රධාන ගැටළු ලෙස නම් කළ හැකිය. මේ අතර, ජාතික සංඛ්‍යා ලේඛනවලට වඩා දෙගුණයක් තරම් වැඩි වූ මාතෘ හා ළදරු මරණ සංඛ්‍යාවක් වතුකරයෙහි පවතින බව ද අකුරු නූගත් බව වතුකරයේ ස්ත්‍රීන් අතර 51% ක් දක්වා ඉහල අගයක් ගන්නා බව ද සමීක්ෂණ වාර්තා පෙන්වා දෙනු ලබයි. තවද අපගේ විශේෂ අවධානය යොමු විය යුතු ප්‍රශ්නයක් වන්නේ පසුගිය වකවානුවේ වතුකරයේ ඊනියා පවුල් සැලසුම් ව්‍යාපාර දියත් කිරීම සහ ඒ මගින් දිරි දීමනාවක් ද දෙමින් එම ස්ත්‍රීන්ගේ ආර්ථික අමාරුකම් ඉතා අමානුෂික ලෙස ප්‍රයෝජනයට ගනිමින් වඳ සැත්කම් සිදු කිරීමේ ඵලවිපාකයි. ජාතිවාදී ලැව්ගින්න හේතුවෙන් ලිංගික අතවරයන්ට මුහුණ පෑමට සිදුවීම 1978 සිට මෙම ස්ත්‍රීන්ට උරුම වූ අතර, එදිනෙදා වැඩකටයුතු කරගෙන යාමේදීත් වැඩ පරීක්ෂකවරුන්ගේ සහ වෙනත් පාලකයින්ගේ ලිංගික ඕනෑ එපාකම් ඉටු කිරීමට බලකරනු ලැබීම වතුකර ජීවිතයේ සාමාන්‍ය ප්‍රශ්නයක් බවට පත් වී ඇත.

වෙනත් රැකියා ක්ෂේත්‍රවලදී මෙන් ම වතුකරයේ ද වැඩ බෙදීමේ දී ස්ත්‍රීන්ට අසාධාරණයක් සිදුවෙයි. තේ වතුකරයේ වැඩකරන ස්ත්‍රීහු වැඩිදෙනා අඩු වැටුපක් ලබන, එහෙත් වැඩි පැය ගණනක්, වැඩි වෙහෙසක් දරා වැඩ කළ යුතු වන ක්ෂේත්‍රයන් තුළ සදාකාලිකව සිර වී සිටිති. තේ වතුවල බොහෝ ස්ත්‍රීහු දළු නෙලන්නියෝ ය. ඊට අමතරව උදළු ගෑම ආදී වැඩවලට ද ඔවුහු යොදවනු ලබති. නවතාක්ෂණය යොදා වතුකරයේ වෙනත් වැඩ ක්ෂේත්‍රයන්ට නවීන උපකරණ හා උපක්‍රම හඳුන්වා දෙන නමුත් තේ දළු නෙලන අංශයේ ස්ත්‍රීන් වැය කරන ශ්‍රමය අඩුකිරීම සඳහා කිසිඳු යන්ත්‍රයක් හෝ උපකරණයක් හෝ පිළිබඳව මේ දක්වා සොයා බැලීමක් නැති බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. පිරිමි වැඩ ක්ෂේත්‍රයේ වල්පැල නාශක, ඖෂධ වර්ග යෙදීමෙන් වල්පැල නෙලීමේ කටයුත්ත පහසු කරවා ගත හැකි මඟක් හඳුන්වා දී තිබීම දෙස බැලූ කල මේ අයුක්තිය වඩාත් පැහැදිලි වේ.

වතුකරයේ ආරම්භයේ සිට ම ස්ත්‍රී-පුරුෂ වැටුප් අතර විෂමතාවයක් පැවතුණි. ස්ත්‍රී වැටුප පිරිමි වැටුපට වඩා 16%ක් පමණ අඩුවිය. 1984 දී පිරිමින්ගේ වැටුප රු. 17.71 ක් වූ අතර ස්ත්‍රීන්ගේ වැටුප 14.83 විය. ඒ සමගම පොදුවේ වතු කම්කරුවන්ට ගෙවූ වැටුප පිළිබඳව බරපතල ගැටළුවක් විය. එනම්, ඉතා අඩු මූලික වැටුපක් (පිරිමින්ට රු. 4.51 සහ ස්ත්‍රීන්ට රු. 4.32) තිබීම සහ ඊට අමතරව හා අනුකූලව වෙනත් දීමනා ආදිය ගෙවීමයි. වැටුප් ව්‍යුහය සකස් කෙරුනේ ද මේ විෂම පදනම මත බව 1983 නොවැම්බර් මාසයේදී ගත් පහත දත්තයන්ගෙන් හෙළිදරව් වෙයි.

	මූලික වැටුප	ජීවන අංක දීමනාව	අය වැය දීමනාව	මිල වැටුප් අතිරේකය	මුලු දෛනික වැටුප්
පුරුෂ	4.51	7.75	5.15	.30	17.71
ස්ත්‍රී	4.32	5.26	4.95	.30	14.83

1983 වන විටත්, වතු කම්කරුවන්ට වැඩිවන ජීවන අංකය සඳහා ලැබුණු මුදල එක් අංකයකට ශත 03 ක් වැනි සුළු මුදලක් විය. ජීවන අංක දීමනාව පිළිබඳව දීර්ඝ කේවල් කිරීමකට පසුව, 1983 පෙබරවාරි මාසයේ පඩි පාලක සභාව ද වැඩි වන ජීවන අංකය සඳහා ගෙවන මුදල් ශත 06 දක්වා වැඩි කිරීමට එකඟ විය.

එහෙත්, මෙම තීරණය ගෙන අවුරුද්දකටත් වැඩි කාලයක් ගත වන තුරු එනම්, 1984 පෙබරවාරි දක්වාම එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කම්කරු අමාත්‍යාංශය සමත් වූයේ නැත. මේ සම්බන්ධයෙන් 1984 ජනවාරියේ සිට ම වතු ක්ෂේත්‍රයේ විශාලතම වෘත්තීය සමිතිය වන ලංකා කම්කරු සංගමය නොයෙකුත් මතක් කිරීම් කළ ද වර්ජනය කරන බවට අනතුරු ඇඟවීම් කළ ද ඒවාට කිසිඳු ප්‍රතිචාරයක් නොලැබුණි.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් ව්‍යුහ සංශෝධනය, වැටුප් විෂමතාවයන් ඉවත් කිරීම සහ 1983 පෙබරවාරි පඩිපාලක සභා තීරණය ක්‍රියාත්මක කිරීම ඉල්ලා සිටිමින්, ලංකා වතු කම්කරු සංගමයේ පූර්ණ සාමාජිකත්වය 1984 අප්‍රේල් 1 දා සිට වැඩවර්ජනය කළ යුතු යැයි තීරණයකොට තිබුණි. මෙය ආරංචි වූ පසුව ආණ්ඩුව, ඔවුන්ට පක්ෂ එයට අනුබද්ධ ලංකා ජාතික වතු කම්කරු සමිතිය සමග සාකච්ඡාකොට, ස්ත්‍රී-පුරුෂ වැටුප් විෂමතාවය අහෝසි කරන බවත් දෛනික වැටුප රු. 20.50 දක්වා වැඩි කරන බවත් නිවේදනය කළේය. එසේම, ලංකා කම්කරු සංගමය සමග ද කේවල් කිරීම ආරම්භ කළ ආණ්ඩුව වැටුප රු. 21.75 දක්වා වැඩි කිරීමට තමන් එකඟ බව ද කියා සිටියේ ය. එහෙත් සමස්ත වැටුප් ව්‍යුහය වෙනස් කළ යුතුය යන අදහසට අපේක්ෂිත ප්‍රතිචාරයක් නොලැබුණෙන්, ලංකා කම්කරු සංගමය කලින් ගත් තීරණය අනුව 1984 අප්‍රේල් 1 දා වැඩ වර්ජනය ආරම්භ කළේය. ලංකා කම්කරු සංගමයේ ශක්තිය අඩු දකුණු ප්‍රදේශයේ පමණක් කම්කරුවන්ගෙන් 35% ක් පමණ වර්ජනයට සහභාගි වූ අතර වෙනත් සෑම පළාතක ම එය 100% ක් සාර්ථක විය.

ලංකාවේ ආර්ථිකය තවමත් බොහෝ දුරට තේ අපනයනය මත රැඳෙන නිසා ම, වතුකරයේ සිදු කෙරෙන වැඩවර්ජනයන් ඉතා ඉක්මනින් සහ සෘජුවම ජාතික ආර්ථිකය කෙරෙහි බලපායි. ලංකා කම්කරු සංගමයේ ශක්තිය ද මෙයයි.



තව ද වර්ජනය ආරම්භ වූයේ තේ දළු නෙලන උච්ච අවස්ථාවේ දී නිසා, දළු නෙලීම ප්‍රමාද වීමෙන් සිදුවිය හැකි පාඩුව සුළුපටු නොවීය. මේ නිසා වර්ජනය දින 10 ඉක්මවා යන්නට ප්‍රථම අප්‍රේල් 10 දා ලංකා කම්කරු සංගමයේ මූලික ඉල්ලීම් දෙක වූ වැටුප් විෂමතාවයන් අහෝසි කිරීම සහ වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීම යන දෙකට ම රජයේ එකඟත්වය ලබාගෙන වතු කම්කරුවෝ නැවත වැඩට වාර්තා කළහ. එයට අනුව, ස්ත්‍රීන්ට සහ පිරිමින්ට රු. 23.75 ක මූලික දෛනික වැටුපක් හිමි විය. මෙයට අමතරව පෙර වෙනත් සියලුම දීමනා ද ඔවුනට ලැබේ.

වසර එකසිය පනහක් පමණ කාලයක් පුරා වතුකරයේ පැවතුණ ස්ත්‍රී-පුරුෂ වැටුප් විෂමතාවය මෙසේ ඉවත් කෙරුන ද, වතුකරයේ ස්ත්‍රීන්, ස්ත්‍රීන් වශයෙන්

තමාට සිදුකෙරෙන අසාධාරණයකට එරෙහිව තම අයිතියක් පතා සටන් වැදුනා ද යන්න ගැටළුවකි. පවතින ආර්ථික දුෂ්කරතා, වතුකරයේ ස්ත්‍රීන්ගේ අඩු විඥාන මට්ටම ආදිය හේතු කොටගෙන තම වැටුප වැඩි කරගැනීමේ අරමුණ ප්‍රබලව පැවතුණ බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇති නමුත් ඒ හේතුන් නිසා ම වතුකරයේ ස්ත්‍රීන් අතර තමන්ට එරෙහිව ඇති ලිංගික පීඩනය පිළිබඳව දැනුවත්භාවය ප්‍රමාණවත් නැති බව ද අප සැලකිල්ලට ගත යුතුය. ලංකාවේ විශාලතම වෘත්තීය සමිතියක් වන ලංකා කම්කරු සංගමය පොදු වැටුප් ප්‍රශ්නයකට අඩංගු කොටසක් ලෙස මේ ඉල්ලීම ඉදිරිපත් කළත් එම සංගමයට අයත් ස්ත්‍රීන් - එහි සාමාජිකත්වයෙන් හරි අඩකට ආසන්න වේ. මේ නිසාම ඔවුන් මේ සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දැක්වූවාදැයි නොදනිමු. එහෙත් සැබැවින් ම අරගල ක්‍රියාදාමය තුළ ප්‍රධාන කාර්යයක් ඉටු කළේ 'මාතා සංගම්' යනුවෙන් වෘත්තීය සමිතිය තුළ සංවිධානගත වී සිටින ස්ත්‍රීන් බව කිව හැකිය. මන්ද, පිරිමින්ට නියමිත කාර්යයන් - උදළු ගෑම, කාණු කැපීම, වල්පැල නෙලීම ආදිය සති ගණන් ඉටු නොකළත් තේ කර්මාන්තය සහ විදේශීය මුදල් ඉපයීම කෙරෙහි ඉන් ඇති වන්නේ තදබල බලපෑමක් නොවන බැවිනි. එහෙත් ස්ත්‍රීන්ට නියමිත වූ කාර්යය වන තේ දළු නෙලීම වනාහී දිනක හෝ ප්‍රමාදයකින් විශාල වශයෙන් ආර්ථික අලාභ ගෙන දෙන කටයුත්තකි. මේ කරුණ ලංකා කම්කරු සංගමය ද වටහා ගෙන සිටින බව සනාථ කරමින් එහි සභාපති කීවේ, *"අපේ සැබෑ ශක්තිය ස්ත්‍රීන් ය"* යනුවෙනි.

වර්ජනය ජයගත්තාට පසුව ස්ත්‍රීන් එය දුටුවේ වැටුප් වැඩි කරගැනීම වශයෙන් විනා, ශතවර්ෂයකටත් වැඩි කාලයක් මුළුල්ලේ තමන් විඳි අසාධාරණයකින් මිදීමක් වශයෙන් නොවූ බව ඇතැම් සමාජ විද්‍යාඥයින් සමීක්ෂණ මගින් පෙන්වා දෙනු ලබයි. මෙයට එක් හේතුවක් ලෙස, කලින් සඳහන් කළ පරිදි වතුකරයේ ස්ත්‍රීන්ගේ අඩු අධ්‍යාපන තත්ත්වය සහ නොදැනුවත්භාවය දැක්විය හැකිය. එහෙත් වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය තුළ ක්‍රියාශීලී වීමෙන් බොහෝ විට නාමිකව පමණක් වෘත්තීය සමිති සාමාජිකත්වය දරන ස්ත්‍රීහු යම් ක්‍රියාදාමයකට තල්ලු වී යති. වර්ජන අරගලවලට සහභාගි වීම තුළින් සහ ජාතිවාදී ප්‍රහාරයන්ට එරෙහිව පෙළ ගැසීම තුළින් දැනුවත් බවක්, පන්තරයක් හා සටන්කාමීත්වයක් උරුම කොටගත් ස්ත්‍රීන් පිරිසක් දැන් දැන් වතුකරයෙන් බිහිවන ලකුණු පහල වේ. මේ සමාජය තුළ සහ විශේෂයෙන් හින්දු - දෙමළ සමාජය තුළ ආධිපත්‍ය දරන සියලුම සම්ප්‍රදායික හා පුරුෂාධිපත්‍යයික ඇගැයීම් විසින් ස්ත්‍රිය සදාකාලිකව ද්විතියික හා යටහත් තත්ත්වයක තබා ගැනීම සඳහා විශාල දායකත්වයක් දරන බව නොරහසකි. ස්ත්‍රිය පිළිබඳව මේ ගතානුගතික ප්‍රතිරූපය වතුකරයේ සමාජය තුළ සහ වෘත්තීය සමිති තුළ ප්‍රතිනිර්මාණය වීම පිළිබඳව ද අප පුදුමයට පත්විය යුතු නොවේ. එහෙත්

අලුත් ලොවක් කරා පා තැබීමේදී මෙම ක්‍රියාවලියට පිටු පෑ නොහැකිය. තම ජීවන තත්ත්වයන් උසස් කර ගැනීම සඳහා මුලින් වෘත්තීය සමිතිය දියත් කරන්නා වූ අරගලයන්ට සහභාගි වන ස්ත්‍රීන්, ඒ තුළින් ලබන අත්දැකීම් හා දැනුම පාවිච්චි කරමින් වඩාත් පුළුල් අරගල ක්ෂේත්‍රයන් කෙරේ යොමුවනවා නොඅනුමාන ය.

දෙල්හේන - රෑද්දගොඩ වතු අරගලය

1986 වසරේ සැප්තැම්බර් මස 11 වන දින සිට, රිදීගමට ආසන්න දෙල්හේන - රෑද්දගොඩ යන වතුවල සහ රම්බඩගල්ල රබර් කම්හලේ කෙරුනු වැඩ වර්ජනය දින 45 කට පසු නිමාවට පත් වූයේ ජයග්‍රහණයෙනි. මෙම වැඩවර්ජනය ලංකාවේ වතු ක්ෂේත්‍රයේ අරගල ඉතිහාසයේ විශේෂ තැනක් ගන්නේ කරුණු කීපයක් නිසාය. මේ වතු පිහිටා තිබෙන්නේ තෙත් කලාපයේ, බහුතරයක් සිංහල ජනයා පදිංචි ප්‍රදේශයක ය. වතු කම්කරුවන් වශයෙන් සේවය කරන්නේ සිංහල දෙමළ දෙපිරිස ම ය. තේ වතු ක්ෂේත්‍රයේ මෙන් දැඩි වෘත්තීය සමිති සංවිධාන රටාවක් හෝ සම්ප්‍රදායක් මෙහි නැත. මෙම වැඩවර්ජනය මෙහෙය වූ එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී වතු සේවක සංගමය ද අප මුලින් විස්තර කළ, කුඩා අලුත් හා ස්වායත්ත වෘත්තීය සමිති ගණයට අයත් වෙයි. ලංකාවේ ප්‍රබලතම වතු කම්කරු සංගමය වන ලංකා කම්කරු සංගමයේ මෙහෙයවීමට බාහිරව මුල් වරට වතු ක්ෂේත්‍රයේ මෙතරම් දිග සහ සාර්ථක වැඩවර්ජනයක් මෙහෙයවීමේ ගෞරවය මේ කුඩා වෘත්තීය සමිතියට හිමි වේ.

දෙල්හේන - රෑද්දගොඩ වතුවල ප්‍රධාන වශයෙන් පොල් සහ රබර් ද අමතර බෝග වශයෙන් කොකෝ, ගම්මිරිස් සහ කෙසෙල් ආදිය ද වගා කළ අක්කර 1200 ක් පමණ වේ. පවුල් 101කට අයත් 544 දෙනෙකු මේ වතුවල ජීවත් වුවත් කම්කරුවන් ලෙස වැඩ කරන්නේ 114 ක් පමණි. ඉන් 66 දෙනෙක් ස්ත්‍රීහු වෙති. මේ පවුල්වලින් 93 ක් ම දෙමළ ය. එයිනුත් 42කට ම පුරවැසි අයිතිය පවා නොතිබිණි. 544 දෙනාගෙන් හරි අඩකට වඩා වයස අවුරුදු 15 ට අඩු වූ අතර, මේ මුළු ජනගහණයට ම තිබුණේ ලයින් කාමර 121 ක් සහ වැසිකිලි 2කි. ජල නල 2ක් සහ ළිං 4 ක් ද විය.

ඉහත විස්තර අනුව, මේ වතුවල ජීවිතය කෙතරම් දුෂ්කරදැයි මනාව ඔප්පු වේ. තත්ත්වයන් මෙසේ තිබියදී 1986 සැප්තැම්බර් 11 දා වතු පාලකයන් විසින් අමානුෂික ලෙස කම්කරුවෙකුට පහරදීම මුල්කොට ගෙන සැප්තැම්බර් 12 දා 200 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් වැඩ වර්ජනයක් ආරම්භ කෙරුණි. එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී වතු සේවක සංගමයේ මෙහෙයවීම යටතේ ස්ත්‍රී-පුරුෂ

කම්කරුවෝ දැඩි උද්යෝගයකින් යුතුව අරගලයට උර දුන්හ. සැප්තැම්බර් 16 වන විට, එම පාලකයා යටතේ ම පැවති රම්බඩගල්ල රබර් කම්හලේ සේවක පිරිස ද වැඩවැරුමට එක්ව සිටියහ.

සැප්තැම්බර් 22 දා වන විට, කම්කරුවන් නැවත වැඩට ගෙන්වා ගැනීමට බලකිරීමක් වශයෙන් වත්තෙන් නිකුත් කරන ලද ආහාර සලාකය කපා හරින ලදී. එහෙත් අසල්වාසීන් සමග, ප්‍රදේශය තුළ හා ඉන් පිටත පොදු ප්‍රගතිශීලී සහ බහුජන සංවිධාන සමග වර්ජකයින් ගොඩනඟා ගෙන තිබුණු සහයෝගිතා පෙරමුණ පදනම්කොට ගෙන නන් අයුරින් ආධාර උපකාර කම්කරුවන් වෙත ගලා ආවේය. මෙය වර්ජනය අත නොහැර දිගටම ගෙනයාමට ඔවුන් දිරිමත් කළේය. ලොරියකට කොප්පරා පටවා එය කොළඹට පිටත්කර යැවීමට පාලකයින් උත්සාහ කළ විටක, පැය තුනක් පුරා එම ලොරිය ඉදිරිපිට වාඩිලා ගෙන එහි ගමන් මඟ ඇහිරීමට තරම් එම කම්කරුවෝ එඩිතර වූහ.

පොලීසියෙන් සහ පාලකයින්ගෙන් එල්ල වුණු තර්ජන සේම මර්දනය මැද ප්‍රදේශවාසීන්ගේ හා වෙනත් බොහෝ බහුජන සංවිධානවල සහයෝගය ඇතිව තම සටන් තීරණය අත්නොහල කම්කරුවෝ නොයෙකුත් කේවල් කිරීම්වලට පසුව අදාල අමානුෂික වතු පාලකයාගේ වැඩ තහනම් කිරීම ඇතුළු ඉල්ලීම් රැසක් දිනාගෙන, 1986 ඔක්තෝබර් 29 නැවත සේවයට වාර්තා කළහ.

මෙම වැඩවර්ජනයේ සුවිශේෂ ලක්ෂණයක් වූයේ, වතුවල සහ අවට ප්‍රදේශවල සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනයාගේ එකමුතුවයි. එසේ ම මින් පෙර කිසි දිනයක පොදු වැඩකට හෝ උද්ඝෝෂණයකට හෝ සහභාගි නොවූ බාල - මහළු වතු කම්කරු ස්ත්‍රීහු සටන් පාඨ කියමින් රිදීගම නගරයේ පෙළපාලි ගියහ. උපවාස කළහ. මුල් වතාවට තම ජීවිතයේ කටුක තත්ත්වයන් හෙළිදරව් කරමින් ප්‍රසිද්ධියේ කතා පැවැත්වූහ. මෙහි ලා වෘත්තීය සමිතිය ඉටු කළ වැඩ කොටස මෙන් ම ප්‍රගතිශීලී කාන්තා පෙරමුණ ඉටු කළ කාර්යභාරය ද විශේෂයෙන් අගය කළ යුතුය. මේ අරගලයෙන් දෙල්හේන - රැද්දගොඩ ස්ත්‍රීහු ලත් අත්දැකීම් හා පන්නරය ඔවුන්ගේ ඉදිරි ක්‍රියාකාරිත්වයට සහ සහභාගිත්වයට මහත් අනුබලයක් වනු ඇත.

ඡායාරූප: සුනන්ද දේශප්‍රිය

හෙදි සටනට ගැමි ස්ත්‍රීන්ගේ සහාය - ප්‍රගතිශීලී කාන්තා පෙරමුණේ සුමිකා පෙරේරා සහ කාන්ති හෙට්ටිආරච්චි සහෝදරියෝ

හෙදි අරගලය

රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය, බහුතරයක් හෙදියන් නියෝජනය කරන ස්වාධීන - එනම් කිසිඳු දේශපාලන පක්ෂයකට සෘජු ලෙස අනුබද්ධ නොවූ වෘත්තීය සමිතියකි. දිවයින පුරා ඇති ග්‍රාමීය රෝහල්වල සිට මහ රෝහල් දක්වා ඇති රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා ජාලයේ රෝහල් 312 තුළ ම එම සාමාජික සාමාජිකාවෝ සිටිති. මීට අවුරුදු සියයකටත් වඩා ඉහත දී ආරම්භ කරන ලද රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ සභාපති ලෙස මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි පත්වූයේ 1965 දීය. හෙද සේවයෙහි නියැලෙන්නේ නැති පූජ්‍ය පක්ෂයට අයත් කෙනෙක් මෙම සංගමයේ නායකත්වය දැරීම විශේෂ කරුණක් වන අතර, සංගමයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකත්වය දෙස බැලූ විට ද එය කිසිසේත් සංගමයේ පොදු සාමාජිකත්වයේ ස්ත්‍රී-පුරුෂ අනුපාතය පිළිබිඹු නොකරන බව පෙනී යයි.

එදා මෙදා තුර අවුරුදු විස්සක කාල පරිච්ඡේදයක් පුරා විවිධ අවස්ථාවල හෙද හෙදියෝ තම අයිතීන් ඉල්ලා සටන් කළේ මෙම බෞද්ධ භික්ෂූන් වහන්සේ නමකගේ නායකත්වය යටතේ ය. හෙද සංගමය මේ කාලය තුළ රාත්‍රී වැඩ මුරය අඩුකර ගැනීමට, වැටුප් සහ අතිකාල ගෙවීම් මෙන් ම දීමනා වැඩි කරගැනීමට, උසස් වීම් විධිමත් කරගැනීමට නොයෙකුත් අවස්ථාවන් හිදී රජය සමග කේවල්කොට එය අසාර්ථක වීමෙන් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග යන්ට යොමු වී ඇතත් හැමවිටම පාහේ ඒවා රෝහල් තුළ සිට කෙරුනු කළු පටි පැළැඳීම, සෙරෙප්පු පය ලා වැඩට පැමිණීම, අසනීප නිවාඩු ගැනීම, අකුරට වැඩකිරීම ආදී ක්‍රියාවන් විය.

1980 ජූලි මාසයේ දී රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ රජයට ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කළේය. ඒ පිළිබඳව විවිධ මතක් කිරීම් කළත් සෑහීමකට පත් වියහැකි කිසිඳු ප්‍රතිචාරයක් නොලැබුණෙන්, 1985 ජුනි 30 ට පෙර මේ සම්බන්ධයෙන් යම් පියවරක් නොගතහොත් ජූලි 1 දා සිට අවිහිංසාවාදී වෘත්තීය සමිති ක්‍රියාවන් කීපයක් ගන්නා බව වගකිව යුත්තන් වෙත හෙද සංගමය විසින් දන්වන ලදී. මෙහිදී ඔවුන්ගේ මූලික ඉල්ලීම් වූයේ සපත්තු දීමනාව රු. 200.00 දක්වා වැඩි කිරීම, වැටුප් පරිමාණය හෝ ශ්‍රේණිය නොසලකා අතිකාල ගෙවීම් පැයකට රු. 15.00 ක් කිරීම, වාට්ටුවල බඩුබාහිරාදිය ආරක්ෂා



'කාන්තා හඬ' සඟරාවෙනි.

කිරීම සඳහා වාට්ටු භාර හෙදියට ගෙවන වට්ටෝරු දීමනාව රු. 300.00 දක්වා වැඩි කිරීම සහ එම කටයුත්ත සඳහා උප හෙදියකට රු. 100.00 ක් ගෙවීම, සහ පැරණි (ගැලටියා) නිල ඇඳුම ලබා දීම ය. ගැලටියා නිල ඇඳුම ජාත්‍යන්තරව පිළිගන්නා නිසා සහ සුදුසුකම් නැති අයට එය පාවිච්චි කළ නොහැකි නිසා හෙදි නිල ඇඳුමේ ගෞරවය රැකීම සඳහා නිසා ඇඳුම පිළිබඳව ඉල්ලීම ඉදිරිපත් කළ බව හෙදියෝ කියා සිටියහ.

ජූනි 1 දා පටන් හෙදියෝ සෙරෙප්පු දමාගෙන වැඩට ගියහ. අතිකාල වැඩකිරීම ප්‍රතික්ෂේප කළහ. රජය මොවුන්ට දිගින් දිගටම තර්ජනය කළා විනා ඔවුන්ගේ ඉල්ලීම් පිළිබඳව කිසිඳු සංවාදයකට එළඹුනේ නැත. මේ තත්ත්වය යටතේ ජූලි 07, 08 සහ 09 යන දිනවල වැඩවර්ජනය කරන බවට හෙදියන් තම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධිකාරීන්ට දැනුම් දී තිබුණි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජෙනරාල්වරයා නිකුත් කළ චක්‍ර ලේඛනයකට අනුව, සපත්තු දීමනාව රු. 200.00 දක්වා වැඩි කළ බවත් අතිකාල ගෙවීම් වැඩි කළ බවත් නිලඇඳුම් පිළිබඳව සාකච්ඡා කරන බවත් දන්වූ පසු හෙදියෝ තම වර්ජනය අත් හළහ. එදා අරගලයට පිවිසි අනුරාධපුර මහ රෝහලේ හෙදියක් කියා සිටියේ, *"හෙද සේවයේදී අපට සිදුවන අසාධාරණකම් වගකිව යුත්තන්ට කොතෙක් කීවත් ඔවුන් ඒවා සැලකිල්ලට නොගන්නේ අපි ඒවා විඳගෙන නිහඬව පැත්තකට වෙයි කියල හිතල ද දන්නෙ නැහැ. කොහොම වුනත් එදා, අද වගේම හෙටත් අපි පැගිලා පැරදිලා පැත්තකට වෙන්නේ නැහැ. හෙදියන් වන අප, අපගේ අයිතිවාසිකම් ඉල්ලා නිතරම සටන් කළා වගේම ඒ හැම සටනකින් ම ජය ලබාගත්තා"* යනුවෙනි.

එහෙත් 1985 ජූනි මස දක්වා ම සාකච්ඡාවට ගන්නවා යැයි පොරොන්දු වූ කරුණු පිළිබඳව ශික්ෂණ රෝහල් සහ වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ බලධාරීන්ගේ කිසිඳු ක්‍රියාත්මක වීමක් නොපෙනුණි. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය (GMOA) සහ රජයේ දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය (GDSA) මේ කාලය තුළ මීට සමාන ඉල්ලීම් ඉදිරිපත්කොට රජයෙන් යම් සහන දිනා ගෙන තිබුණි. තමාට ඉහල මට්ටමේ සිටින වෛද්‍ය නිලධාරීන්ගේ ක්‍රියාමාර්යන්හි සාර්ථකත්වය දුටු හෙදියෝ, තම ඉල්ලීම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා හෝඩුවාවක් හෝ රජයේ අදාල බලධාරීන්ගෙන් නොලැබුණෙන් තම වැටුප් ප්‍රතිසංවිධානය කරන තුරු රු. 750.00 ක තාවකාලික වැටුප් දීමනාවක් සඳහා වූ ඉල්ලීම පෙරදැරිකොට ගෙන 1986 මාර්තු 16 වන දින වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට බැසීමට තීරණය කළෝය. ඊට අනුව, මාර්තු 18 වන දින සිට ඔවුහු 'අසනීප නිවාඩු දැමීමේ' ව්‍යාපාරයක යෙදුනහ. මෙය, මීට පෙර වෛද්‍ය නිලධාරීන් විසින් උපයෝගී

කොටගත් සටන් උපායක් වූ අතර, එය සම්පූර්ණයෙන් ම නීත්‍යානුකූල එකක් ද විය. එහෙත් රජයේ ප්‍රතිචාරය නොසිතූ විරූ අයුරින් විය. සෞඛ්‍ය සේවාවන් අත්‍යාවශ්‍ය සේවා නියෝජනයට යටත් කරමින් රජය කිසිඳු කොන්දේසියකින් තොරව අසනීප නිවාඩු ගෙන සිටි හෙද-හෙදියන් නැවත සේවයට වාර්තා කළ යුතු බවත් එසේ නොකළහොත් ඔවුන් තම සේවය අතහැර ගියා සේ සලකන බවත් නිවේදනය කළේය. මෙයින් වෘත්තීය සමිතිය නොසැලෙන බව පෙනී ගිය විට, රජය හදිසි නීති රෙගුලාසි යටතේ මාර්තු 22 දා රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය තහනම් කළේය. මේ පියවරට එරෙහිව දිවයින පුරා ප්‍රජාතන්ත්‍ර-ගරුක සංවිධාන සහ ජන කොටස් තම විරෝධය පළ කළහ. වෘත්තීමය වශයෙන් සංවිධානයවීමට ඇති විශ්ව අයිතිය මෙසේ නිර්භයව උල්ලංඝණය කිරීමට විරුද්ධව වෘත්තීය සමිති සහ දේශපාලන පක්ෂ පමණක් නොව, ස්ත්‍රී හා විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංවිධාන, ආගමික සමිති, නීතිඥ සංගම් සහ සිවිල් අයිතිවාසිකම් සුරැකීමේ ව්‍යාපාර ද තම හඬ නැංවීය. වෘත්තීය සමිතිය තහනම් කිරීමත් සමඟම, සංගමයේ බැංකු ගිණුම් ක්‍රියා විරහිත කරනු ලැබුවා පමණක් නොව, නිල නිවාසවලින් දින තුනක් ඇතුලත පිට විය යුතු බව හෙදියන්ට දැනුම් දී තිබුණි. එසේ ම හෙද-හෙදියන් තමන්ට සහයෝගය දැක් වූ වෙනත් බහුජන සංවිධානවල ද උපකාරය ඇතිව සංවිධානය කළ පිකටින් ව්‍යාපාරවලට පොලිස් තර්ජන එල්ල විය. මේ සඳහා විශේෂ පුහුණුවක් ලත් විශේෂ කාර්ය බලකායේ (STF) 'කොමාන්ඩෝ' භටයින් යොදා ගැනීම අපගේ අවධානයට ලක්විය යුතු ය. කාසල් වීදියේ වනිතා රෝහලේ, රිජ්වේ ආර්යා ළමා රෝහලේ, මහනුවර රෝහලේ සහ වෙනත් මහ රෝහල්වල නේවාසිකාගාර වලින් හෙදියන් ඉවත් කිරීම සඳහා පියවර

වැඩවර්ජනය කළ හෙදියෝ - 'කාන්තා හඬ' සඟරාවෙනි.

ගන්නා ලදී. නිල ආරක්ෂක හමුදා විසින් ද මැරවර කණ්ඩායම් විසින් ද කරන ලද තර්ජන හා ගර්ජනවලට හෙදියෝ නිල නිවාසවල රැඳී සිටීමට තමන්ට ඇති අයිතිය කියාපාමින් එඩිතරව මුහුණ දුන්හ. මාසිකව නියමිත ආකාරයට කුලී ගෙවා තිබූ හෙයින්, කුලී පාලක පනත යටතේ වුව මෙසේ කුලී නිවැසියන් ඉවත් කළ නොහැකිව තිබිය දීත් ආණ්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධී මෙන් ම නීති-විරෝධී ලෙස ක්‍රියා කිරීමට මැලි වූයේ නැත. මෙසේ තමන් නිල නේවාසිකාගාරවලින් බලහත්කාරයෙන් පිටමං කිරීමට එරෙහිව මහනුවර ප්‍රාථමික උසාවියේ රජයට එරෙහිව නඩු පැවරූ හෙදියෝ ගණනාවක් ම තම නඩු ජයග්‍රහණය කිරීමට සමත් විය. එහෙත් තත්ත්වය වඩාත් අහිතකර අතට හැරෙද්දී, තහනම් කරන ලද සංවිධානයක් සමග කේවල් කිරීමට තමන්ට නොහැකි බව රජය කියා සිටියේ ය.

වර්ජනය ආරම්භකොට සතියක් ගෙවී යද්දී, පුවත්පත්වල වාර්තා වූ පරිදි, දිවයිනේ ප්‍රධාන රෝහල් 24න් 21කම කටයුතු සම්පූර්ණයෙන් ම අඩාල වී තිබුණි. රාජ්‍ය අංශයේ සේවය කරන මුළු හෙදියන් ගණන 7100 කි. එයින් 7000 පමණ ම මුල් සතියේ වැඩ වර්ජනයට සහභාගි විය. කාලයක් තිස්සේ බෙහෙත් හිඟකම, අවශ්‍ය පුහුණු සේවක පිරිස් මදිකම සහ වෙනත් අත්‍යවශ්‍ය පහසුකම් නොමැතිකම හේතුවෙන් බිඳ වැටෙමින් පැවතුනු රජයේ සෞඛ්‍ය සේවයට මේ වර්ජනය නිසා එල්ල වූයේ ප්‍රබල පහරකි. බොහෝ සූක්ෂම ප්‍රතිකාර අංශ වසා දමන්නට සිදුවිය. දිනපතා රජයේ රෝහල්වල සිදුවන 450 පමණ ශල්‍යකර්ම ප්‍රමාණය බෙහෙවින් අඩු කරන ලද අතර බාහිර රෝගී අංශය වෙත දිනකට පැමිණෙන රෝගීන්ගේ ගණන 60,000 ක් වුවද මෙම වර්ජන කාල සීමාව ඇතුලත එය විශාල ප්‍රමාණයක් දක්වා පහල ගියේය. ප්‍රාදේශීය රෝහල්වල බොහෝ වාට්ටු වසා දමන ලදී. රජය තම මාධ්‍ය පාවිච්චි කරමින් හෙද-හෙදියන් තම 'උදාර' සේවයට පිටුපාමින් මනුෂ්‍ය ඝාතනයෙහි යෙදෙන බවට චෝදනා කළ ද සාමාන්‍ය ජනතාව තුළින් හෙදියන් වෙත ප්‍රමාණවත් සහයෝගයක් ලැබෙන බව දැකගත හැකි විය. *"යම් හදිසි තත්ත්වයකදී කටයුතු කිරීම සඳහා අපි හෙදියන් කීප දෙනෙක් තෝරා ගත්තා. මිනිස් ජීවිතයක වටිනාකම සලකා හදිසි අවස්ථාවක් උදා වුවහොත් මිනිස්කමේ නාමයෙන් සේවයට යන්නට සූදානමින් අපි, දැනුම් දිය යුතු ලිපිනයක් සහ දුරකථන අංක වෛද්‍ය අධිකාරීන්ට දන්වලයි සටනට බැස්සේ"* යනුවෙන් හෙදියෝ ප්‍රකාශ කළහ. ප්‍රධාන නගරවල බොහෝ බහුජන සංවිධාන හෙදියන් සමග එක්වී වීදි බැස හෙද ප්‍රශ්නය පිළිබඳව පත්‍රිකා බෙදමින් ආධාර මුදල් එකතු කළහ.

වර්ජනය මෙසේ උණුසුම්ව පවතිද්දී, බහුතරයක් ස්ත්‍රීන් සිටින්නා වූ වෘත්තීය සමිතියක නායකත්වය, එම වෘත්තියෙහි නොයෙදෙන, බෞද්ධ භික්ෂුවක් දැරීම මුළු මහත් සංඝ පරපුරට ම තරම් නොවේ යැයි ද මෙවැනි නායකයෙකු සිටින වෘත්තීය සමිතියක් සමග තමන්ට සංවාදයකට එළඹිය නොහැකි යැයි ද ජනාධිපති ජයවර්ධන මහතා කියා සිටියේ ය. සංඝයා වහන්සේලා සහ ස්ත්‍රීන් අතර පැවතිය හැකි සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳව රාජ්‍ය පාර්ශවයෙන් කළ මෙම විවාදාත්මක ප්‍රකාශනයට පිළිතුරු වශයෙන් භික්ෂූන් වහන්සේලා ද වඩාත් විවෘතව හෙදි සටනට තම සහාය පළ කරන්නට පටන් ගත්හ. හෙදි ප්‍රශ්න පිළිබඳව බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ස්ථාවරය පැහැදිලි කරමින් පත්‍රිකා බෙදීමේ යෙදී සිටි භික්ෂුවක් ඇතුලු කීප දෙනෙක් බොරැල්ල පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලදී. ඔවුන්ට නඩු පවරා තිබුණේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වුවද, ස්ත්‍රීන්ගේ කාර්යභාරය සම්බන්ධයෙන් බෞද්ධ භික්ෂූන්ගේ මතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ත්‍රස්තවාදී කටයුත්තක් නොවන බව මහේස්ත්‍රාත්වරයා ද පිළිගත්තේ ය. හෙදි අරගලය මෙසේ නොවිසඳා තබා ගැනීමෙන් රජය වටිනා මිනිස් ජීවිත සමඟ ඛේදනීය ලෙස සෙල්ලම් කරන බවට ජනතා අවධානය යොමු කරනු වස් 1986 අප්‍රේල් 9 දා බෞද්ධ භික්ෂූන් පස් නමක් බෞද්ධාලෝක මාවතේ තුන්මුල්ල මංසන්ධියේ බුදු පිළිමය අසල මාරාන්තික උපවාසයක් ආරම්භ කළෝය. පසුදින උදයේ එම භික්ෂූන්වහන්සේලා 'අතුරුදහන් ' වූ බව ආරංචි විය. රාත්‍රියේ රථවලින් පැමිණි කණ්ඩායම් විසින් මොවුන් පැහැරගෙන ගොස් පහර දී, කොළඹ නගරයෙන් දුර බැහැර හැඳල, අවිස්සාවේල්ල වැනි පළාත්වල අතරමංකොට දමා තිබුණි. මේ පිළිබඳව වගකිව යුත්තන් මේ දක්වා සොයා ගෙන නැත.'

සතියෙන් සතිය සටන් දික් ගැස්සුනේ ය. හෙදියන්ගෙන් සමහර දෙනෙක් ආපසු සේවයට වාර්තා කළ නමුත් බහුතරයක් දිගටම වෘත්තීය සමිතිය සමග සිටිමින් වර්ජනය තීරණය අත් නොහළහ. රජයේ වෛද්‍ය නිලධාරීන් සහ රජයේ දන්ත වෛද්‍ය නිලධාරීන් ඇතුලු සෞඛ්‍ය අංශයට සම්බන්ධ වෘත්තීය සමිති 15 ක් හෙදියන්ට සහයෝගය දැක්වීම සඳහා එක්දින සංකේත වැඩ වර්ජනයක ද යෙදුනි. යාපනය අර්ධ-ද්වීපයේ රෝහල්වල පවා මාර්තු 28 දා එක් දිනක සහයෝගය දැක්වීමේ වර්ජනයක් සිදුකරන ලදී. එහෙත් රජය තම දැඩි තීරණයෙහි එල්බ සිටියෙන් හෙදියන්ට තම සටනේ නිරර්ථකභාවය තේරුම් යන්නට විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපෑ සාධක දෙකක් විය. එකක් නම් හෙද සේවය වැනි ක්ෂේත්‍රයක වැඩවර්ජනයක් හටගැනීම හේතුවෙන් විශාල වශයෙන් සමාජයීය හානියක් සිදුවන නමුත් ආර්ථික හානියක් සිදු නොවීමයි. අනෙක, රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා නිලධාරීන් වශයෙන් රජයන් සමග කේවල් කිරීමට සිදුවීමයි.

මෙම වෘත්තීය සමිතියේ සුවිශේෂ ස්වභාවය සහ එහි සාමාජිකත්වයේ පදනම දෙවෙනි සාධකයයි. රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය, කලින් කී පරිදි කිසිම දේශපාලන පක්ෂයකට හෝ වෙනත් වෘත්තීය සංගමයකට අනුබද්ධ වූවක් නොවේ. එසේම, කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධතාවයක් ඇති රාජ්‍ය සේවා වත්තීය සමිති සම්මේලනයට මෙම සංගමය ද අයත් වුවත් එහි ඍජු බලපෑමක් දැක ගන්නට නොහැකිය. මෙම නිසා වර්ජනය කිරීමට තීරණය ගැනීමේදී වැදගත් සාධකයක් වූ මෙම ස්වාධීනත්වය හේතුකොට ගෙන හෙද සංගමයට වෙනත් වෘත්තීය සමිතිවලින් සහ සංවිධිත කම්කරු පංති ව්‍යාපාරයෙන් ලැබුණු සහයෝගය ද කඩින් කඩ සහ අසංවිධානාත්මකව ලැබුණු එකක් විය. අනිත් අතට, හෙද සේවයට බැඳුණු පිරිස තුළ පැවති ආකල්පය ද මෙහිදී සෑහෙන බලපෑමක් කිරීමට සමත්විය. ඔවුහු බොහෝ දුරට මධ්‍යම පංතික වටිනාකමක්, පසුබිමක් සහ අභිප්‍රායන් ඇති පිරිසක් වූහ. තමන් කරන්නේ 'මානුෂීය' සේවයක් විනා හුදු රැකියාවක් පමණක් නොවේ ය යන අදහස ඔවුන් තුළට කාවද්දා තිබේ. වෙනත් වැඩකරන කොටස් සමග ඔවුන්ට ඇත්තේ සීමිත සම්බන්ධතාවයකි. තම සංගමයේ නොබැඳුණු ස්වරූපයට ඔවුන් වැඩිදෙනා දැඩි කැමැත්තක් දක්වන්නේ දේශපාලනය, කම්කරු සටන් ආදිය පිළිබඳව ඇති නොපැහැදීමත් සමග ය. තවද ස්ත්‍රීන්ට හිමි වන සම්ප්‍රදායික ද්විතීයික තත්ත්වයට අභියෝග කිරීමට හෝ අඩුම තරමින් පොදුවේ මෙරට

වෘත්තීය සමිති මර්ධනය කොට, කාර්යාල සීල් තබා, වැඩ කරන පන්තිය නිහඬ කොට තිබියදී රජයේ මර්ධනයටත් ඊ වාදයේ තර්ජනවලට නොබියව වැඩ කරන පන්තියට ආශ්වාදයක් ගෙනදෙමින් පුරා මසක් එතදිගට වැඩ වර්ජනයක යෙදූ වර්ජනය නිම කරමින් සිනහමුසු මුහුනින් යුතුව සේවයට වාර්තා කිරීමට අඛයාරාමයෙන් නික්මෙද්දී.

වැඩකරන ජනතාව හා බැඳුණු යම් ක්‍රියාදාමයක තමන් ද පුරුකක් විය හැකිය සහ විය යුතුය යන්න අවබෝධ කරගැනීමට හෝ හෙදියන් ගෙන් ඒ වන විට දැනුවත් වී සිටියේ අතලොස්සක් දෙනා පමණි. ඇත්ත වශයෙන්ම හෙදකම වනාහී, ගුරු වෘත්තීය සේම පවතින සමාජ ක්‍රමය යටතේ ස්ත්‍රිය පිළිබඳව ගතානුගතික ආකල්ප තහවුරු කරන්නා වූ වෘත්තීය ක්ෂේත්‍රයක් බව අප මතක තබා ගත යුතුය. බහුතරයක් ස්ත්‍රීන් සිටින්නා වූ සංගමයක, ඉහල නිල සඳහා පිරිමි සුළුතරය වැඩි ඡන්දයෙන් පත්වීම, හෙදියන් තුළ මේ සම්බන්ධයෙන් පවතින විඥානය ද පිළිබිඹු කරයි.

මේ තත්ත්වයන් යටතේ, වැඩවර්ජනය බොහෝ හෙදියන්ට නවතම, සහ බොහෝ අතින් අතිශයින් කටුක, අත්දැකීමක් විය. ඔවුන්ට පොලීසිය සමග සහ මැරවරයින් සමග ගැටීමට සිදුවිය. එසේම 'අපරාධකරුවන්' ලෙස ප්‍රසිද්ධියේ හංවඩු ගසනු ලැබූහ. වීදි බැස පත්‍රිකා බෙදීම හා ආධාර මුදල් එකතු කිරීම වැනි ක්‍රියාවන්ට ඔවුන් යොමු වූයේ දැඩි මැලි බවකිනි. වර්ධනය වූ සාමූහික අනන්‍යතාවයක් හෝ සටන් පළපුරුද්දක් නැති හෙදියන්ට දින 30 ක වර්ජනයක් මෙසේ පවත්වාගෙන යාමට හැකිවීම සැබැවින් ම ප්‍රශංසනීය වන්නේ මේ සෑම කරුණක් ම ගණනයට ගත් විට ය. එසේම, මර්දනය හමුවේ ඔවුන් ප්‍රදර්ශනය කළ සටන්කාමීත්වය සහ එඩිතරකම සම්ප්‍රදායික හෙදි ප්‍රතිරූපය යම් දුරකට හෝ වෙනස් කළ බව ද අපට කල්පනා කළ හැකිය.

සිංහල සහ හින්දු අලුත් අවුරුදු සමයේ ද හෙදියෝ වර්ජනයෙන් ම ගත කළහ. අවුරුද්දට ලැබෙන විශේෂ දීමනාව ද කැපකොට අලුත් අවුරුද්ද අවිනිශ්චිතව ආරම්භ කළ ඔවුහු ඒ සමඟම වැඩි වැඩියෙන් ධෛර්යමත් වූහ. එහෙත් රජයේ තර්ජනවලට හෝ තමන් 'මිනීමරුවෝ' ය යන චෝදනාවට හෝ නොබියව 6,000 පමණ දෙනා දිගටම වර්ජනයේ යෙදුනහ. රට පුරා රෝහල්වල තත්ත්වය දිනෙන් දින අසතුටුදායක විය. අදාල අමාත්‍යංශ දෙක සමගම (සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ශික්ෂණ රෝහල් හා වනිතා කටයුතු අමාත්‍යාංශය) සංගමයේ බැඳීම් ඉතා අහිතකර වූ හෙයින්, අවසානයේදී ජාතික ආරක්ෂක ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා මෙයට මැදිහත් වූවේය. හෙදියන්ගේ ඉල්ලීම් පිළිබඳ සලකා බලන බවට වූ පොරොන්දුවක් මත 1986 අප්‍රේල් 18 දා කිසිඳු ඉල්ලීමක් ඍජුවම දිනා නොගෙන හෙදියෝ නැවත සේවයට වාර්තා කළහ. මෙහිදී පවතින ජනවාර්ගික අර්බුදය මේ ප්‍රශ්නය කෙරෙහි බලපෑ ආකාරය අපි අවතක්සේකරු කළ යුතු නැත. 'ත්‍රස්තවාදී' වෙඩි පහරට ලක්වන අපේ සිංහල හමුදාභටයින්ගේ දිවි ගලවා ගැනීම සඳහා නැවත හෙදියන් වැඩට වාර්තා කළ යුතු යැයි තර්ක ඉදිරිපත් කිරීම ද මෙම වර්ජනය පැවති සමයේ දැක ගත හැකි වූ ප්‍රබල ප්‍රවණතාවයක් විය.

1986 සැප්තැම්බර් මාසය වන විටත් හෙදියන්ගේ ඉල්ලීම් පිළිබඳව රජය කිසිඳු ස්ථිර ක්‍රියාමාර්ගයක් ගෙන නැත. සාමාජිකත්වය තමන් ලත් පරාජය හමුවේ කියා සිටින්නේ මානුෂික හේතූන් මත නැවත සේවයට වාර්තා කිරීමට තීරණය කළ බවයි. එහෙත් හෙද සංගමය දින 30 ක් වැඩ වර්ජනයකොට, රජයේ සෞඛ්‍ය සේවාවන් සම්පූර්ණයෙන් ම අඩාල කරමින් සිටියදී පවා රජය සෙලවීමට අසමත් වූවා නම්, එය රාජ්‍ය අංශයේ සේවකයින් පමණක් නොව, සමස්ත කම්කරු පංතියට ම පාඩමකි. එසේ ම, මුල් වතාවට මේ තරම් දීර්ඝ සහ සටන්කාමී වැඩවර්ජනයක යෙදෙමින් වෙනත් සංවිධාන සමග සහයෝගය ගොඩනඟා ගනිමින්, හෙද සංගමය ලද අත්දැකීම ද ඉතා අගනේ ය. සියලුම බාධක මධ්‍යයේ තම එක්සත් බව රැක ගනිමින් ලද ඒ ශක්තිය තව දුරටත් වඩාත් සාර්ථක අන්දමින් රටේ වෙනත් පොදු ජන අරගල සහ ව්‍යාපාර සමග බද්ධ වී කෙරෙන ක්‍රියාවලියකට හවුල් කරලීමේ අභියෝගය අද හෙදියන් ඉදිරියේ ය.

පසුවදන

සුනිලා අබේසේකර - 1988

පසුගිය දශක දෙක තුළ, ලංකා ඉතිහාසයේ මෑත යුගයේ නොවූ තරමට ස්ත්‍රීහු ශ්‍රම බලකායට එක් වී සිටිති. නානා මාදිලියේ සමාජ ප්‍රතිසංස්කරණ, අධ්‍යාපනික දොරටු විවර වීම පොදුවේ ලාංකික ජනතාවගේ උගත්භාවය සහ සෞඛ්‍ය සම්පන්නභාවය දියුණු වීම, සංස්කෘතික ක්ෂේත්‍රයේ යල් පැන ගිය සම්ප්‍රදායික තහංචි ආදිය ප්‍රතික්ෂේප කිරීම ආදී සාධක රැසක් හේතුවෙන් 1950, 1960 ගණන්වල ඉදිරියට ආ ස්ත්‍රීහු, 1970, 1980 වන විට පිරිහෙන ආර්ථික තත්ත්වයන් හමුවේ නොවැළැක්විය හැකි අයුරින් සහ අයහපත් කොන්දේසිවලට යටත්ව, ශ්‍රම වෙළඳපොළ වෙත තල්ලු වූහ. විරැකියාව සහ ස්ත්‍රියගේ ජීව-විද්‍යාත්මක ප්‍රජනන කාර්යභාරයට ප්‍රමුඛත්වය දෙන සමාජමය තත්ත්වයන් හේතුවෙන් ඇයට අවාසි සහගත වූ දැඩි තරඟකාරිත්වයකට මුහුණ දීමට සිදුවිය. එසේම, බොහෝ විට නුපුහුණු සහ සම්ප්‍රදායික ස්ත්‍රී ප්‍රතිරූපයට අනුරූප වූ ක්ෂේත්‍රවලට ඇය සීමා කරනු ලැබීය.

1980 ගණන්වල සිට රටට විදේශ විනිමය උපයා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර හතරෙහි ම, තේ වතුකරය, නිදහස් වෙළඳ කලාපය, සංචාරක ව්‍යාපාරය සහ මැද පෙරදිග රැකියාවන් හි බහුතරයක් සේවක පිරිස ස්ත්‍රීන් වන බව පිළිගත් සත්‍යයකි. එහෙත් සම්ප්‍රදායික වෘත්තීය සමිති ව්‍යාපාරය මෙම ස්ත්‍රීන් සංවිධිත කම්කරු පංතියේ සජීවී කොටසක් බවට පත් කිරීමට අපොහොසත් වී ඇත. එක් එක් ක්ෂේත්‍රයේ සුවිශේෂතා පිළිබඳව මීට ඉහත දී සාකච්ඡා කළ ද ඒ කරුණු දෙස නැවතත් සංක්ෂිප්තව බැලීම වටිනා යැයි සිතේ.

වතුකරයේ කම්කරුවෝ, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය ම වැඩි දෙනා ලංකා කම්කරු සංගමයේ සාමාජිකයෝ වෙති. එහෙත් බොහෝ ස්ත්‍රී කම්කරුවන්ගේ සාමාජිකත්වය නමට පමණක් සීමා වෙයි. මාතෘ සංගම් හරහා ඔවුන් මව් සංගමයට ගන්නා තීරණ ක්‍රියාත්මක කළ ද ඇත්ත වශයෙන් ම ස්ත්‍රීන් වශයෙන් තමන්ට සුවිශේෂ වූ පීඩනයන් පිළිබඳව දැනුවත්ව කටයුතු කරන්නේ දැයි යන්න සැක සහිතය. ඔවුන්ගේ වෘත්තීය සමිතිය ද ඔවුන් සලකන්නේ කම්කරුවන්

ලෙසින් මිස ස්ත්‍රීන් ලෙසින් නොවේ. මේ නිසා ම, ස්ත්‍රීන් වඩාත් කාර්යක්ෂම කම්කරුවන් බවට පත් කිරීම අරමුණු කොටගත් විවිධ ව්‍යාපෘතීන්ට සංගමය ද හවුල් වේ. ළමාගාර පිහිටුවීම මීට හොඳ උදාහරණයකි.

ඇත්ත වශයෙන් ම වැඩකරන මව්වරුන්ට රජය විසින් ළමාගාර සැපයීම ස්ත්‍රී ව්‍යාපාරයේ මූලික ඉල්ලීමක් විය යුතුය. එහෙත් එවැනි ළමාගාර පිහිටුවීමේ එකම අරමුණ මවට වැඩට යාම සඳහා නිදහස ලබා දීම විය යුතු නැත. ඒවා ළමුන්ට ද වඩා පරිපූර්ණ පෙර පාසැල් අත්දැකීම් ගෙන දෙන, ඔවුන්ගේ මනස පුබුදුවාලන පරිසරයකින් යුත් ස්ථානයන් නොවේ නම්, එවැනි ළමාගාර ධනපති සූරාකෑමට කිරිසප්පයන් පවා බිලිදෙන උපක්‍රමයක් පමණක් බවට පරිවර්තනය විය හැක. මෙවැනි ගැටළු පිළිබඳව ලංකා කම්කරු සංගමය හෝ ඊට අනුබද්ධ මාතා සංගම් හෝ ස්ත්‍රීන් වෙනුවෙන්, ස්ත්‍රී පාර්ශවයෙන් තම අවධානය යොමු කරන බවත් පෙනෙන්නට නැත.

එහෙත් ඉතා අවාසනාවන්ත ලෙස වතුකරයේ ස්ත්‍රීන්ට තම ස්ත්‍රී බව යළි ඒත්තු ගැන්වෙන්නේ ජනවාර්ගික ගැටුම් සමයන් හිදී ය. විශේෂයෙන් 1978 දී සහ ඉන් පසුව, රට තුළ ඇති වූ දෙමළ විරෝධී කලකෝලාහල අවස්ථාවලදී වතුකරයේ ස්ත්‍රීහු වෙනකාටත් වඩා බැට කෑහ. ඔවුන්ට උන්හිටි තැන් අහිමි වී ගියා පමණක් නොව, සැමියන් සහ ළමයින් නැතිවී ගියා පමණක් නොව, මැරවරයින් විසින් ඉතා අමානුෂික වධ හිංසාවන්ට හා දූෂණයන්ට ද ඔවුන් ගොදුරු කරන ලදී. මේ ප්‍රශ්න සම්බන්ධයෙන් ද වෘත්තීය සමිති මට්ටමින් හෝ කුමන මට්ටමකින් හෝ සංවිධානාත්මකව ක්‍රියාත්මක වීමට ඇති නැඹුරුවක් අපට පෙනී නැත.

ස්ත්‍රීන් බොහෝ දෙනෙක් සේවය කරන අනිකුත් ක්ෂේත්‍ර තුන තුළ සංවිධාන බිහි වී නැති තරම්ය. නිදහස් වෙළඳ කලාපයේ 1985 වසර අග වන විට සේවකයින් 37,000 ක් අතරින්, 31,000 ක්ම ස්ත්‍රීන් විය. ඔවුහු වැඩි දෙනා මසකට රුපියල් 700 ට ආසන්න වූ මූලික වැටුපකට ඇඟළුම් කම්හල්වල සේවය කළ අතර ස්ත්‍රියක් වීම නිසාම තමන් නියැලෙන කාර්යයට අනුව ශ්‍රේණිගත කිරීමේදී ද යම් අසාධාරණයකට මුහුණ දුන්හ. එනම් අඩු වැටුප් ලබන ඇඳුම් මැසීමේ, නිම කිරීමේ හා ඇසිරීමේ අංශවල වැඩ සඳහා ස්ත්‍රීන් වැඩි වශයෙන් යොදා ගන්නා අතර පිරිමි සුළු පිරිස වැඩි වැටුප් ලබන, 'පුහුණු' යැයි සැලකෙන කැපුම් අංශයේ සේවයට යොදා ගනු ලබයි. නිදහස් වෙළඳ කලාපයේ සහ අලුතින් විදේශීය ආයෝජන උපදේශක කමිටුවේ අනුමැතිය ඇතිව පිහිටුවන ලද කර්මාන්ත ශාලාවල සේවක පිරිස සමස්තයක් වශයෙන් ගත් කල යම් සුවිශේෂ ලක්ෂණවලින් යුක්ත බව මීට කලින් ද සඳහන් කළෙමි. ඔවුහු වැඩි දෙනා තරුණ යඃ අවිවාහක යඃ (විවාහක අයට රැකියා දීමට මැලිබවක් දක්වයි.)

මෙම පිරිසෙන් පිට ප්‍රදේශවලින් අවුත් නවාතැන් ගෙන සේවයට යන්නෝ බොහෝ වෙති. මේ අයට තිබෙන ප්‍රශ්න සහ ගැටළු පිළිබඳව සමීක්ෂණ රැසක් සිදුකොට ඇතත් මේ තරම් විශාල කම්කරු පිරිසක් සංවිධානය කිරීමට යම් පියවරයන් නොගැනීමට, රජය විසින් පනවා තිබෙන තහංචි සහ බාධක පමණක් ම හේතු විය නොහැකිය. මෙම තරුණ කම්කරු ස්ත්‍රීන් මෙරට කම්කරු පංති ව්‍යාපාරයට ඇදගැනීම සඳහා අරගල කළ යුතු බව පවා සංවිධිත වෘත්තීය සමිති ව්‍යාපාරයට එතරම් ම ප්‍රමුඛතාවයක් ඇති ගැටළුවක් නොවන්නේ ය. මෙයට බලපාන සාධක කීපයකි. මෙම ස්ත්‍රීන් විද්‍යාමාන කරන පංති ස්වභාවය සහ ඔවුන් එක දිගටම තම ජීවිත කාලය පුරා රැකියාවක නිරතව සිටින්නේ ද යන්න පිළිබඳව පැනනැගුන අවිශ්වාසය මෙම අඩු අවධානයට පදනම් වන්නට ඇත. එසේම, මෙම ස්ත්‍රීන් සංවිධානගත කිරීම සඳහා මෙතෙක් භාවිතා කළ සුපුරුදු උපක්‍රම ප්‍රයෝජනවත් නොවන බවත් නව උපක්‍රමයන් මේ සුවිශේෂ පිරිස සඳහා ම ගොඩනැගිය යුතු බවත් පැහැදිලි වන්නට ඇත. එහෙත් මේ අභියෝගය සාර්ථකව බාර ගැනීමට කිසිවකුත් ඉදිරිපත් වූයේ නැත.

මෙරට ආර්ථිකය කෙරෙහි ඍජුවත්, වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි වක්‍රවත්, බලපාන නිදහස් වෙළඳ කලාපය වැනි ස්ථානයක් සම්බන්ධයෙන් මීට වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබුණු බව දැන් මැනවින් ඔප්පු වී හමාර ය. දැන් දැන් නීති උපදෙස් දීමේ වැඩසටහන්, සෞඛ්‍ය සහ සුභ සාධන ව්‍යාපෘති ආදිය ඔස්සේ මෙම කම්කරු ස්ත්‍රීන් සමග සම්බන්ධතාවයක් ගොඩනඟා ගැනීමටත් ඒ මගින් ඔවුන්ට තම ප්‍රශ්න පිළිබඳව දැනුවත්භාවයක් ලබාදීමටත් උත්සාහ දරණ ස්ත්‍රී සංවිධාන ඇතුළු ස්වායත්ත සංවිධාන කීපයක් දැක ගත හැකිය.

1983 ජූලි මාසයේ ජනවාර්ගික ගැටුම් උත්සන්න වූ තැන්පටන් ලංකාවේ සංචාරක ව්‍යාපාරය බිඳ වැටුන ද එහි සේවා සපයන්නියන් ලෙස (ලිංගික ඇතුළු වෙනත් විවිධ තරාතිමේ සේවාවන්) සේවය කළ ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳව මේ දක්වා යොමු වී ඇත්තේ අඩු අවධානයකි. සේවා තත්ත්වය පිළිබඳව ද ඇත්තේ අඩු අවධානයකි. සේවා තත්ත්වයන් අතින් බැලූ කල මේ ස්ත්‍රී බොහෝ දෙනා ඉතා අඩු වැඩුපකට වැඩි පැය ගණනක් සේවය කරන බව පෙනෙයි. ස්ත්‍රීභාවය සහ රූපය උපයෝගී කරගනිමින්, පිළිගැනීමේ නිලධාරිනියන් වැනි රැකියාවන් හි සිට සම්ප්‍රදායික ස්ත්‍රී ප්‍රතිරූපයට ගැලපෙන සේ අවන්හල් සේවිකාවන්, කාමර ශුද්ධ පවිත්‍රකරන්නියන් වශයෙන් ද පමණක් නොව බොහෝ විට ලිංගික වෘත්තිකයින් වශයෙන් ද සංචාරක ව්‍යාපාරයේ නියුතු ස්ත්‍රීන් සේවය කරන බව අපි දනිමු. ඔවුන්ගේ සේවය අස්ථිර ය. 'නුපුහුණු' ශ්‍රේණිවලට අයත් වන මේ ස්ත්‍රීන්ට කොතැනකින්වත් පිළිසරණක් නැත.

එසේම ඔවුන් පිළිබඳව ප්‍රගතිශීලී කොටස් අතර පවා පවතින දුර්මත හා අනවබෝධය කණගාටුදායක ය. එක පැත්තකින් නැඟෙන්නේ 'මොවුන් අපේ සංස්කෘතියට සම්ප්‍රදායට ගරහනවා. ඒ නිසා සංචාරකයින් ඒම නවත්වන්න.' යනාදී සදාචාරවාදී හඬයි. ඊට ප්‍රතිපක්ෂව වාමාංශික කොටස් මොවුන්ට 'නන්නත්තාර' ලේබලය ගසයි.

මැද පෙරදිග යන ස්ත්‍රීන් පිළිබඳව ද කිව යුතුව ඇත්තේ මෙයයි. ඉතා දුෂ්කර තත්ත්වයන් යටතේ සේවය කරන මේ ස්ත්‍රීන්ගේ නූගත් බව සහ නොදැනුවත්කම නිසා මෙන්ම තම සේවා ක්ෂේත්‍රයේ සුවිශේෂතාවය නිසා එනම්, එක් එක් නිවාසය තුළ තනිවී සිටීම ආදිය නිසා, සේවා අයිතීන් සඳහා සටන් කිරීමට ඔවුන් ගොනුවීම වළක්වා ඇති අතර මේ රට තුළ පවා ඔවුන්ට දැක්වෙන ප්‍රතිචාරය බොහෝ විට කණගාටුදායක ය.

මීට අමතරව, කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ සහ ඊනියා 'අවිධිමත්' ක්ෂේත්‍රය තුළ - ගඩොල් කපමින්, රේන්ද ගොතමින්, බීඩි ඔතමින්, කොහු, ඉදල් තනමින්, පලා විකුනමින්', ගෘහ කර්මාන්තවල යෙදෙන දහසකුත් ස්ත්‍රීන් සිටී. ඔවුන්ට ද තම සේවා අයිතීන් පිළිබඳව දැනුවත්භාවයක් නැති අතර කම්කරුවන් වශයෙන් මෙන්ම ස්ත්‍රීන් වශයෙන් ද උග්‍ර පීඩනයට හා සූරා කෑමට ඔවුහු නිරන්තරයෙන් ගොදුරු වෙති.

මූලික වශයෙන් මේ තත්ත්වයන් මගින් පැහැදිලි වන්නේ ස්ත්‍රී පීඩනය සහ සූරාකෑම පිළිබඳව පවතින විවිධ තලයන් සම්බන්ධයෙන් පොදුවේ සම්ප්‍රදායික වාමාංශික ව්‍යාපාරයේත් විශේෂයෙන් වෘත්තීය සමිති ව්‍යාපාරයේත් නොදැනුවත්භාවය යි: න්‍යායික ව්‍යාකූලත්වයයි: පුරුෂාධිපත්‍ය යන සංකල්පය සම්බන්ධයෙන් එය ධනවාදී සූරාකෑම සමග බද්ධ වන ආකාරය, ගෘහස්ථ ශ්‍රමය, ලිංගිකත්වය හා ලිංගික සූරාකෑම, ප්‍රජනනය සහ ප්‍රතිනිෂ්පාදනය යනාදිය සම්බන්ධයෙන් හෝ රජය විසින් ගෙනයන ඊනියා පවුල් සංවිධාන කටයුතු පිළිබඳව ප්‍රගතිශීලී පිල තුළ විවාදයක් හෝ සංවාදයක් ඇති නොවීය. මේ හේතුව නිසා මෙම සංවිධානවලට ස්ත්‍රීන්ට සමීප වීමට හෝ ස්ත්‍රීන්ගේ ක්‍රියාකාරී පූර්ණ සහභාගිත්වය තම කටයුතුවලට ලබාගැනීමට හෝ නොහැකි විය. වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ සහ වාමාංශික පක්ෂවල කොපමණ ස්ත්‍රී සාමාජිකත්වයක් තිබුණ ද තීරණ ගැනීමේ තනතුරුවලට ස්ත්‍රීන් කොපමණ ප්‍රමාණයක් පත්වී ඇති ද ස්ත්‍රී අයිතීන් වෙනුවෙන් කොතරම් ඉල්ලීම් ප්‍රමාණයක් පසුගිය කාලය තුළ ඉදිරිපත් කළේ ද යනාදී ප්‍රශ්නවලට ප්‍රතිචාර වශයෙන් ලැබෙන නිහඬියාව මේ පිළිබඳව පැහැදිලි කිරීමට ප්‍රමාණවත් ය.

එහෙත් අද අප සිටින්නේ මේ සම්බන්ධයෙන් තව දුරටත් නොසැලකිලිමත් වීම අනතුරුදායක අවධියකය. චිලී රට තුළ අය්යන්දේගේ සමාජවාදී රජය පෙරලා දමන්නට ප්‍රතිගාමීන් මෙහෙය වූ ප්‍රධානතම බලවේගයකි එරට ස්ත්‍රීන්. උග්‍රවන ආර්ථික හා සමාජයීය අර්බුදය හමුවේ තම පවුලේ සාමාජිකයින්ගේ කුස පිරවීම තම මූලික කර්තව්‍ය ලෙස දකින ස්ත්‍රීහු සිය නොදැනුවත් බව නිසාම ප්‍රතිගාමීත්වයට සේවය කළ හැකිය. මේ අවදානම නිවැරදිව අවබෝධ කොටගෙන, ස්වායත්ත හා බහුජන සංවිධාන පසුගිය අවුරුදු පහක පමණ කාලයක් ඇතුලත ස්ත්‍රීන් සංවිධානය කිරීමෙහි සහ සටන් මාවත ඔස්සේ ඔවුන් සමාජවාදී සමාජ විපර්යාසයක් කරා මෙහෙයවමින් කළ කාර්යභාරය අගය කරමින් එහි ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කිරීමේ අභියෝගය අද ලක්වැසි සියලුම ප්‍රගතිශීලීන් හමුවේ ය.

සියවස් ගණන්

සියවස් ගණන් කඳුළු සුසුම්
අඳුරු සිත දොවා පැහැපත් කළා
රැයේ සීතලේ පැමිණි සිහිනයේ
වහලියක් වූ ඈ නිදහස් වෙලා

ගෘහිණියකි ඈ, බිරිඳක් ද වේ
මවකි, යෙහෙළියකි වෙහෙසෙන්නෙ ඈ
දිවා රෑ ගෙවා ලොව වෙනුවෙනා
එහෙත් ජීවිතේ ඇය සතු නොවේ
එකමුතු වී නොබියව දණ නොනමා
සොයුර සොයුරියෝ සවිය යොදා
ගත සිත බඳිනා යදම් කඩා
සතුට සොයා යනවා

නව හිරු පායන නවෝදයේ
ලොවක් නැඟේ එහි යදම් නැතේ
අප දුටු සිහිනය දෙගොඩ තලා
ගමනට සවි දෙනවා

මෙම ගීතය, නෙදර්ලන්ත ජාතික කොර්නේලි ක්විස්ට් සහ මාර්ගා හොයිජ්ටින්ක් සහෝදරියන් විසින් ශ්‍රී ලංකාවේ, කුරුණෑගල සහ මොනරාගල දිස්ත්‍රික්ක දෙක පදනම් කරගෙන ගැමි ස්ත්‍රීන්ගේ ජීවිතය පිළිබඳ 1987 දී නිර්මාණය කළ වාර්තා චිත්‍රපටියක් වූ **'ලෝක දෙකයි එක ජීවිතයයි'** වෙනුවෙන් සුනිලා අබේසේකර විසින් පද රචනය කර ගායනා කරන ලද්දකි.

ඡායාරූපඃ වින්සන්ට් කුරුඹාපිටිය

මෙම පොතේ විෂයපථයට ඇතුළත් වන්නේ කුඩා පරිමාණ කෘෂිකර්මයේ, කාර්මික සහ සේවා අංශවල වැඩකරන ස්ත්‍රීන්ගේ ආර්ථික අරගල සහ දේශපාලන ගමන් මඟ ඔවුන්ගේ අරගලවලදී ස්ත්‍රී සංවිධාන ඉටු කළ කාර්යභාරය, ශ්‍රමය, ප්‍රාග්ධනය, සමාජ පන්ති, නවීකරණය සහ පීතෘ මූලිකත්වය යන මේවා අතර ඇති නිරන්තර ගැටුම් පිළිබඳ තේමාවන් ය.
ඒවා වනාහී තම ජීවිතයේ ගමන් මඟ ලෙස සුනිලා තෝරාගත් දිශානතිය ද වෙයි.
අප ද නිරතුරුව පාඩම් ඉගෙන ගන්නා මූලාශ්‍රය ද එයයි.

Women and Media Collective
Established 1984

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
56/1, සරසවි පටුමග, කාසල් වීදිය, ශ්‍රී ලංකා.
දුරකථන : +94-5632045/5635900/2690192
ෆැක්ස් : +94-2690192/2690201
ඊමේල් : wmcsrilanka@gmail.com
වෙබ්අඩවිය: womenandmedia.org

ISBN 978-955-1770-26-6
රු. 100